# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

ශ්‍රී බුද්ධ වර්ෂ 2560 වෙසක් මස 21 වන ශනි දින

2016 මැයි මස 21 වැනි සෙනසුරාදා



■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි

■ විකිණීම සඳහා නොවේ



# මාර්ගඵලලාභීන් ගැන සෙවීමට ඔබත් උනන්දු වෙනවාද?

අපේ රටේ දැවෙන ප්‍රශ්න විශාල වශයෙන් පවතින මේ කාලයේ ඒ සියල්ල පසෙකට දමා මාර්ගඵලලාභීන් යැයි කියා ගන්නා අය පසුපස යන පිරිස් දුලභ නොවේ. මාර්ගඵලලාභීන් ගැන ඉතිහාසයේ අන් කවරදාකවත් නොතිබූ උනන්දුවක් මේ කාලයේ දැකිය හැකිය. බුදුරජාණන් වහන්සේ පහළ වන අවධියේදීත් "කුසලග වේෂී" සහ "සත්‍යගවේෂී" පිරිස් සිටියහ. නමුත් එහි වෙනසක් තිබිණි. ඔවුන් ගවේෂණය කළේ කුසල ගවේෂණය කළ සත්‍ය ගවේෂණය කළ වෙනත් පුද්ගලයන්ව නොවේ. තමන්ට රහත් භාවයට පත්විය හැක්කේ කෙසේද යන්න ගැනය.

බුදු කෙනෙක් ලොව පහළ වන්නේ විමුක්ති මාර්ගය පෙන්වා දීම සඳහාය. එම මාර්ගයේ ගමන් කිරීමට අපේක්ෂා කරන අය සෙවිය යුත්තේ ඒ දහම් මගය.

මෙකල බොහෝ දෙනා දහම සෙවීම වෙනුවට එමගින් ප්‍රතිලාභ ලබාගත් පිරිස පිළිබඳව සොයන්නට වෙහෙස වන බව පෙනේ. තවත් ආකාරයකින් පවසන්නේ නම් රහතන් වහන්සේලා හෝ මාර්ගඵලලාභීන් ගැන විමසන්නට පටන් ගැනීමය. අනුන්ගේ රහත් බව ගැන සෙවීමෙන් ඇති ඵලය කුමක්ද? එමගින් තමාට ලැබෙන වාසිය කුමක්ද? තමන්ට යහපතක් සැලසෙන්නේ තමන් මාර්ග ඵලයක් ලබාගැනීම තුළින් පමණි. නමුත් අද සිටින්නේ වැඩිපුරම අනුන්ගේ රහත් බව සොයන පිරිසක් නිසා ඔවුන්ගේ කුතුහලය සංසිඳුවාලන්නට සහ ඔවුන්ගේ දුර්වල මානසිකත්වය තුළින් පෞද්ගලික වාසි ලබාගැනීමට තමන් මාර්ගඵලලාභීන් යැයි කියාගන්නා පිරිස් බොහෝ සෙයින් ඉස්මතු වී හිඳිති.

තමන් බුදුවී ඇතැයි. රහත් ඵලය ලබා ඇතැයි, අනාගාමී, සකෘදාගාමී හෝ සෝවාන් වී ඇතැයි කියමින් සමාජය හමුවේ පෙනී සිටින මාර්ගඵලලාභීන් ගැන විවිධ මාධ්‍ය තුළින් අසන්නට ලැබේ.

එසේම, මාර්ගඵලලාභීත්වය පිළිබඳව සහතික නිකුත් කරන්නෝද සිටිති. නමුත් සැබෑ මාර්ගඵලලාභියෙක් තමන්ගේ මාර්ගඵල ප්‍රතිලාභය ප්‍රකාශ කරන ධර්මානුකූල ක්‍රමයක් තිබේ.

අනුන්ගේ මාර්ගඵල ගැන සොයන බොහෝ දෙනකුට මාර්ගඵල යන වචනයේ අරුත පිළිබඳවවත් අවබෝධයක් නැති බව පෙනේ. **මාර්ගඵල සතරක් තිබේ.** ඒ සෝවාන්, සකෘදාගාමී, අනාගාමී සහ අර්හත්ය. මේවා චතුරාර්ය සත්‍යය අවබෝධ කරගැනීමේදී ලැබෙන ස්ථාවරයන් හතරක් ලෙස දැක්විය හැකිය.

අවාසනාවන්ත කරුණ වන්නේ මෙකල බොහෝ දෙනා මාර්ගඵල ලාභියකුගේ සුදුසුකම් ලෙස හඳුනාගෙන තිබෙන්නේ විශේෂ හැකියාවන්ගෙන් යුක්ත, එනම් අභිඥාලාභියකුගේ ලක්ෂණ කිහිපයකි. අභිඥාලාභියකු වීමට රහත් විය යුතු නැත. එසේම රහත් වීමට අභිඥාලාභියකු වීමද අවශ්‍ය නොවේ. චිත්ත සමාධිය උපදවා ගැනීම තුළින් අභිඥාවන් දියුණු කර ගැනීමට පුළුවන.

ඔබේ අවබෝධය පිණිස පංච අභිඥාවන් මෙසේ දක්වමු.

1. තමන්ගේ පූර්ව ආත්ම භාවයන් නුවණින් දකින්නට ඇති හැකියාව.

2. මරණින් මතු නැවත උපත ලබන තැන පවසන්නට ඇති හැකියාව.

3. ලොව කොතැනක හෝ සිදුවන දෙයක් නුවණින් දකින්නට ඇති හැකියාව.

4. ලොව කොතැනක හෝ සිදුවන කතාබහක් නුවණින් අසන්නට ඇති හැකියාව.

5. අහසින් ගමන් කිරීමටත්, දියේ ගිලෙන අන්දමින් පොළොව තුළ ගිලෙන්නටත්, පොළොවේ ඇවිදින අන්දමින් දියෙහි ඇවිදින්නටත් ඇති හැකියාව සහ තමන්ගේ රූපයට සමාන රූප දහස් ගණනක් මවා පෑමේ හැකියාව.

මේ සඳහන් කරන ලද පංච අභිඥාවන්ගෙන් යුක්ත පුද්ගලයා රහතන් වහන්සේ නමක ලෙස පිළිගන්නට තරම් බොහෝ දෙනා පෙළඹී ඇත්තේ සැබැවින්ම ඔවුන්ගේ ධර්ම ඥානයේ අඩුපාඩුවක් නිසාය. බුදුරජාණන් වහන්සේගේ සමයේ මේ කියන හැකියාවන් ඇති රහත් නොවූ භික්ෂූන් වහන්සේලා සිටියහ. එකල භික්ෂූන් වහන්සේලා තමන් වහන්සේ රහත් ඵලයට පත්වූ පසු ඒ බව බුදුරදුන් වෙත පැවැසූ ආකාර කිහිපයක් පිළිබඳව පොත පතෙහි විස්තර වේ.

30 පිටුවට ▶




"මේ ලෝකයේ කවරදුවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."



# පිරිනිවන් මංචකයේ සිටියදී බුදු හිමියන් සක් දෙවියන්ගෙන් ඉල්ලා සිටි දේ

අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව්තුරා බුද්ධත්වයට පත්වීමෙන් අටවැනි වස වෙසක් මස පුර පසළොස්වක් පෝ දින පන්සීයක් මහරහතන් වහන්සේලා සමග ශ්‍රී ලංකා දිවයිනේ කැලණිය ආදී තුදුස් ස්ථානයකට වැඩ සමාපත්ති සුවයෙන් වැඩ සිට සකලා ලංකා ධරණී තලයම පූජා භූමියක් බවට පත් කළ සේක.

උත්තර භාරතයේ ලාලරට සිංහ පුරයෙන් විජය කුමරුන් ප්‍රධාන පිරිස ලංකා භූමියට සැපත් වූයේද බුදුරදුන් පිරිනිවන් පෑ වෙසඟ පුර පසළොස්වක් පෝ දිනයේ බව මහාවංශයේ දක්වේ.



මල්ල රජදරුවන්ගේ උපවත්තන සල් උයනේදී පිරිනිවන් මංචකයේ වැඩ සිටින බුදුරජාණන් වහන්සේ සමීපයට පැමිණි සක්දෙව් රජු අමතා ලක්දිව බුදු සසුන තිරසරව පවතින බවත් එහි සැපත් වන විජය කුමරුන් ඇතුළු පිරිසට මෙන්ම ලක්දිවටද ආරක්ෂා සම්පත්තිය ලබාදෙන ලෙසද වදාළ සේක.

සක්දෙව් රජතුමා එය මුදුණින් පිළිගෙන ලංකා සම්බුද්ධ ශාසනය ආරක්ෂා කිරීමට උපුල්වන් දෙවියන්ට බාරදුන් අතර උපුල්වන් දෙවියෝ පරිබ්‍රාජක වේශයෙන් අවුත් විජය කුමරු ඇතුළු පිරිසට පිරිත් පැන් හා පිරිත් නූල් බැඳ ආරක්ෂාව ඇති කළහ.

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ මහ කරුණාවෙන් ලාංකිකයන්ගේ අනාගතය බලා තෙවරක්ම වැඩ සොළොස්මස්ථානයක සිරිපා පහසින් වන්දනීය, පූජනීය, ශුද්ධ භූමි බවට පත්කොට ලක්දිව සිසාරා ආරක්ෂා සම්පත්තිය ඇතිකොට වදාළ සේක.


විජය කුමරුගේ පටන් සෑම නරපතියෙක්ම අභිෂේක මංගල්‍යාදී ප්‍රධාන කාර්යයන් ක්‍රියාවට නංවා ධනාත්මක ප්‍රතිඵල ලබාගත්තේ පිරිත් ධර්මයේ ආශීර්වාද බලයෙන් හා එම උතුම් ශාන්තියේ බලයෙනි. ලාංකික ශිෂ්ටාචාරයේ ප්‍රසන්න උදාර ලක්ෂණය වන්නේද පිරිත් හා ධර්ම දේශනාමය පුණ්‍යකර්මයයි.

මේ සඳහා ලාංකිකයන්ට ඉතා යෝග්‍යතම කාලය ආරම්භ වන්නේ වෙසක් පුරපසළොස්වක් පෝ දිනයෙනි.

මධ්‍ය භාරතයෙන් බිහිවූ ආර්ය ශිෂ්ටාචාරයේ ව්‍යාප්තියට හින්දු ආගමේ පාරිසරික දේව ශාන්තියත්, බුද්ධාගමේ පිරිත් හා ධර්ම දේශනා මෙන්ම ධාර්මික රාජ්‍ය පාලනයත් මූලාධාර වූ වග භාරත ලංකා ඉතිහාසයෙන් ප්‍රත්‍යක්ෂ වන්නේය.

බුදුරදුන් තෙවරක් ලක්දිවට

"යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."



වැඩමවීම විජය රජු ප්‍රධානව පාලක පිරිස පැමිණීම හා ඉතා ශීඝ්‍ර ලෙස ජනාවාස පිහිටුවා රාජ්‍ය තහවුරු කිරීමාදී ප්‍රධාන කරුණු එක්වන්ව සිදුවීම නිසා ලංකා වංශකතාව ප්‍රභාමත් වීමට හේතුභූත විය. මේ නිසා විජය රජුගේ පටන් සෑම නරපතියෙක්ම බුද්ධාගම අනුව ධාර්මිකව රාජ්‍ය තන්ත්‍රය ගෙන ගියහ.

දෙවන පෑතිස් රජතුමා මිහිඳු මහරහතන් වහන්සේගේ මාර්ගෝපදේශකත්වය අනුව ධර්මාශෝක රජතුමා සමග අන්‍යෝන්‍ය මිත්‍රත්වය සංකේතවත් කරමින් එම රජතුමා විසින් එවන ලද රාජ්‍ය භාණ්ඩ පිළිගෙන වෙසක් මස පුරපසළොස්වක් පෝදින දෙවන වර අභිෂේක මංගල්‍යය සිදු කළහ.

බෞද්ධ, හින්දු ආගම්වල සඳහන් පරිදි ජනතා සේවයට කැපවූ හෙළ රජදරුවෝ සතර පෝය නිවාඩු දින වශයෙන් රාජ්‍ය සම්මත කොට අවිහිංසාවාදීව රට, ජාතිය, ආගම ප්‍රධාන කරගත් උතුම් ශිෂ්ටාචාරය ආරක්ෂා පෝෂණය කරමින් රාජ්‍ය තන්ත්‍රය ගෙන ගියහ.

අටවිසි යුද්ධයක් කොට ලංකාව එක්සේසත් කළ දුටුගැමුණු මහ රජතුමා සූවිසි මහා වේශාඛ පූජාවක් සිදුකළ වග එම රජතුමාණන්ගේ 'පිං පොතේ' සඳහන් වන්නේය.

**''මහා වෙසාඛ පූජාච**
**චතු වීසති කාරසිංහ**
**දීපෙ සංඝස්ස තික්ඛත්තුං**
**තිචීවර මදාපයිං''**

තුන් සිංහලයෙන්ම මහා සංඝරත්නයට දන් පැන් සිවුරු පූජා කිරීම, මහජනතාවට දන්සල් පවත්වා සංග්‍රහ කිරීමාදී ආගමික ජාතික සේවාවන් සිදුකිරීම වෙසක් උත්සව දවස්වල කෙරෙන ප්‍රධාන කාර්යයන් වන රජ මැති ඇමැතිවරු එහි ප්‍රධානත්වය උසුලති.

සමස්ත මිහිතලයේම අසහාය චෛත්‍ය රාජයාණන් වන රුවන්වැලි මහා සෑයේ මංගල ශිලී ප්‍රතිෂ්ඨාපනය කළේ වෙසක් පුර පසළොස්වක් පෝ දිනකය. විසා නැකතින් යෙදෙන සුබ මුහූර්තිය සියලු ආගමික ජාතික කාර්යයන් ආරම්භ කිරීමෙන් සාධනීය වශයෙන් ධනාත්මක ප්‍රතිඵල ලබාගැනීමට හේතු වන්නේය.

ලංකාවේ වෙසක් උත්සවය ආගමික, ජාතික වශයෙන් සුවිශේෂ වූ වග ඉතිහාස තොරතුරු වාර්තාවලින් දක්නට පුළුවන. සිරිසඟබෝ, බුද්ධදාස ආදී රජවරුන් කළ වෙසක් පූජා ඉතා උදාරය. වෙසක් පෝය වෙනුවෙන් රාජ්‍ය පාලකයන් මෙන්ම පොදු ජනතාවද කරන ප්‍රධාන පින්කම් කීපයක් වේ.

**1. මහා සංඝරත්නයට දන් පැන් තුන් සිවුරු පූජා කිරීම**

**2. ජනතාවට දන්සල් පවත්වා ආහාර පාන වස්ත්‍ර පරිත්‍යාග කිරීම**

**3. පහන් පූජා පෙරහර පැවැත්වීම.**

අප බුදුරජාණන් වහන්සේ බුදු බවට පත්වූ දිනයේ මනු ලොව කිසිම සත්වයකු සාපිපාසාදී දුක් වේදනාවකට, වධබන්ධනාදී කුමන හෝ ආපදාවකට පත් නොවීය. මෙවන් අසිරිමත් සිද්ධීන් සනිටුහන් කරමින් පෙරදවස පටන් මෙතෙක් වෙසක් දිනයේ සෑම සත්වයාටම කුමන හෝ ආහාරයක් ලබාගෙන කුසගිනි නිවාගෙන සැනසෙන්නේ බුදු ගුණ මහිමය නිසාමය.

ලක්දිව උපසම්පදා භික්ෂූන් නැතිව ශාසනය පිරිහී ගිය වකවානුවල රාමඤ්ඤ, සියම්, රක්ඛංග ආදී දේශාන්තරවලින් උපසම්පදා භික්ෂූන් වැඩමවා යළි උපසම්පදාව පිහිටුවා සසුන් කෙත සරු කළ ආකාරය මහා පරාක්‍රමබාහු, විජයබා, සිව්වැනි පැරකුම්බා, සවැනි පැරකුම්බා, පළවැනි, දෙවැනි විමලධර්මසූරිය, කීර්ති ශ්‍රී රාජසිංහ යන උතුම් රජදරුවන්ගේ උදාර චරිතාපදානවලින් දක්නට පුළුවන. මෙම ශ්‍රේෂ්ඨ නරපතියන් සිදුකළ වෙසක් පින්කම් ප්‍රධානව ආගමික ජාතික සේවාවන් පිළිබඳ වාර්තාවන්ගෙන් මහා වංශාදී ඓතිහාසික ග්‍රන්ථ පිරී පවතින්නේය.

අප බුදුරජාණන් වහන්සේගේ උපත, බුදුවීම පිරිනිවන් පෑම යන තෙමඟුල සිහිපත් කොට හෙළ රජ දරුවන් මෙන්ම පොදු ජනතාවද තෙරුවන් ගුණ අමා දහරින් සිත් සතන් සනසාගෙන කළ පින්කම්වල බලමහිමයෙන් දෙව් මිනිස් නිවන් සම්පත් ලබා ගත්තා සේම මතුවටද මෙම අසිරිමත් දිනය නිමිති කරගෙන කෙළකෝටි ගණන් සත්වයන්ට ජාති ජරා ව්‍යාධි ශෝක පරිදේශවාදී සංසාර දුක් වේදනාවලින් අත් මිදෙන්නට හැකි වන්නේය.

**පූජ්‍ය අමුණුපුර පියරතන හිමි**

''පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි.''





# තුරුණු වියේ පසුවන අයකු පිළිකුල් භාවනාවේ යෙදීමෙන් ගෘහ ජීවිතයට බාධාවක් ඇති වේද?

## ඉඟුරුවත්තේ පියනන්ද හිමියන්ගෙන් අහමු

හුදු පොත පතින් පමණක් නොව භාවනාව පිළිබඳ ප්‍රායෝගිකව වැටහීමක් ඇති ගුරුවරයකුගෙන් උපදෙස් ලබා එම උපදෙස් පරිදි භාවනාව කරන යහපත් මානසිකත්වයක් ඇති අයකුට නම් කිසිදු ප්‍රශ්නයක් ඇති නොවේ. ගෘහ ජීවිතයටද යහපතක් මිස බාධාවක් ඇති නොවේ.


නූතනයෙහි භාවනා මධ්‍යස්ථානවලට ක්ෂණිකව ඇති වන විවිධ ප්‍රශ්න, ගැටලු මුල් කොටගෙන භාවනාව සඳහා පැමිණෙන අයද ප්‍රමාණයෙන් වැඩි බව පෙනේ. ජීවිතය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාගැනීම සඳහා පැමිණෙන අයගේ ඌනතාවක් පෙනේ. එය කාලීන සමාජ ප්‍රවණතාවක් යැයි සිතමි. මේ අතර භාවනාව විලාසිතාවක් වශයෙන් සලකා ක්‍රියා කරන අයද නැත්තේ නොවේ. එමනිසා තාවකාලික මානසික සුවයක් ලැබීම සඳහා, සිත සන්සුන් කරගැනීම සඳහා, විභාගාදියේදී සාර්ථක ප්‍රතිඵල අපේක්ෂාවෙන් ධාරණ ශක්තිය ඇතිකර ගැනීම සඳහා, ඉක්මන් කෝපය පාලනය කරගැනීම සඳහා යනාදී ලෞකික අරමුණු සඳහාම භාවනාවට යොමුවන අය සුලබය. එබඳු පරමාර්ථවල පිහිටා භාවනා කිරීමෙන් යහපත් චිත්ත සමාධියක් ඇතිකර ගැනීමට උදාර පරමාර්ථයකින් භාවනා කරන අයට තරම් පහසු නැත. බුදු දහමින් කියවෙන ජීවිතය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලැබීම සඳහා නොහොත් දුකින් මිදීම සඳහා භාවනාවට යොමුවීම වැදගත්ය. එබඳු භාවනා ක්‍රියාදමයකදී එහි අතුරු ඵල වශයෙන් ඉහත සඳහන් ලෞකික පරමාර්ථයන් නිරායාසයෙන්ම ක්ෂාත් ක්ෂාත් වේ.

ප්‍රශ්නයෙන් ඉදිරිපත් කෙරෙන පිළිකුල් භාවනාව හෙවත් කායගතා සතිය විශේෂයෙන් ධ්‍යාන භාවනා කරන්නකුට චරිතානුකූලව දෙන පූර්ව කමටහනකි. එයද ස්වභාවයෙන් රාගික සිත් නිතර නිතර භාවනා සිත මැඩගෙන ඉදිරිපත් වේ නම් (කසිනාදී භාවනාවක යෙදී භාවනා කරන විට මෙන්ම විදර්ශනා වඩන්නෙකුට වුවද) ප්‍රගුණ කළ යුතුය. ඒ සඳහාද අනිවාර්යයෙන්ම ගුරු උපදෙස් ගත යුතුය.

කාමභෝගී ගිහි ජීවිතයක් ගත කරන කාමයන්හිම ඇලී ගැලී වෙලී වාසය කරන කවරකුට වුවද කුමන භාවනාවක් හෝ කළ හැකි වීමට දන ශීලාදී ආගමික පසුබිමක් තිබීම කාලීන වශයෙන් ඉතාමත් සුදුසුය. බෞද්ධ වූ කවර වයසක ජීවිතය ගෙවන අයෙක් වුවද යම් ප්‍රමාණයකින් හෝ ආගමික ජීවිතයක් ඔවුන් තුළ තිබිය යුතුය. නිති පන්සිල් පොහොය පෙහෙවස් විසීම, දිනපතා සිය නිවසේදී සුළු වේලාවක් හෝ පුරුදු කරගත් භාවනා ක්‍රමයක් අනුගමනය කිරීම වැඩිමනත් විවේකයක් ලැබූ විට ගුරුවරයෙක් ඇසුරු කොට කීප දිනක් හෝ විදර්ශනා ක්‍රමයක් ප්‍රගුණ කිරීම ඉතාමත් සුදුසුය. මෙයින් අප පිළිකුල් භාවනා කිරීම නුසුදුසු යයි නොකියමු. ගෘහ ජීවිතය ගත කරන කම් සුව වළඳන ගිහියකුට හුදු අසුබ භාවනා වැඩීමේ තේරුමක් නැත. ටික වේලාවක් අසුබය වඩා කාම ගොහෝරුවට නැවත බැසීමට නම් අසුබය වැඩීමේ කිසිම තේරුමක් නැත. මෙය වරදවා වටහා නොගත යුතුය.


**ධර්ම ගවේෂක**

''අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය.''




ශ්‍රී ලංකා රාමඤ්ඤ
මහා නිකායේ මහානායක
ධුරන්ධර අග්ගමහා පණ්ඩිත
අතිපූජ්‍ය නාපාන පේමසිරි
මාහිමිපාණන් වහන්සේගේ
වෙසක් දින පණිවුඩය

# සිත නිවෙන පිළිවෙත්හි යෙදෙන්න



බොහෝ දෙනාගේ හිත සුව පිණිස, ලෝකයාට අනුකම්පාව පිණිස, දෙව් මිනිසුන්ගේ යහපත පිණිස ලොව පහළ වන ශ්‍රේෂ්ඨතම උතුමාණෝ අර්හත් තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේය. එවන් බුදුරජාණන් වහන්සේ කෙනකුන්ගේ ලොව පහළවීම අති දුර්ලභ කරුණකි. අද මේ උතුම් වෙසක් පොහෝ දින අපි අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල ඉමහත් සැදූහැයෙන් අනුස්මරණය කරමු. වැඩි දෙනෙක් ඒ සඳහා ආමිස පූජාවලම යෙදෙති. ආමිස පූජාවෙන් බුදුන් දැකිය නොහේ. ''යො ධම්මං පස්සති - සො මං පස්සති'' යි බුදුරදුහු වදාළහ. ''යමෙක් ධර්මය දකී නම් හේ මා දකී'' යන බුදු වදනට අනුව අප ධර්මය තුළින් බුදුරදුන් දැකීමට උත්සාහවත් විය යුතු වේ. අවම වශයෙන් අපි නව අරහාදී බුදු ගුණයන් තුළින් බුදුරදුන් දැකීමට උත්සාහ කළොත් අප තුළද රහසින්වත් පව් නොකළ බුදුරදුන්ගේ ශ්‍රාවකයකු වන මා ද පවින් වෙන්විය යුතුය, සිව් පස් ඉක්මනින් අවබෝධ කරගැනීමට උත්සාහ ගත යුතුය. ප්‍රඥාවෙන් හා යහපත් වචනයෙන් යුක්ත විය යුතුය. සොඳුරු වදන් ඇති කෙනකු විය යුතුය. ලෝකය ඇති සැටියෙන් දැනගැනීමට ක්‍රියා කළ යුතුය. සැඩ පරුෂකම් කරුණාවෙන් මැඩලිය යුතුය. සසර කතරෙන් එතෙර වීමට ක්‍රියා කළ යුතුය. බුදු මග යමින් ධර්මය අවබෝධ කරගැනීමට කටයුතු කළ යුතුය. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් නිවන් සාක්ෂාත් කරගැනීමට උත්සුක විය යුතුය යන අදිටන තමන් තුළ ජනිත වේ. මෙලෙස බුදු ගුණ දැන යමෙක් මට වෙන සරණක් නැත, මට ඇති උතුම්ම සරණ බුදු සරණයි යි පිළිගෙන බුදු සරණ ගියොත් හේ කිසිවිට අපායට නොයෙති. ''යේ කේචි බුද්ධං සරණං ගතාසේ - න තෙ ගමිස්සන්ති අපායං'' යැයි ඒ බව බුදුරදුහුම වදාළහ. වෙසක් දින සිදු කෙරෙන කටයුතු බොහෝමයකින් රාග, ද්වේෂ, මෝහ වැඩිවනු මිස ඒවා සමනය නොවේ. අද අපේ පිළිවෙත විය යුත්තේ රාග, ද්වේෂ, මෝහ සමනය වන සිත නිවෙන පිළිවෙතක යෙදීමයි. එය සියලු දෙනාට සග මොක් සුවය සඳහා හේතු වේ. අන්ධානුකරණයෙන් නිරර්ථක කටයුතුවලින් වැළකී දෙලොවටම යහපත ගෙන දෙන කටයුතුවලම යෙදීමට උත්සුක වන ලෙස සියලු දෙනා වෙත මෙත් සිතින් දන්වා සිටිමි.



# පනස් වසරකට පෙර, වෙසක්

**මෙය 1958 අප්‍රේල් මස සිළුමිණ පුවත්පතේ පළවූ ලිපියකි**

මෙකල ඉතා උත්කර්ෂවත් අන්දමින් වෙසක් උත්සවය පවත්වනු ලැබේ. විසිතුරු තොරන්, චිත්තාකර්ෂණී අන්දමින් පිළියෙළ කරන ලද විවිධ වර්ණවත් විදුලි බුබුළු, මහා පෙරහරවල්, දන්සල් යන මේ ආදියෙන් ලංකාවේ නොයෙකුත් නගර ගම් නියම්ගම්වල මේ බෞද්ධ මහෝත්සවය ජනතාව විසින් මහත් උද්‍යෝගයකින් පවත්වනු ලබන බව ප්‍රකටය.

මීට පෙර කාලයේදී හෙවත් මින් අවුරුදු හතළිහකට හෝ පනසකට පමණ පෙර මේ උත්සවය පවත්වන ලද්දේ කෙසේද යන්න දැනගැනීමට බොහෝ දෙනකු කැමති වනු නොඅනුමානය. වර්ෂ 1913 දී පමණ හෙවත් මීට අවුරුදු හතළිස් පහකට පමණ පූර්වයෙහිදී වෙසක් උත්සවය කොළඹ නගරයේ පැවැත්වූ ආකාරය සංක්ෂේපයෙන් අපට මතක ඇති අන්දමින් දැක්වීම සඳහා මේ ලිපිය ලියමි.



''මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දාම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?''

## ගොක්කොළ

ඒ කාලයේදී මෙකල තරම් බහුලව නොවූවත් වෙසක් සැරසිලි සෑහෙන තරම් තිබුණි. දැන් මෙන් චිත්‍ර රූපවලින් හෙබි තොරන් ආදිය නොතිබුණි. ඉතා වැඩි වශයෙන් ඇතිවූයේ උණ බම්බු සිටවා ගොක් කොළ ආරුක්කුවලින් යුක්ත වූ සැරසිලිය. විශාල ගෙවල් ඉදිරියේද, පන්සල්වල දොරටුවලද, තැඹිලි, පොල්, අන්නාසි ආදී පලතුරුවලින් සැදි ගෙඩි ගෙවල් වී. අමු පොල්වලින් සැදි ගෙඩි ගෙවල් විය. අමු පොල් අතු, ගොක් කොළ, බඩල් වනස්සය, පඹ පච්ච වඩම් ආදියෙන් සරසන ලද ලක්ෂණ තොරන්ද තැන තැන වූහ.

## පන්සල ප්‍රධානයි

මහජනයාගෙන් බොහෝ දෙනකුගේ සිරිත වූයේ සිය ගෙවල් දොරවල් සුළු වශයෙන් සරසා විහාරස්ථාන ඉතා අලංකාර අන්දමින් සැරසීමය. මේ නිසා එකල කොළඹ හා ඒ අවට ප්‍රදේශවල පිහිටි සෑම විහාරස්ථානයක්ම සිත් ගන්නා අන්දමින් සරසා පහන් දල්වා තිබෙනු දක්නට හැකිවිය. තුණුරුවන් වැඳ පුදා ගැනීමට යන සැදැහැවතුන්ගෙන් සෑම විහාරස්ථානයක්ම අතුරු සිදුරු නැති විය.

කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන, හුණුපිටියේ ගංගාරාමය, කොල්ලුපිටියේ වාළුකාරාමය, බම්බලපිටියේ සිරිවර්ධනාරාමය, කරගම්පිටියේ සුබෝධාරාමය, කැලණියේ රජමහා විහාරය ආදී සිද්ධස්ථානවලට ගොස් වැඳ පුදා ගැනීම රැස්වී සිටි මහා සේනාව නිසා තරමක් දුෂ්කර විය.

## බරකරත්තවලින්

වෙසක් දින හෝ ඊට පෙර දින කැලණි මහ විහාරය වන්දනා කරගැනීමට යාමද බොහෝ දෙනා නොකඩවා ගිය වන්දනා ගමනකි. එකල මෝටර් රථ, බස් රථ ආදිය නොතිබුණු බැවින් වන්දනාකරුවන් මේ ගමන යන ලද්දේ ගොන් දෙදෙනා බැඳි බරකරත්තවලිනි.



කරත්ත තටුවේ පිදුරු දමා ඒ උඩ පැදුරු දමා ඉතා සුවපහසු අන්දමින් වාඩිවීමට කරත්තය පිළියෙළ කළ පසු බවලත් අයත්, කුඩා ළමයිනුත් කරත්ත ඇතුළට වී වාඩි ගනිති. පිරිමින් කරන්නේ කරත්තකරුවා දෙපසද, පිටිපසද වාඩි වෙති. කීපදෙනෙක් කරත්තය අල්ලාගෙන පයින් ගමන් කරති.

වන්දනාකරුවන් මේ ගමන යද්දී කියන ගී හා සිව්පද නිසා ගමන් මහන්සියක් නොදූනේ. උදේ පාන්දරින්ම ගමන ආරම්භ කරන්නේ දවාලට බුදවමනා කරන ආහාරයද ලකලෑස්ති කරගෙනය.

## කැලණි යති


බත, කිරි හොද්ද, උම්බලකඩ බැදුම හා ගොඩ මැල්ලුමෙන් යුත් මේ ආහාරය තරම් රසවත් ආහාරයක් නැති යයි ඒ අනුභව කළ අයගේ මතයයි. දවාලට කැලණියට පැමිණි වහාම ගඟේ ස්නානය කොට කැලණියේදීම මිලයට ගන්නා බත් වළංවලට බෙදා ගත් බත් ව්‍යංජන ආදිය පිරිස වටේට වාඩිවී ප්‍රිය සල්ලාප බෙනෙමින් වළඳනු දැකීම සිත් ප්‍රිය කරවන දර්ශනයකි.

මේ කටයුතු හමාර වූ පසු සියලු දෙනාම තමන් විසින් ගෙනෙන ලද තෙල් මල් ආදිය රැගෙන තුණුරුවන් පිදීමෙහි යෙදෙති. බොහෝ වන්දනාකරුවෝ රෑ කාලය විහාරස්ථානයේම ගෙවා ආපසු ගෙවල්වලට යන්නේ අසූදාය. විහාරස්ථානයේ රාත්‍රී දර්ශනය චමත්කාරජනකය. තෙල්, මල්, පහන් රැගෙන සිටින මහා පිරිස පීරගෙන බුදු ගුණ ගී ගයමින් පහන් කූඩු හිස මත තබාගෙන චෛත්‍ය රාජයාණන් ප්‍රදක්ෂිණ කරන සැදැහැවතුන් සිය ගණනක්ය.

මේ අතරතුර මහළු උපාසිකාවන් කියන උපන් දා සිට කරපු පව් නැත වරක් වැන්දොත් කැලණියේ යන පාඨයද වරින් වර සවන වැටේ. දින දෙකක් පමණ මෙසේ ගත කළ වන්දනාකරුවෝ ආපසු ගෙවලට එද්දී කැලණියේ මුට්ටි වළං හා මැටි කළ බඩුද රැගෙන ඒමට අමතක නොකරති.

## තොරණ

චිත්‍ර රූපවලින් යුත් තොරණද, විදුලි බුබුළුවලින් ආලෝකය කිරීමද එකල මෙතරම් නොවීය. චිත්‍රවලින් යුත් සුප්‍රසිද්ධ විශාල තොරණ දෙකක් තිබුණේ කොළඹ කොටුවේ චැතැම් වීදියේය. මේ තොරණ දෙක ඉදිකර තිබුණේ මට මතක හැටියට දොන් තියෝ දෝරිස් ද සිල්වා හා ඩී. ඇස්. ද සිල්වා නම් ස්වර්ණාභරණ වෙළෙඳ ශාලා දෙක ඉදිරිපිටය. කොළඹ සිටි තරමක් සෙනග ඇදුණේ මේ වීදියට බව කිය හැකිය. රාත්‍රී කාලයේදී මුළු වීදියම



සෙනගෙන් පිරෙන නිසා ඒ පාර දිගේ රථවාහන මොන ලෙසකින් වත් ගෙන යා නොහැකි විය.

## කැරොල්

කොල්ලුපිටිය, කොම්පඤ්ඤවීදිය හා කෝට්ටේ ප්‍රීති ගීතිකා (කැරොල්) කණ්ඩායම් මේ ස්ථානයට පැමිණෙන නිසා මෙහි රැස්වන පිරිස ඒවා එනතුරු නතර වී සිටීම සිරිත විය.

එකල වෙසක් දින සිල් ගැනීම සාමාන්‍යයෙන් සීමාවී තිබුණේ වෘද්ධ වයස් වූ ස්ත්‍රී පුරුෂයන්ට පමණි. තරුණ හෝ දුබල අය සිල් සමාදන් වී සිටිනු දක්නට ලැබුණේ මද වශයෙනි.

මෙකල තරම් තරුණ වයසේ අය එකල සිල් සමාදන්වීම නොකළ බව අපේ වැටහීමයි. ඉරිදා දහම් පාඨශාලා, බෞද්ධ, ඉංග්‍රීසි, සිංහල පාඨශාලාදියද ඉතා අඩු වශයෙන් පැවැති නිසා මෙකල තරම් ආගම පිළිබඳ දැනුමක්ද එකල සිටි බෞද්ධයන් තුළ නොවීය.

## ශාන්ත භාවය

ආගම, ශ්‍රද්ධාවත් ධර්මය දැනීමත් වැඩි වන මේ අවධියේ ඊට අනුකූල වූ ශාන්ත භාවයත්, සදාචාර ගතිගුණත් අප බෞද්ධයන් තුළ ඇතිවේවායි මේ වෙසක් දිනයේ සාදර සිතින් ප්‍රාර්ථනා කරමි.

**මුදලිඳු ඊ. ඒ. අබයසේකර**

"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."



# ප්‍රාතිහාර්ය පෑමේ ඇත්ත සහ බොරුව

එක කාලයක බුදුරජාණන් වහන්සේ නාලන්ද නුවර අසල පාටාරික නම් අඹ වනයෙහි වැඩ වාසය කළහ. එසමයෙහි එනුවර ජීවත් වූ කේවට්ට නමැති බුද්ධිමත් තරුණයකු බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ ශ්‍රද්ධාවෙන් වැඳ එකත්පසක සිට බුදුරජාණන් වහන්සේට ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබීය.

කේවට්ට - ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, මේ නාලන්ද නුවර ජීවත් වන මිනිසුන් හරි පොහොසත්ය, ඉසුරුමත්ය. එසේම මේ නුවර ජනයාගෙන් පිරී ගැවසී ගත්තේය. මෙනුවර මිනිසුන් ඔබවහන්සේ කෙරෙහි අතිශයින් ප්‍රසාද සම්පන්න වූවාහුය. එනිසා යම් භික්ෂු නමකට ප්‍රාතිහාර්ය පෑමට අණ කරන සේක්වා. එවිට මෙනුවර වැසියෝ ඔබවහන්සේ කෙරෙහි වඩාත් පැහැදෙන්නාහ.

බුදුරජ - කේවට්ටය, සුදු වස්ත්‍ර අඳින ගිහියන් ඉදිරියෙහි උතුරු මිනිස් දමින් පෙළහර දක්වන්න යයි මම කිසිදු භික්ෂුවකට අණ නොකරමි.

දෙවනුවද, තෙවනුවද මෙම ඉල්ලීම ඉදිරිපත් කළ කේවට්ට නම් වූ තරුණයා හට බුදුරජාණන වහන්සේ ස්වකීය ස්ථාවරයේම හිඳ මෙසේ කරුණු පැහැදිලි කළහ.

බුදුරජ - කේවට්ට, මා විසින් අවබෝධ කරගත්තා වූ හා ප්‍රකාශ කළා වූ ප්‍රාතිහාර්යය තුන් කොටසකි. එනම්, ඍද්ධි

''දෙවූ වහාම කිරි නොම්දෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී.''

ප්‍රාතිහාර්යය, ආදේශනා ප්‍රාතිහාර්යය සහ අනුශාසනා ප්‍රාතිහාර්යය යන තුනයි.

ඍද්ධි ප්‍රාතිහාර්යය යනු කුමක්ද? මේ ශාසනයේ භික්ෂූන් වහන්සේලා විවිධ ඍද්ධි ප්‍රාතිහාර්යය දක්වති. ඒවා මෙසේයි. එක්කෙනෙක්ව සිට බොහෝ දෙනකු සේ පෙනී සිටියි. නොපෙනෙමින් සිට පෙනෙන බවට පත්වෙයි. පෙනෙමින් සිට නොපෙනෙන බවට පත්වෙයි. බිත්ති පවුරු කඳු හරහා අහසෙහි මෙන් නොගැටෙමින් ගමන් කරයි. ජලයේ කිමිදෙන්නාක් මෙන් පොළොවෙහි කිමිදෙයි, මතුවෙයි. පොළොවෙහි මෙන් ජලය මතුපිට ගමන් කරයි. අහසෙහිද පක්ෂියකු සේ යයි. හිරුද, සඳුද අතින් ස්පර්ශ කරයි.

මෙබඳු ප්‍රාතිහාර්ය පාන්න යැයි භික්ෂූන් වහන්සේට අණ කරන ලෙස මගෙන් අයදින ඔබ මා විසින් විමසන ප්‍රශ්නයටත් පිළිතුරු දිය යුතු යැයි බුදුහු කේවට්ට නමැති තරුණයාට කියති.

බුදුරජ - කේවට්ට, මෙම ප්‍රාතිහාර්ය භික්ෂුව විසින් ගිහියන් ඉදිරියේ පෙන්වන කල්හි එයින් පැහැදුණු යම් පුරුෂයෙක් නොපැහැදුණු පුද්ගලයකු හමුවී මෙසේ කියයි. ''පින්වත, පුදුමයකි. ඍද්ධි ප්‍රාතිහාර්ය දක්වන භික්ෂුවක මම දුටුවෙමි. ඒ භික්ෂුවගේ මහත් වූ ඍද්ධි ඇති බවද, මහත් වූ ආනුභාව ඇති බවද සත්‍යය වශයෙන්ම මහ පුදුමයකි'' යනුයි.

ඒ අසා ශ්‍රද්ධා නමැති ප්‍රාතිහාර්යයෙන් නොපැහැදුණු පුද්ගලයා පැහැදුණු අය හට මෙසේ කියයි. ඒ කෙසේද? ''පින්වත ගන්ධාරි නම් එක්තරා විද්‍යාවක් ඇත. ඒ විද්‍යාවෙන් ඔබ පළමු කී සියලු ප්‍රාතිහාර්යය පෑ හැකිය. ඔබ කියන ඒ භික්ෂුව ගන්ධාරි නම් විද්‍යාවෙන් මේ පෙළහර පෑවා විය හැකිය'' යනුවෙනි. කේවට්ටය මෙබඳු අවස්ථාවකදී ඔබ කුමක් සිතන්නේද? කෙනකුට එසේ කිව නොහැකිද?

කේවට්ට - ස්වාමීනි එසේ විය හැකියි.

බුදුරජ - කේවට්ට මම ඍද්ධි ප්‍රාතිහාර්යයෙහි දෙස් ඉතා හොඳින් දනිමි. එනිසා මම එකී ක්‍රියාදමය ලජ්ජා කටයුතු දෙයක් ලෙස සලකමි. එය පිළිකුල් කරමි.

ආදේශනා ප්‍රාතිහාර්යය යනු කුමක්ද? මේ ශාසනයේ පැවිදිව ධ්‍යාන ලබා අභිඥා උපදවා පරිචිත්ත විජානන ඥානය ලැබ අන් අයගේ සිත් දන හෙළි කොට කියයි. අන් අයගේ සිත්හි සොම්නස දොම්නස ආදිය කියයි. දූන් ඔබගේ සිත මෙබඳු ය. මෙබඳු දෙයක් දූන් ඔබ සිතමින් සිටී යනුවෙන් පර සිත් දන කියන්නා වූ භික්ෂුව දක පැහැදුණු සැදැහැවත් පුරුෂයෙක් සැදැහැ නැති කෙනකුට හට මෙසේ කියයි. ''පින්වත පුදුමයකි, අනුන්ගේ සිත් දන කියන්නා වූ භික්ෂුවක් මම දුටුවෙමි. එම භික්ෂුවගේ මහත් ඍද්ධි ඇති බවද මහත් ආනුභාව ඇති බවද සත්‍ය වශයෙන්ම පුදුමයකි'' යනුයි.

ඒ අසා සැදැහැ නැති නොපැහැදුණු පුද්ගලයා මෙසේ කියයි. ''පින්වත මනිකා නම් වූ විද්‍යාවක් තිබේ. එම විද්‍යාවෙන්ද අනුන්ගේ සිත් දන කිව හැකිය. ඔබ කියන ඒ භික්ෂුවද මනිකා නම් වූ විද්‍යාවෙන් මේ ක්‍රියාව කරනවාද විය හැකිය. කේවට්ට මෙබඳු අවස්ථාවකදී ඔබ කුමක් සිතන්නෙහිද? කෙනකුට එසේ කිව නොහැකිද?

කේවට්ට - ස්වාමීනි එසේ කිව හැකිය.


බුදුරජ - කේවට්ට මම ආදේශනා ප්‍රාතිහාර්යයෙහි දෙස් ඉතා හොඳින් දනිමි. එනිසා මම එකී ක්‍රියාදමය ලජ්ජා කටයුතු එකක් ලෙස සලකමි.

අනුශාසනා ප්‍රාතිහාර්යය යනු කුමක්ද? මගේ ශාසනයේ භික්ෂු තෙම මෙසේ අනුශාසනා කරයි. මේ ලෙස කල්පනා කරන්න, මෙසේ මෙනෙහි කරන්න, මෙය දුරු කරන්න, මේවා කරන්න ආදී වශයෙන්ය. මෙය ශ්‍රාවකයන් හික්මවීම සඳහා වන අනුශාසනා ප්‍රාතිහාර්යය නම් වේ.

දි. නි. කේවට්ට සූත්‍රය

මෙයින් කියවෙන අදහස් දෙකක් වෙයි. එනම්, සමාජයේ සාමාන්‍ය ප්‍රජාව ආගම දෙස බලන හා ආගමෙන් බලාපොරොත්තු වන දෙයයි. අනෙක වන්නේ බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයාගෙන් අපේක්ෂා කරන හා ඔවුන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙතයි.

සාමාන්‍ය සමාජයේ බොහෝ මිනිසුන් ආශා කරන්නේද, ප්‍රිය කරන්නේද බුදු හිමියන් ප්‍රතික්ෂේප කරනු ලැබූ ඍද්ධි ප්‍රාතිහාර්යයන් දෙනෙතින් දක සැදැහැ සිත් වර්ධනය කරගැනීමටයි. එනිසාම ඔවුන් බෞද්ධ භික්ෂූන් වහන්සේලා දෙස බලන්නේද උන්වහන්සේලාගෙන් අපේක්ෂා කරනු ලබන්නේද එබඳුම ප්‍රාතිහාර්යයන් පමණි. අහවලාට අහවල් ප්‍රාතිහාර්ය හැකියාව තිබේ යැයි තමන් නොදුටුවද වෙනත් කෙනකුගේ මුවින් අසා ඒ ගැන අසීමිත භක්තිය පළකරන්නටද මිනිස්සු සමර්ථයෝය. මිනිස් මනසෙහි පවතින මේ රික්තය කලින් කල දිවයිනේ තැනින් තැන පහළ වන ඩුප්ලිකේට් මුනිවරුන් විසින්ද සාස්තර හා පේන කියන කපුවන් විසින්ද පුරවනු ලැබේ. ඇතැම් විට ඒවා ආගමික මුහුණුවර ඇසුරේද වැඩෙයි. නිකවැරටියේ බෝධියෙන්



බුදු පිළිම මතුවීම, දෙළකන්දේ අසිරිමත් ප්‍රාතිහාර්යය, රත්නපුර සමන් දේවාලයේ ලියලන ගල, පිල්ලෑවේ බෝධියෙන් දරු සම්පත් ලැබීම, සයිප්‍රසයේ දේව මෑණියන්ගේ පිළිමයෙන් කඳුළු ගැලීම ආදිය ඉන් සමහරකි.

විවිධ ප්‍රාතිහාර්යය විෂයෙහි පුද්ගලයාගේ නෙත් සිත් දිව ගියද එසැණින් එය පිළිගත යුතු නොවේ. නමුත් සමාජයේ වැඩි පිරිසක් පිළිගනු ලබන සිද්ධියකදී එයට එරෙහි වීමද එතරම් සුදුසු ක්‍රමයක් ලෙස සැලකීම අපහසුය. ඒවා පිළිගත යුත්තේ ආශ්චර්ය ක්‍රියා විශේෂ ලෙස භක්ති ගෞරව පමණක් නොව එම භක්තියට බුද්ධියේ යම් යම් සම්මිශ්‍රණද ප්‍රවේශ කොට ගැනීමෙන් යුතුවයි. එසේ නොවුණහොත් තමාටමද තමා පිළිබඳ සැකයක් පහළ විය හැකිය. මන්ද තමා සෑම දෙයකටම රැවටෙන නිසාය. එය පුද්ගල පෞරුෂ වර්ධනයට එතරම් සුදුසු වූවක් නොවේ.

බුදු හිමියන් පෙන්වා දුන් අනුශාසනා ප්‍රාතිහාර්යය සෑම කෙනකු විසින්ම විශ්වාස කළ යුතු වෙයි. ඒ උන්වහන්සේ දෙසූ ධර්මය පිළිබඳව ඇති කරගත් විශ්වාසය නිසාය. එය හුදු විශ්වාසයක් මතම නොරඳවා ක්‍රියාත්මක කිරීමටද යුහුසුළු විය යුතුය.

**මහාචාර්ය පාතේගම ඤාණිස්සර හිමි**

''තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය.''



# සසර ගමන නතරකර ගැනීමට නම් තෘෂ්ණාව ප්‍රහීණ කළ යුතුය

දේශකයාණෝ ස්‍යාමෝපාලි
මහානිකායේ මල්වතු මහාවිහාර
පාර්ශ්වයේ විංශද්වර්ගික
ගරු කාරක සංඝසභික
**පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ**
මේධංකර තේවාවහාර නායක
ස්වාමීන්ද්‍රයන් වහන්සේ

"අනෙකජාති සංසාරං
සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො
දුක්ඛා ජාති පුනප්පුනං

ගහකාරක! දිට්ඨොසි
පුන ගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා
ගහකූටං විසංඛිතං
විසඞ්ඛාරගතං චිත්තං
තණ්හානං ඛයමජ්ඣගා"

පින්වත්නි,

"සත්වයාගේ නැවත නැවත ඉපදීම දුකෙකි. එබැවින් මේ ආත්මභාවය නැමති ගෙය සාදන වඩුවා සොයා නොදැක, නොයෙක් ජාතීන් හි ඉපිද බොහෝ කල් සසරේ ඇවිද්දෙමි. මේ ආත්මභාවය නැමති ගෙය සාදන වඩුව, මම තා දුටුවෙමි. නැවත මේ ගෙය නොසෑදිය හැකිය. තාගේ සියලු කෙළෙස් නැමති පරාල බිඳ දැමුවෙමි. එහි කැණිමඬල සුනු විසුනු කළෙමි. මාගේ සිත නිවනට පැමිණියෙහිය.

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

තෘෂ්ණාව මුළුමනින්ම කෙළවර කොට රහත් වීමි. නිවන පසක් කර ගතිමි".

මනුෂ්‍යයාගේ භවගාමී ජීවිත ස්වභාවය වන ඉපදීම, දිරීම, ලෙඩවීම, මියයාම (ජාති, ජරා, ව්‍යාධි, මරණ) ශෝක පරිදේව, දුක්ඛ දෝමනස්ස යනාදී වශයෙන් පඤ්චූපාදානස්කන්ධයම දුකකි. එය සනාතන ධර්මතාවයකි. එහි පැවැත්ම නිරන්තර ජරා, මරණ දුකට හේතු වේ. අනිත්‍ය වූ මේ ස්කන්ධාදියේ පැවැත්ම දුකකි. නැවත නැවත ඉපදීම ඇති කරන කාම තණ්හාව, භව තණ්හාව, විභව තණ්හාව යන තෘෂ්ණාවන් ප්‍රහාණය කළ යුතුය. කාම තණ්හාව නම් ඇස, කණ, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රිය වලට කැමති අරමුණු ලබා දීමෙන් ඉඳුරන් පිනවීමයි. කම් සැප විඳීමයි. පංචකාම සම්පත් පිළිබඳව ඇතිකරගන්නා ආශාවයි. කාම භවයේ ලබන සැප සම්පතින් සෑහීමකට පත් නොවී රූප අරූප භව වල සැපතට ආශා කර, ධ්‍යාන මගින් ඒ ඒ ලෝක වලට ගොස් සැප ලැබීමේ ආශාව මත සත්වයා සදාකාලික යැයි සිතා ඇතිකරගන්නා ශාස්වත දෘෂ්ටිය භව තණ්හාවයි. මරණයෙන් පසු නො ඉපදී සිටියොත් වඩා හොඳ යැයි සිතා උච්ඡේදයට යන ආශාවෙන් මරණයෙන් පසු නැවත ඉපදෙන්නේ නැතැයි යන උපකල්පනයෙන් යුතුව ඇතිවන තෘෂ්ණාව විභව තෘෂ්ණාවයි. එනයින් දුක පැවතීම සඳහා මුල් වන්නේ තෘෂ්ණාවයි. එය ප්‍රහාණය කළ යුතුය. ඒ සඳහා දුක්ඛ නිරෝධය නම් වූ නිවන සාක්ෂාත් කර ගත යුතුය. එය පරම සත්‍යයයි.

මෙකී ත්‍රිවිධ තණ්හාව සම්පූර්ණයෙන් නැසීම, නැතිකිරීම, දුක්ඛ නිරෝධයයි. ඒ නිරෝධය නිවන නමින් හැඳින්වේ. මෙසේ ජාති, ජරා, ව්‍යාධි, මරණ දුරු කිරීමෙහි ලා තෘෂ්ණාව සපුරා කෙළවර කොට පරම මෝක්ෂය නම් වූ ශාන්ති දායක නිවන ලබා ගැනීම සඳහා සංසාර ගමනේ ඇති දුකත්, ඊට හේතුවත් දැන, තමන්ගේම බුද්ධියෙන් චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කළ නිසා, තථාගතයන් වහන්සේ බුද්ධ නම් වූ සේක. භවයෙන් භවයට පෙරළෙමින් දුක් විඳිමින් පවතින සත්වයාගේ පැවැත්මත්, එයට හේතුත් එයින් තොර වූ සැනසීම ලැබීම සඳහා මධ්‍යම ප්‍රතිපදාවෙන් දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග (දුක, දුක ඇතිවීමට හේතුව, දුක නැතිකිරීම, දුක නැතිකිරීමේ මාර්ගය) නම් වූ චතුරාර්ය සත්‍යය අවබෝධ කොට සියලු කෙළෙස් නසා සියලු ලෝක සත්වයන්ටත් අවබෝධ කරවන අධිෂ්ඨානයෙන් මහබෝසතාණෝ සමතිස් පෙරුම්දම් පිරූහ. සුමේධ තවුස්ව ඉපිද දීපංකර බුදුරජාණන් වහන්සේගෙන් නිවන් පසක් කර ගැනීමට හැකියාව තිබිය දී, "මම සසර කතරින් එතෙර වී අන් අයත් එතෙර කරවන්නෙමියි" සිතා දීපංකර බුදුරජාණන් වහන්සේගෙන් නියත විවරණ ලැබූහ. බුද්ධාංකුර ධර්ම සපුරා අවසන් භවය ලෙස සිදුහත් කුමරු වශයෙන් කිඹුල්වත් පුර සුද්ධෝදන මහරජතුමන් නිසා මහමායාදේවීන් කුස පිළිසිඳ රාජ කුමාරයෙකු වශයෙන් වෙසක් මස පුන් පොහෝ දිනයක ලුම්බිණී නම් සාලවන උද්‍යානයේ දී උපත ලැබූහ. තිසි වයස් එළඹි කල රූමත් ගුණවත් යසෝදරා කුමරිය සමග විවාහ පත් වූහ. කාමසුකල්ලිකානු යෝගයෙන් සියලු ගිහි සැප විඳ මහල්ලෙක්, රෝගියෙක්, මළ සිරුරක්, හා තවුසෙක් යන සතර පෙර නිමිති දැක සසරෙහි කළකිරී පැවිදි වූහ. එතැන් පටන් අත්ථකිලමතානු යෝග යෙන් සාවුරුද්දක් තිස්සේ දුෂ්කරක්‍රියා කළහ. ශරීරයට දැඩි දුක් දීමෙන් නිවන් අවබෝධය කළ නොහැකි බව දැන අත්ථකිලමතානු යෝගය බැහැර කොට මධ්‍යම ප්‍රතිපදාවෙන් ආර්යාෂ්ඨාංගික මාර්ගය පිළිපැද නේරංජනා නදී තීරයෙහි සිරිමහබෝමැඩ සෙවනෙහි දී වෙසක් මස පුරපසළොස්වක පොහොය දිනයෙක අරුණ නැගෙන වේලෙහි දසමරුන් පරදවා පලමු යාමේ පූර්වේනිවාසානුස්සති ඤාණය උපදවා, මැදියම දී දිවැස පිරිසිදු කරගෙන, පස්චිම යාමයේ දී සියලු ලෝසතුන් කෙරෙහි මහා කරුණාවෙන් හේතුප්‍රත්‍ය ධර්මය කෙරෙහි ඤාණය උපදවා අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සිහි කරමින් සම්බුද්ධත්වයට පැමිණ වදාළ සේක. එසේ බුද්ධත්වයට පත්ව ප්‍රථමයෙන් දේශනා කොට වදාළ "අනේක ජාති




සංසාරං" හා "ගහකාරක! දිට්ඨොසි" යන ගාථා ධර්ම දෙක ඉන් අනතුරුව දෙව්රම් වෙහෙරෙහි වැඩවසන සමයෙහි ආනන්ද මහතෙරුන් වහන්සේ විසින් විමසන ලදුව යළිදු දේශනා කොට වදාළ සේක.

සත්වයා රාග සහිතව, ද්වේශ සහිතව නැවත නැවත ඉපදීම හෙවත් ජාතිය, වයසට යෑම හෙවත් ජරාවට පත්වීම, ලෙඩවීම හෙවත් ව්‍යාධියට පැමිණීම හා මරණයට පත්වීම, ශෝකය, වැලපීම, ශාරීරික, චෛතසික දැඩි දුකට හා සංසාර දුකට පත්වීම යනාදිය ස්වභාව කොට ඇත. ඒ දුකෙන් නිදහස් වීමට නම් රහත් ඵලයට පැමිණීමට තණ්හාවේ මුල් නසාලිය යුතුය. තණ්හාව සපුරා කෙළවර කිරීමෙන්, අවිද්‍යාව දුරකිරීමෙන්, සංස්කාරයන් කෙළවර කොට නිවන් මග සාක්ෂාත් කරගැනීමට හැකිය.

මිනිසාගේ සසර ගමන දික්වනුයේත්, දුකට පත්වනුයේත්, ලෝභයෙන්, තෘෂ්ණාවෙන්, ද්වේෂයෙන්, මෝහයෙන් පිරීගිය

විටය. මනුෂ්‍යයෙකුගේ තෘෂ්ණාව වඩන දොරටු සයකි. ඇස, කණ , නාසය, දිව, කය හා සිත යනු ඒ සයයි. ප්‍රිය මනාප දෙයින් සතුට ප්‍රීතිය, සැපය අත්වන අතර අප්‍රිය මනාප දෙයින් අතෘප්තිය, දුක ඇතිවෙයි. මොහොතක් සතුටු වුවත් නිමේෂයකදී දුකටම පත්වෙයි. ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පසිඳුරන් රූප, ශබ්ද, ගන්ධ, රස, පහස වශයෙන් උපදින සිතිවිලි තුළින් සෑම මනුෂ්‍යයෙක්ම මුලාවට පත්වේ. එසේ මුලාවට පත්වන සත්වයා සතුට තෘප්තිය, ආශ්වාදය පමණක් අපේක්ෂා කරයි. මෙසේ සිත පිනවීමේ කෙළවරක් නොදැකීමෙන් යළිත් දුකටම පත්වෙයි. දුක කොතෙකුත් වින්දනය කළත් නොසංසිඳෙන ආශාව නිසා විඳින දුක අමතක කර යළි සතුට සොයා නරකටම, දුකටම පත්වෙයි.

ප්‍රඥාවන්ත මනුෂ්‍යයා දුකින් ගැලවීමට සිත දියුණු කර කුසල් දහම්හි හැසිරෙයි. සීල, සමාධි, ප්‍රඥාවෙන් සිත සෝදා පිරිසිදු කරගත් විට, සිත දමනය කරගත්විට නිවන් මඟ හෙළිවෙයි. තෘෂ්ණාව ප්‍රහීණ කළ විට සියල්ලෙන් සැනසීම ලද හැකිය.



සදාකාලික සැනසිල්ල ලබා ගන්නට නම් නිවන් මඟම පසක් කරගත යුතුය. සසර සයුරෙන් එගොඩ වන්නට, සසර බැමි වලින් මිදී විමුක්තිය ලබාගන්නට නම්, සියලු පව් නොකිරීමත්, කුසල් දහම් රැස් කිරීමත්, අවශ්‍ය බව සම්බුද්ධ දේශනාවයි. ඒ සඳහා දුක, දුක හටගැනීමට හේතුව, දුකට හේතුව නැති කිරීම, දුකින් මිදීමේ මාර්ගය යන සත්‍ය සතර අවබෝධ කර ගත යුතු බව බුද්ධානුශාසනාවයි. දුකින් මිදීමේ මාර්ගය වන්නේ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා  කොට වදාළ මැදුම් පිළිවෙත හෙවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. ඒ ආර්යාෂ්ඨාංගික මාර්ගය නම් ප්‍රඥාවට අදාල යහපත් දැකීමය (සම්මා දිට්ඨි), යහපත් සිතිවිලිය (සම්මා සංකප්ප), සීලයට අදාල යහපත් වචන (සම්මා වාචා), යහපත් ක්‍රියා (සම්මා කම්මන්ත), යහපත් දිවිපැවැත්ම (සම්මා ආජීව), සමාධියට අයත් යහපත් වෑයම (සම්මා වායාම), යහපත් සිහිය (සම්මා සති), යහපත් සමාධිය (සම්මා සමාධි) වශයෙන් නිවන් මග හෙළිකර ගැනීමට සීල, සමාධි, ප්‍රඥා යන මේවා වඩාගත යුතුය. මෙසේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කිරීම නිවන් අවබෝධ කරගැනීමට පමණක් නොව මෙලොව ජීවිතය සාර්ථක කර ගැනීමට ද හේතු වේ. චතුරාර්ය සත්‍ය අවබෝධ කර දුක කෙළවර වූ විට තෘෂ්ණාව දුරු කිරීමෙන් නිවන මොලොවදීම වුව අවබෝධ කරගත හැකිය. නිවන ලෝකොත්තරය. නැවත ඉපදීමක් සිදු නොවේ. පුනර්භවයට පත්වන්නේ නැත. "අයමන්ති මාජාති නත්ථිජාති පුනබ්බවෝති" යනුවෙන් බුදුරජාණන් වහන්සේ ධම්මචක්කපවත්වන සූත්‍රයෙහි විමුක්තිය හෙවත් අරහත් ඵලයට පැමිණ මේ අවසන් ජාතිය බවත් පුනර්භවයක් හෙවත් නැවත ඉපදීමක් නැති බවත් වදාළ සේක.

පසිඳුරන් අරමුණු කොට රූප, වේදනා, සංඥා, සංකාර, විඤාණ යන පංච උපාදානස්කන්ධයන්ගේ නැවත නැවත ඉපදීම සිදු කරන උපනුපන් භවයේ ඇල්ම ඇතිකෙරෙන, කාම තණ්හාව, භව තණ්හාව, විභව තණ්හාව යන තෘෂ්ණාවන් දුකට හේතු වේ. දුකට හේතුව වූ තෘෂ්ණාවෙන් මිදීමෙන් දුක්ඛ නිරෝධය නම් වූ නිවනට පත්විය හැකිය. දුක් ඉපදීමට හේතුව නැති කිරීමේ එකම මාර්ගය ආර්ය අෂ්ඨාංගික මාර්ගය බව ධම්මචක්කපවත්වන සූත්‍ර දේශනාවෙන් උගන්වයි. ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ දෝමනස්සයන්ගෙන් පීඩාවට පත්වන ජීවිතය පිළිබඳව සිහිනුවණින් කල්පනා කොට බුදුරජාණන් වහන්සේ දේශනා  කළ දුක, දුක ඉපදීමට හේතුව දැන එයින් එතෙරවීම නම් නිවන අවබෝධ කර ගැනීම අපේ මූලික අරමුණ විය යුතුය. වර්තමාන සමාජයේ වැඩි දෙනාගේ ජීවිත අරමුණ තෘෂ්ණාව ප්‍රහීන කොට නිවන සාක්ෂාත් කරගැනීම නොවේ. ඔවුන්ගේ සිත් සසර ගමන නො නවතින ඇලීම් ගැලීම් වගා කරන ලෝභය, ද්වේශය, මෝහය වැඩි කරන අරමුණු හා බැඳේ.

බෞද්ධයන්ගේ අරමුණ විය යුත්තේ සීල, සමාධි, ප්‍රඥාවන් වඩා වර්ධනය කොට කෙළෙස් මල බැහැර කිරීමය. එසේ නොමැතිව තෘෂ්ණාවේ ඇලී ගැලී සිටීමෙන් දුක් වේදනා පිරි සසර ගමන තව තවත් දික් වේ. දුෂ්කර වූ මනුෂ්‍ය ආත්ම භාවයක් ලබාගත් අප හැම දෙනා සසර බැඳ තබන අපේ සිත් සක්කාය දිට්ටි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාම රාග, පටිඝ, රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිද්‍යා යන දස සංයෝජන බන්ධනයන්ගෙන් මුදවාගෙන තෘෂ්ණාව සපුරා කෙළවර කොට කෙළෙස් මලින් පවිත්‍ර කරගත හැකි නම් නිවන අවබෝධය මෙම ආත්ම භවයේදී වුවද කළ හැක්කකි. බුදුරජාණන් වහන්සේ සත්වයාගේ දුක පිළිබඳව යථා තත්වය පමණක් නොව විමුක්ති මාර්ගය පැහැදිලි කිරීමට පටිච්චසමුප්පාදය දේශනා කොට වදාළ සේක. සංස්කාරයන් පිළිබඳව යථාභූත අවබෝධය නැත්නම් ඒ හේතුවෙන් මිනිසා ඉන්ද්‍රියානුසාරයෙන් ලබන විඳීම තුළින් තෘෂ්ණා උපාදාන ඇතිකරගෙන භවයේ දුක් විඳින ආකාරය උගත හැකිය. අවිද්‍යාව ප්‍රත්‍ය කොට සංස්කාර හටගන්නා බව එතුළින් පැහැදිලි වේ.

මනුෂ්‍යයාගේ නැවත නැවත ඉපදීමට හා සසර ගමන දික්කිරීමට හේතු සාධක වන තෘෂ්ණාව ප්‍රහීණ කොට දුකින් නිදහස්ව, නිවන් මග හෙළිකර ගැනීමට සියලු අකුසලයන්ගේ මුල් සිඳ, සියලු කුසලයන් සපුරාගෙන විමුක්තිය ලැබීමට මෙම උතුම් පොහෝ දිනයේ දී අදිටන් කර ගනිමු. තෙරුවන් සරණයි.

''යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.''




# පැරණි සිංහලයාගේ වෙසක් පුද සිරිත්

## නොඇසූ කතා

බෞද්ධයන්ගේ වැදගත්ම ආගමික උත්සවය වෙසක් පසළොස්වකයි. බෝසත් උපත, බෝසත් බුදු බව ලැබීම, බුදුහිමි පිරිනිවන් පෑම වෙසක්ද සිදුවිය. ඒ හැර වෙසක් පසළොස්වක ලංකාවට වැදගත් වීමට හේතු ගණනාවකි. විජය කුමරු ඇතුළු හත්සියයක් ආර්යයන් ලංකාවට පැමිණ ලංකාව ජනාවාස කිරීම, අශෝක රජුගේ අනුග්‍රහය ඇතිව පෑතිස් රජු (ක්‍රි.පූ. 250-210) මුල්ම රාජාභිෂේකය ලැබීම, දුටුගැමුණු රජු රුවන්වැලිසෑයට මුල්ගල තැබීම ඉන් කරුණු තුනකි. පෑතිස් රජු අශෝක රජු එවූ රාජාභිෂේක ද්‍රව්‍ය ලබාගෙන මුල්ම රාජාභිෂේක උළෙල පැවැත්වීමෙන් පසුව හැම අවුරුද්දකම වෙසක් පසළොස්වකද සිංහල රජවරු නැවත නැවත අභිෂේකය ලැබීම චාරිත්‍රයක් විය. රජවරුන්ගේ රාජ වර්ෂ ගණනය කළේ මෙසේ වෙසක් පසළොස්වක ඔටුණු පැළඳවීමේ වාර ගණන අනුව බව පරණවිතාන මහතා කියයි. උදාහරණයක් ලෙස කෝට්ටේ හයවැනි පරාක්‍රමබාහු රජු (1412-1467) පස් පනසක් ඔටුනු දරූ බව ඔරුවල සන්නස හා 'අලකේශ්වර යුද්ධය' කියයි. මේ අනුව ඔහු වෙසක් පසළොස්වක පොහොය පනස් පහකදී නැවත නැවත අභිෂේකය ලබා ඇත.

බෞද්ධයන්ගේ බුද්ධ වර්ෂ ව්‍යවහාරය ආරම්භ වනුයේ වෙසක් පසළොස්වකිනි. බුදුහිමි තුන්වන වරට ලංකාවට වැඩියේද වෙසක් පුර පසළොස්වකදය. ශ්‍රී පාද වන්දනා සමය නිමවනුයේ වෙසක් පසළොස්වකදය. කුරුණෑගල සතරවන පරාක්‍රමබාහු රජු කල ක්‍රි.ව. 1312 මහනුවර ශ්‍රී වර්ධන බලකොටුව හා අස්ගිරි විහාරය ආරම්භ වූයේ වෙසක් පසළොස්වකද බව 'අස්ගිරි උපත' හා 'අස්ගිරි තල්පත' කියයි. මේ අනුව 1312 වෙසක් පසළොස්වකද එකම දින ශ්‍රී වර්ධනපුර බලකොටුව හා

"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."



ශ්‍රී වර්ධනපුරයේ අස්ගිරි විහාරය ආරම්භ විය. 1765 වැන් ඊත් යටතේ ඕලන්දයින් මහනුවර නගරය හා දළදා මැදුර දැඩි ලෙස වනසනු ලදුව ක්‍රි.ව. 1770 වෙසක් පසළොස්වකද අවුරුදු හතක දීර්ඝ ප්‍රතිසංස්කරණයකින් පසු කීර්ති ශ්‍රී රාජසිංහ රජු මහනුවර අද ඇති දෙමහල් මාලිගාව වෙසක් පසළොස්වකදක යළි විවෘත කර ඇත.

වෙසක් පුර පසළොස්වක වීසා නැකතින් උදාවීම ඉතා සුබ ලෙස පැරණි සිංහලයන් සැලකූ බව චාල්ස් ගොඩකුඹුරේ ඔහුගේ "ශාස්ත්‍රීය ලිපි හා කතා" ග්‍රන්ථයේදී කියයි. එහෙත් හැමවිටම වෙසක් පොහොය වීසා නැකතින් උදා නොවෙයි.

බුදු දහම සමග දඹදිව ඇතිවී තිබූ වෙසක් උළෙල ගැන මූලාශ්‍රවල තොරතුරු එයි. අශෝක රජුගේ හතරවන ගිරි ලිපියේ තොරතුරු අනුව රජු රටවැසියන්ට විමාන, ඇතුන්, දිව්‍යමය රූප ප්‍රදර්ශනය කර ඇත. ඒ වෙසක් උළෙල ගැන ඉඟියකි. පස්වන සියවස මුල දඹදිවට ආ චීන ජාතික පාහියන් හිමි අවුරුද්දේ දෙවැනි මස (බක්මහෙන් ඇරඹෙන අවුරුද්දේ දෙවැනි මාසය වෙසක්ය.) කෝට්ටාං නුවරදී පිළිම පෙරහරක් රථයක පිටුපස ගෙන යන චෛත්‍ය රූප දුටු බව කියයි. පාහියන් හිමි කෝට්ටාං නුවරදී දුටුවේ වෙසක් උළෙලක් බව හැඟෙයි.

බුදු දහම සමග දඹදිව වැඩුණු වෙසක් උළෙල පැතිස් රජු කල මිහිඳු හිමි ලංකාවට ගෙනා බව පෙනෙයි. එහෙත් වංශකතාවක වෙසක් උළෙල පැවැත්වූ පළමු රජු ලෙස සටහන් වන්නේ දුටුගැමුණු රජුය. (ක්‍රි.පූ. 161-137) මහාවංශය හා පූජාවලි අනුව අවුරුදු පතා ගැමුණු රජු වෙසක් උත්සව 24 ක් පවත්වා ඇත. මුල් කල වෙසක් උත්සව උළෙල ඉතා චාම් විය. ආමිෂ පූජාවට වඩා ප්‍රතිපත්ති පූජාව වැදගත් විය. බක්මහට පෙර ගොයම් කපා ගත් සිංහල ගොවීන්ට වෙසක් මස වනවිට විවේකය විය. නිවස තුළ හාල්, කුරක්කන්, ධාන්‍ය විය. වෙසක් මස වනවිට ඊළඟ කන්නය සඳහා වැසි ඇද වැටෙයි. වැව්, ඇල දොළ ජලයෙන් පිරෙයි. පරිසරය චමත්කාරය. ගිනියම් අව්වෙන් කැකෑරුණු පරිසරය වර්ෂාවෙන් තෙත් වී ගහකොළ අලුතෙන් දලු ලා මල් පිපෙයි. ගස්වැල් මල්බර වෙයි. අවුරුද්දේ විසිතුරුම පරිසරය වෙසක් මස උදාවෙයි. මල් පල පිරුණු ගස්වල කුරුල්ලෝ නාද දෙති. ගොයම් කපා පාගත් පසු සිංහලයෝ ගම්වල නඩ වශයෙන් නඩේ ගුරා යටතේ කෑම බීම කර තබාගෙන වන්දනාවේ ගියහ. ඒවා සති දෙක තුනක් කල්ගත වන ඒවා විය. අනුරාධපුර වට වන්දනාවේ යාම සිරිපාද වන්දනාවේ යාම බහුලව සිදුවිය. අම්බලම්වල නැවතී උයා පිහා කා විඩා හැර කවි කියමින් වන්දනා ගමන් යාම එද චාරිත්‍රය විය.

වෙසක් පසළොස්වක සිල් සමාදන් වීම වැදගත් විය. සිල් නොගත් අය තෙල් මල් රැගෙන පන්සල් ගොස් වන්දනාමාන කළහ. පහන් පූජා කළහ. පන්සලේ රෑ එළිවනතුරු ධර්ම දේශනා විය. දුගී මඟී යාචකයින්ට දන්

දීම, ගිලනුන්ට උවටැන් කිරීම, පෝයට පෙර පන්සල් බිම පවිත්‍ර කිරීම, හීයට ගන්නා සතුන්ට නිදහස දී කවා පොවා නහවා සාත්තු කිරීම ඉන් කිහිපයකි. පන්සල් යනවිට නොවරදවාම දනය ගෙන ගිය අතර රාත්‍රී පහන් පූජා කළහ. වැඩිහිටියන්ට වන්දනාමාන කළහ. පන්සලෙන් නිවසට ආවේ උදෑසනය. නගරවල තොරණ, පහන් පූජා උත්සව, දන්සැල් පැවැත්වුණි. බාහිර ඔපයට ඔපයට වඩා ආධ්‍යාත්මික ගුණ වගාව එහි පරමාර්ථය විය.

මහාවංශය හා මහාවංශ ටීකාව අනුව භාතිකාභය රජු (ක්‍රි.පූ. 19 - ක්‍රි.ව. 9) වෙසක් උළෙල ද කිරිබත් පිදීම, මහා දන දීම් කර ඇත. වසභ රජු (67-111) වෙසක් උත්සව 44 ක් පැවැත්වූ අතර ඒ මගින් රජුගේ ආයුෂ දීර්ඝ විය. වොහාරතිස්ස රජු (214-230) වෙසක් ද භික්ෂූන්ට තුන් සිවුරු පුද ඇත. ජෙට්ඨතිස්ස රජු වෙසක් උත්සවද මහා විහාර පහේ හා වෙනත් ස්ථානවල පෙරහර පවත්වා දන් දුන් බව මහාවංශය කියයි.

චූලවංශය අනුව තුන්වන සේන රජු (853-887) වෙසක්ද දුප්පත් රටවැසියන්ට බත් හා වස්ත්‍ර දන් දුන් බව කියයි. චූලවංශයේ වෙසක් උත්සවය ගැන සටහන්වලදී ''වෙසඟ කෙලි'' (වෙසඛ කීලං) යයි සටහන් වී ඇත. මේ අනුව මුලදී ඉතා චාම් ලෙස ප්‍රතිපත්ති පූජාවලට සීමා වූ වෙසක් උළෙල පසුකාලය වනවිට මහායානවාදය පැතිරීම, හින්දු භක්තිවාදය පැතිර යාම නිසා ආධ්‍යාත්මික පැත්තට වඩා සැණකෙළියකට බර උත්සවයක ලකුණු එකතු විය. චාර්ල්ස් ගොඩකුඹුරේ කී පරිදි අනුරාධපුර අගතල නමවෙනි සියවසට පසු වෙසක් උළෙල ජාතික සැණකෙළියක මුහුණුවර ගෙන ඇත. එය විශේෂයෙන් බලපෑවේ රජ පවුල, ඇමතීන් හා ඉහළ නිලධාරී පන්තියටයි. පූජාවලිය හා සුළු රාජාවලිය අනුව වෙසක් උත්සවය සමග රජු දිය කෙළියකටද එකතු වී ඇත.

අල්තල සාමාන්‍ය රටවැසියා චාම් ආගමික ප්‍රතිපත්ති පිරූ අතර පසුකලද ඔවුන් එම චාම් සරල ප්‍රතිපත්තිවලම දිගටම පැවතුණු බව සිතිය හැකිය. වෙසඟ කෙළිය සැණකෙළියක් වූයේ රජු, රජ පවුල හා ඉහළ රාජ්‍ය නිලධාරීන්ටය. මහායානයේ පැතිරීම සමග වෙසක් පෙරහර විසිතුරු උත්සව පැතිර ගොස් ඇත. ඒ සඳහා අභයගිරිය හා ජේතවනාරාමයේ අනුග්‍රහය ලැබූ බව පෙනෙයි. ශ්‍රී පාද වන්දනා සමය වෙසක් පසළොස්වක නිම විය. එක් ප්‍රදේශවලින් ශ්‍රී පාදයට යන වකවානු වෙනස් වෙයි.

''මත්තරම්පුර පුවත'' අනුව දෙවැනි රාජසිංහ රජු (1636-1687) වෙසක් පෝයද රටවැසියා සමග එක්ව රජු දළඳ පූජා පැවැත්වීය. මේ අනුව වෙසක් පසළොස්වකද දළඳ මැදුරේ විශේෂ පින්කම් උත්සව පවත්වා ඇත. මුංකොටුවේ රාළ ලියූ ''සඟරාජවත'' අනුව කීර්ති ශ්‍රී රාජසිංහ රජු (1747-1782) වෙසක්ද සිරකරුවන් නිදහස් කර ඇත.

පොළොන්නරු යුගයට පසු වෙසක් උළෙල ගැන වංශකථාවල සටහන් සොයාගැනීම අසීරුය. චාර්ල්ස් ගොඩකුඹුරේ කියන පරිදි රොබට් නොක්ස්, දෙස්තර ඩේවි වෙසක් ගැන සඳහන් නොකිරීමෙන් පෙනෙනුයේ සෙන්කඩගල කල වනවිට දේව වන්දනාව, යක්ෂ විශ්වාස සමග බුදු දහම බිඳ වැටීම හා ශාසනයේ පරිහානියයි. කීර්ති ශ්‍රී රාජසිංහ රජු වෙසක් උත්සව 18 ක් පැවැත්වූ බව සෙන්කඩගල ලියවුණු නරේන්ද්‍ර චරිතාවලෝකන ප්‍රදීපිකාව කියයි. රාජාධි රාජසිංහ



රජු (1798-1815) වෙසක් උත්සව කළ බව නරේන්ද්‍ර චරිතාවලෝකන ප්‍රදීපිකාව කියයි.

පෘතුගීසි, ඕලන්ද, ආධිපත්‍ය පරිදි පහත රටින් වෙසක උත්සවය යටපත්ව ගිය අතර 1815 න් පසු උඩරටින්ද වෙසක් උළෙල බෞද්ධ චාරිත්‍ර ක්‍රමයෙන් යටපත් විය. එයට හේතුව ඉංග්‍රීසි ආධිපත්‍යය හා ක්‍රිස්තියානි ආභාෂය, මිෂනාරි බලපෑම් නිසා 1892 න් පසු යළි ඇතිවූ වෙසක් උත්සවවලට බටහිර සංස්කෘතියේ හා ක්‍රිස්තියානියේ බලපෑම් එකතු වී ඇත. විවිධ වර්ණ වෙසක් කඩදාසිවලින් සැරසිලි කිරීම, පිටරට මුද්‍රණය කළ වෙසක් පින්තූර සැරසිලිවලට යොදගැනීම, විවිධ වර්ණ පිටරට බකට්, පහන් භාවිතය, ඉටිපහන් හා වෙසක් කූඩු දැල්වීම, භක්ති ගීත හා කැරොල් පැතිර යාම, වෙසක් සුබ පැතුම් පත් යැවීම එවැනි විදේශීය බලපෑමේ ලක්ෂණ කීපයකි.

**එස්. කේ. ජයවර්ධන**

''ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත.''



# දන්සැලකදී පිළිපැදිය යුතු බෞද්ධ ක්‍රමවේදය

වෙසක් පුන් පොහෝ දිනයත් සමග බැඳුණු ප්‍රධාන යහපත් කටයුත්තක් වන්නේ දන්සල් පැවැත්වීමයි. එය අන්‍යෝන්‍ය වශයෙන් බද්ධ වූ යහපත් ක්‍රියාවක් වන අතරම අතීතයට වඩා වර්තමාන සමාජයේ මිනිස්සු දන්සැල් පැවැත්වීමට මහත් උනන්දුවෙන් කටයුතු කරති. එනිසා දන්සැල් පැවැත්වීම සෑම ප්‍රදේශයකම දක්නට ලැබෙන පොදු දර්ශනයක් බවට පත්ව ඇත. එසේම බොහෝ දෙනා මහත් කැපවීමෙන් හා උනන්දුවෙන් යුක්තව එළදයී අයුරින් මෙන්ම විශාල පිරිසකට යහපතක් උදාකිරීමේ අරමුණින් සිදු කරති. ඒ අනුව දන්සල් පැවැත්වීමේ පුරුද්ද වැඩිවී වෙසක් පොහෝයට පමණක් සීමා නොවී පොසොන් හා ඇසළ පොහෝ දිනවලදීද දන්සල් පවත්වන්නට බොහෝ දෙනෙක් පෙළඹී සිටිති.

දන්සලක් සාර්ථක වීමට එය පවත්වන පිරිසගේ දයකත්වය පමණක් නොසෑහේ. ඒ සඳහා එයට සහභාගි වන පිරිසත් ඉතාමත් වැදගත්ය. එනිසා දන්සලෙන් ප්‍රතිලාභ ලබන පිරිසගේ කැපවීමත් අනිවාර්ය කරුණක් වන නිසා පරිත්‍යාග ශීලී දන්සල් සංවිධායකයන් හා එයට පිවිසෙන ප්‍රතිග්‍රාහකයින් යන දෙපිරිසගේම අන්‍යෝන්‍ය සහයෝගය හා කැපවීම සාර්ථක දන්සලකට අත්‍යවශ්‍ය කරුණක් බව අවබෝධ කරගත යුතු වේ. එබැවින් දන්සල් පවත්වන පිරිස දන්සල සාර්ථක කරගැනීමට දන්සලට පැමිණෙන පිරිසගේ සුරක්ෂිත බව හා නිරෝගී බව පිළිබඳව පළමුව කල්පනා කළ යුතු අතර දන්සලක් සාර්ථක කරගැනීමට පිළිපැදිය යුතු පහත විස්තර කර ඇති බුදුන් වහන්සේගේ අවවාදයද සිහියේ තබාගෙන කටයුතු කළ යුතු වේ.

දන්සලක් පවත්වන පිරිස තුළ තිබිය යුතු ප්‍රධාන ගුණ ධර්ම පහක් බුදුන් වහන්සේ විසින් පෙන්වා දී ඇත්තාහ. එය සංයුක්ත නිකායෙහි සක්ක සංයුත්තයෙහි දැක්වේ. එම ගුණධර්ම හය දන්සල් පවත්වන යමෙක් තුළ වේද ඔහු සත්පුරුෂයෙකි. එවිට ඔහු සෑම දෙනාගේ කීර්ති ප්‍රශංසාවට පත්වෙයි. එවැනි අය මරණින් පසු ශක්‍ර තත්ත්වයට පත්ව දෙවියන්ගේද නායකයා වෙයි. එනිසා දන්සලක් පවත්වන විට පහත දැක්වෙන ගුණධර්ම සම්බන්ධ කරගැනීමට කටයුතු කිරීම සත්පුරුෂ ක්‍රියාවකි.


**1. පරිත්‍යාග කරන වස්තුවට ආශා නොකිරීම (මුත්තචාග)**

අපි සෑමවිටම අප වෙත ඇති දෙයක් පරිත්‍යාග කරමු. එයට අපි ආශා කරමු. එය සාමාන්‍ය මිනිස් චර්යාවකි. නමුත් දනයකදී පරිත්‍යාග කරන වස්තුවට ආශා නොකිරීම දන්සල් පවත්වන්නන් විසින් පුරුදු කළ යුතු පළමු සාරධර්මයයි. පළමුව දෙන දෙය මනසින් අතහැරිය යුතුයි. දීම නමැති ක්‍රියාව ගැන සිතුවත් දුන් වස්තුව පිළිබඳව කල්පනා නොකළ යුතු බව බෞද්ධ ඉගැන්වීමයි.

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."

**2. පරිත්‍යාගය සෑමවිටම පිරිසිදු අත්වලින් සිදුකිරීම (පයතපාණී)**

පරිත්‍යාගය පිරිසිදු අත්වලින් සිදුකිරීම වශයෙන් අදහස් කරන්නේ පිරිසිදු සිතකින් දීමයි. ඒ අනුව සිතේ ඇති ආශාව, ලබන පුද්ගලයන් කෙරෙහි ඇති තරහව හා හොඳ නරක නොහඳුනන පුරුද්ද අත්හැර දැමීමයි. අනතුරුව සිතෙහි පරිත්‍යාගශීලී අදහස් උපදවා ගැනීම, ලබන අය කෙරෙහි කරුණාව, මෛත්‍රිය, දයාව, අනුකම්පාව වැනි ධනාත්මක සිතිවිලි උපදවා ගැනීම හා යහපත අයහපත හඳුනාගෙන ක්‍රියා කිරීම මෙහිදී තවදුරටත් අදහස් කෙරේ. එවිට දන්සල් පවත්වන අය පිරිසිදු සිතක් ඇති, ප්‍රියමනාප මුහුණක් ඇති දැකුම්කළු අය බවට පත්වෙයි.




**3. පරිත්‍යාගයෙහි බැඳීමයි (වොස්සග්ගරත)**

පරිත්‍යාග කිරීමෙහි බැඳී ක්‍රියාකිරීම තෙවැනි පියවරයි. එනම් "මෙය ඉතා උසස් ආකාරයෙන් මොහුගේ කායික මානසික සුවය වෙනුවෙන් දෙන්න ඕන" යන මානසික නැඹුරුකම වර්ධනය කිරීමයි. එවිට යම් යම් වස්තූන් තමා වෙත අත්පත් කරගැනීමේ අදහස සිතෙන් ඉවත් වී පරිත්‍යාග කරන අදහසෙහිම මනස රැඳෙයි. එවිට මානසික සුවයක් උදාවී සිත, කය දෙකම සැහැල්ලු වෙයි. එබඳු සුවයක් ලැබීමට හා අත්විඳීමට පරිත්‍යාගයෙහිදී නිබඳව උත්සාහ කිරීම වැදගත් චර්යාවකි.

**4. පරිත්‍යාගයක් ඉල්ලීමට සුදුසු අයෙක් වීම (යාචයොගො)**

සියලු දෙනාම පරිත්‍යාගයට සුදුසු තත්ත්වයක නොසිටින ආකාරයෙන්ම සියලු දෙනාම යමක් ඉල්ලීමට සුදුසු අයද නොවෙති. හිඟන්නෙක් හෝ දුප්පත් අයෙක් ඇවිත් කිසියම් දෙයක් ඉල්ලන්නේ මුහුණ දෙස බැලීමෙන් පසුවය. එයින් මෙම තැනැත්තා දෙන අයෙක්ද, නොදෙන අයෙක්දැයි විමසා බලයි. නොදෙන අයගෙන් යමක් ඉල්ලමින් වෙහෙසීම නිෂ්ඵල ක්‍රියාවකි. එනිසා මෙම කරුණින් අවධාරණය කෙරෙන්නේ ''මම පරිත්‍යාග කරන අයෙක්'' යන අදහස කියවෙන ප්‍රතිරූපයක් ගොඩ නගා ගැනීම බව තවදුරටත් දැක්විය හැකිය. මානසිකව ඇතිකර ගනු ලබන මෙම සිතිවිල්ල කායිකවද ක්‍රියාත්මක වීම දක්නට ලැබෙයි. එවිට ඔහු දෙන අයෙක් යන ගුණය සියලු දෙනා අතරෙහි පැතිරෙයි.



**5. දීමෙහි හා මැනවින් බෙදා පරිත්‍යාග ඇලීමයි (දානසංවිභාග රතො)**

ඒ ඒ අයට අවශ්‍ය දේ හඳුනාගෙන පරිත්‍යාග කිරීම මෙයින් කියවේ. පරිත්‍යාගය ලබන පුද්ගලයාගේ අවශ්‍යතාව පරිදි මැනවින් බෙදා දීමයි. සමහර දේවල් සමහර අයට අවශ්‍ය නොවේ. නිදසුනක් වශයෙන් දියවැඩියාව ඇති රෝගියකුට රසකැවිලි හා පිටි ආහාර නොදීමයි. එහෙත් ඇතැම් අවස්ථාවල ළමයින්ට රසකැවිලි වර්ග හා පිටි ආහාර අවශ්‍ය වේ. ඒ අනුව ඒ ඒ පුද්ගලයාගේ අවශ්‍යතා හඳුනාගෙන වස විෂ නැති ගුණදායක පිරිසිදු ආහාර වේලක් දීම මෙයින් කියවේ.

ශ්‍රී ලාංකේය ප්‍රජාව බුදු දහම සිය ජීවිතයට බද්ධ කරගත් එනිසාම සදාචාරය හා සාරධර්මවලින් පෝෂිත ශ්‍රේෂ්ඨ ජාතියකි. එම ප්‍රෞඪත්වය අතීතයෙහි පැවැති බව සාහිත්‍ය කෘතිවලින් පැහැදිලි වේ. එම ප්‍රෞඪත්වය අද අපෙන් ගිලිහී ගොස් ඇත. එයට ප්‍රධාන හේතුවක් වන්නේ ජීවීන්ගේ ප්‍රධාන අවශ්‍යතාවක් වන ආහාරයට වස විෂ දැමීමයි. අපේ සිංහල ජාතිය තරම් අනුන්ට වස විෂ දෙන අනෙකුත් ජාතියක් නොමැති බව මහත් පීඩාවෙන් යුතුව පැවැසිය යුතුය. රසකාරක භාවිතය හා රසායනික ද්‍රව්‍ය භාවිතය මේ විනාශයට හේතුවයි. එනිසා මිනිස්සු විවිධ රෝගාබාධයන්ට ගොදුරු වීම, ආයුෂ කෙටි වීම, දරුඵල අහිමි වීම හා විරූපී වීමද සිදුවෙයි. එනිසා මේ වෙසක් පොහෝ දිනය අනුස්මරණය කරමින් පරිත්‍යාග කරන, දන්සල් පවත්වන අවධියෙහි වස විෂ නැති ගුණදායක ආහාර වේලක් දීමට උනන්දු වෙමු.

මෙබඳු පරිත්‍යාගක් සිදු කිරීමෙන් ඔහු හෝ ඇය සත්පුරුෂයෙක් වන අතර ඔවුන්ගේ කායික, මානසික සුවය දිගු කාලයක් මැනවින් ආරක්ෂා වෙයි. එසේම ඒ අයගේ පරිත්‍යාගශීලී ගුණය නිසා සැම දෙනාගේම ගෞරවයට පත්වෙයි. එසේම ඔහු ශ්‍රේෂ්ඨ ජාතියක් ඇති සත්පුරුෂයෙක් වෙයි.

**ආචාර්ය එච්. එම්. මහින්ද හේරත්**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, - පේරාදෙණිය විශ්ව විද්‍යාලය.**

''යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි.

# දළදා වරුණ

ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## වෙසක් අදිටන

සිදුහත් කුමරුගේ ඉපදීම, බුදුවීම සහ පිරිනිවන් පෑම යන ත්‍රිවිධ උතුම් මංගල්‍යයන් සිදුවූ වෙසක් පුන් පොහෝ දිනය අදයි. ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් ලෝක සත්වයා වෙත පතල මෙත් කරුණා ශාන්තියෙන් යුතුව දෙසා වදාළ නිර්මල බුද්ධ ධර්මය ගැන නැවත ආවර්ජනය කිරීමට තරම් උතුම් දිනයක් අපට තවත් නැත. ථෙරවාදී බුදුදහම පවතින එකම දේශය වන ශ්‍රී ලංකාද්වීපයෙහි දිනෙන් දින අසන්නට ලැබෙන විවිධාකාර අපරාධ, අකටයුතු, අපචාර හා මිනීමැරුම් ගැන සලකා බලන විට අද අප වාසය කරන්නේ එදා "ශ්‍රී සදහම් දිවයින" නමින් හැඳින්වූ ශ්‍රී ලංකාවේද යන්න වෙලාවකට හිතාගන්නටත් බැරි තරම්ය.

වෙසක් පුන් පොහෝ දිනක සිදුවූ බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑමෙන් පසුව සිදුවූ ප්‍රථම ධර්ම සංගායනාවටද ප්‍රධාන නිමිත්තක් වූයේ එදා "සුභද්‍රා" නම් භික්ෂුව විසින් කළ දෝෂ සහගත ප්‍රකාශය බව ශාසන ඉතිහාසයේ සඳහන් වේ. බුදු සසුනට නොගැළපෙන කියුම් කෙරුම් හේතුකොටගෙන බුදුදහම හා බුදු සසුන පිරිහීම වළක්වා ගැනීම පිණිස ප්‍රථම සංගායනාව සිදුවූ බව ඉතා පැහැදිලිය. බුද්ධ පරිනිර්වාණයෙන් වසර දහස් ගණනකට පසුව අද වත්මන් සංඝ සමාජය දෙස බලන විටදී නැවතත් සංගායනාවක අවශ්‍යතාව අපට පෙනී යයි. බුදු සසුනට මෙන්ම මහ සඟරුවනටද නිගා වෙන පරිදි හැසිරෙන සමහර ගිහි පැවිදි අය නිසා සිදුවන හානිය අතිමහත්ය. එසේම විවිධ අදහස් දරන මිථ්‍යා දෘෂ්ටිකයන්ද දිනෙන් දින ඉහළ යන ප්‍රවණතාවක් දක්නට පිළිවන. සසර දුක කෙළවර ඇති නිර්මාණය අවබෝධ කරගැනීම සඳහා සමහර මිථ්‍යා දෘෂ්ටික අදහස් හා බොරු මත පළකරන මෙම උදවියගෙන් නිර්මල ථෙරවාදී බුදු දහම ආරක්ෂා කරගැනීම සඳහා බුද්ධ ශාසන අමාත්‍යාංශයට ඇති වගකීමද අති විශාලය. මෙබඳු වාතාවරණයකදී රට පාලනය කරන වගකිව යුත්තන්ටද නිහඬ වී සිටිය නොහැකිය. මේ ආත්මයේදීම නිවන් දැකිය හැකි බවට ඔවුන්ගේ "නිකායට" අයත් එක් චීවරධාරියකු ප්‍රකාශ කොට තිබිණ. දැනුමින් හා බුද්ධියෙන් අඩු අපේ සමහර බෞද්ධයෝද මෙසේ කෙටි මං මගින් නිර්වාණ සම්පත්තිය උදාකර ගන්නට සැදී පැහැදී සිටිනවා විය හැකිය. මෙය ඉතාමත් කනගාටුදායක තත්ත්වයක් බව නොකියා බැරිය. බෞද්ධ ජනයාගේ සිත් වල්මත් කරවීමේ විවිධ ක්‍රමවේදයන් අප නිවැරදිව හඳුනාගෙන බුදුන් දෙසා වදාළ නිර්මල ධර්මය මතු පරපුර සඳහා ආරක්ෂා කරදීම අප කාගේත් පරම යුතුකම බව මේ උතුම් වෙසක් පුන් පොහෝදා බැති සිතින් අවධාරණය කර සිටින්නෙමු. ■



# තුන් සිත
# ධාතූන් වහ
# වැඩ සිටි



බෞද්ධ දර්ශනයේදී ත්‍රිවිධ චෛතියෝ ලෙස ශාරීරික චෛතිය, පාරිභෝගික චෛතිය හා උද්දේශිත චෛතිය හඳුනා ගන්නා අතර එහිදී බුදුන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් ශේෂවී ඇති ධාතු සමූහය ශාරීරික චෛතිය නම් වේ. උන්වහන්සේ පරිභෝග කළ පා, සිවුරු ආදී වස්තූද, ශ්‍රී මහ බෝධීන් වහන්සේ හා ඒ බෝධීන් වහන්සේගෙන් පැවත එන බෝධීන් වහන්සේද පාරිභෝගික චෛතියෝ ලෙස හඳුනා ගැනෙති. උන්වහන්සේ නිරූපණය කරමින් නිර්මාණය කර ඇති ප්‍රතිමා රූපයන් උද්දේශික චෛති ගණයට වැටේ. මෙම ත්‍රිවිධ චෛත්‍යයෝ අතරින් ශාරීරික චෛතියට බෞද්ධයන් තුළ ඉමහත් ගෞරවයක් හිමිව ඇත්තේ ජීවමාන බුදුන්ට සමාන තත්ත්වයක් එම ධාතූන්ට හිමිව ඇති නිසාවෙනි. එමනිසා සර්වඥ ධාතූන් වහන්සේලා දැක බලා, වැඳ පුදා ගැනීම ජීවමාන බුදුන් දැකීමක් ලෙස බෞද්ධයෝ විශ්වාස කරති.

ධාතු සංකල්පයේ උප්පත්තිය විමසා බැලීමේදී


එය ක්‍රි.පූ. 6 වන සි
පරිනිර්වාණ සමය
බුදුන් වහන්සේගේ
ශරීරයේ කොටස්ව
ඉල්ලා අරගලයක්
ලෙස බෞද්ධ සාහි
අරගලයට පුද්ගල
වූ අතර ඔවුන් වන
රජු, විසාලාවෙහි
ශාක්‍යයන්, අල්ලක
කෝලියන්, වෛදී
හා කුසිනාරාවෙහි
පරිනිබ්බාණ සූත්‍ර
කෝලාහලය සන්
ද්‍රෝණ නම බමුණ

බුද්ධ දේහය
ධාතූන් වහන්සේල
ඉතිහාස ග්‍රන්ථ දැ
කරුණු සමූහයකි.

● දීසනිකා

''අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙ

# පහදන
# න්සේලා
# න තැන්



- ආදාහනයෙන් පසු බුදුන් වහන්සේගේ සිරුර අවශේෂ වූ බව දැක්වුවද අවශේෂ වූ කොටස් පිළිබඳව සඳහන් කර නොමැත.

- සුමංගලවිලාසිනිය - ආදාහනයෙන් පසු සතර දළදාවන්, අකු දළදා ද්විත්වය හා උණ්හීසය යන ධාතු නොවිසුරුණු අතර අනෙක් ධාතූන් විසිරුණු බවත් එහිදී විසිරුණු කුඩා ධාතු අබ ඇට පමණද, මහා ධාතු බිඳී ගිය සහල් ඇට පමණද හා අතිමහත් ධාතු මැදින් බිඳී ගිය මුං ඇට පමණද වූ බව.

- සුත්තනිපාත අටුවාව - ආදාහනයෙන් පසු සියලු ධාතු රන්සුණු මෙන් විසිරී ගිය බවත්,


එසේ වුවද බෞද්ධ ජන සමාජයෙහි එන ජනප්‍රිය මතය වන්නේ ධාතු බෙදාගැනීම සඳහා පැමිණි පුද්ගල කණ්ඩායම් අවට ද්‍රෝණ බමුණා විසින් බුද්ධ භෂ්මාවශේෂ සමසමව මැන බෙදා දුන් බවත්, එම මැනීමට භාවිත කළ බඳුන ද්‍රෝණ බමුණා ගත් බවත්, පිප්ඵලීව නයේ මෞර්යයෝ පමාවී පැමිණි හෙයින් බුද්ධ චිතකයෙහි අඟුරු රැගෙන ගොස් ස්වකීය රාජ්‍යයන් තුළ ස්තූප කළ බවයි. ඒ අනුව බුද්ධ ආදාහනයෙන් ශේෂවූ ධාතූන් නිධන් කර ස්තූප 10 ක් කරවූ බව පෙනේ. ධාතු එක් ස්ථානයක නිදන් කරන ලද ධාතූන් එම ස්ථානයෙන් පිටතට ගෙන දඹදිව පුරා පතුරුවා හරින ලද්දේ අශෝක රජු විසිනි.

දළදා වහන්සේලා දෙනමක් මෙරට වැඩම කර සිටිති. ඉන් එක් දළදාවක් සෝම නුවර (වර්තමාන සේරුවිල) සෝමාවතී දාගැබේ නිදන් කර ඇති අතර අනෙක් දළදාව වනාහි මහනුවර දළදා මැදුරෙහි වැඩ සිටින ශ්‍රී දන්ත ධාතුවයි.

ලක්දිව වැඩ සිටින ගෞතම බුදුන්ගේ ධාතූන් වහන්සේලා පිළිබඳව සොයා යැමේදී වර්තමානයේ මහනුවර දළදා මාළිගාවෙහි වැඩ හිඳින බුදුන් වහන්සේගේ වම් යටි ඇන්දේ ශ්‍රී දළදාව වැඩම කරවන ලද ක්‍රි.ව. 4 වන සියවසටත් පෙර සිටම මෙරට ජනයා ධාතු වන්දනයට යොමුව තිබූ බවට වංශකතා සාධක ලැබේ. වංශකතා සාධක අනුව බුද්ධත්වයෙන් නොබෝ දිනකින් තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයන් තමන්ට ලැබුණු කේශ ධාතු මෙරටට වැඩමවා හිරිගඩු සෑය කර ඇත. පසුව ප්‍රථම වරට මේ ලක්දිවට වැඩම කළ බුදුන් මහා







...වෙසේ සිදුවූ සම්බුද්ධ ...ක්වා දිවෙන බව පෙනේ. ...පිරිනිවනින් පසු සම්බුද්ධ ... (සරීරානං භාගං) අයිතිය ...ැති විය. ධාතු කෝලාහලය ...යයේ හැඳින්වෙන මෙම ...ණ්ඩායම් අටක් සම්බන්ධ ...න් මගධයෙහි අජාසත් ...ච්ඡවින්, කපිලවත්පුවෙහි ...ප්පයෙහි බුලයන්, රාම ගාමයෙහි ...ක බමුණා, පාවාහී මල්ලයන් ...ල්ලයෝය. දිඝනිකායෙහි මහා ... සඳහන් වන පරිද මෙම ධාතු ...වීම සඳහා මැදිහත් වී ඇත්තේ ...

...දාහනයෙන් පසු ශේෂ වූ ... පිළිබඳව ධර්ම ග්‍රන්ථ හා ...න්නේ එකිනෙකට වෙනස් වූ

...ී මහාපරිනිබ්බාන සූත්‍රය

බෙදාහැරීම පිළිබඳ මහාපරිනිබ්බාන සූත්‍රයෙහි එස සාරය ගෙන එය තවදුරටත් වර්ධනය කරන බුද්ධ වංශයේදී බුදුන් වහන්සේ පරිභෝග කළ පාත්‍රය, සැරයටිය, පොරෝනා සිවුර, අඳනා සිවුර, ඇතිරිල්ල, ධර්මකරය, කහබාන, නානකඩ, ඌර්ණරෝම ධාතුව, කසාවත, හිස වෙළුම, පා සටහන්, ආස්තරණය, ගිනිගානදණ්ඩ, දිය පෙරහන, කරගල, හිඳිකටුවද විවිධ ප්‍රදේශයන් වෙත බෙදාහරින ලද බවයි. නමුත් ජනසමාජගත අදහස වන්නේ මහාපරිනිබ්බාන සූත්‍රයෙහි එන ධාතු බෙදාහැරීම හා එම ධාතූන් නිදන් කර තැනවූ ස්තූප දහය පිළිබඳවය.

මෙසේ ධාතු නිදන් කර තැනවූ ස්තූප පිළිබඳව සැක පහළ කළ මහා කාශ්‍යප හිමියන්ගේ උපදෙස්වලට අනුව යමින් අජාසත් රජු නොබෝ දිනකින්ම ඒ ඒ රජවරුන්ට වැඩීමට ධාතූන් වහන්සේලා කිහිප නමක් තබා අනෙක් සියල්ල ගෙනවිත් (රාමග්‍රාමයට ගෙන ගිය ධාතූන් නාගයන් විසින් ආරක්ෂා කළ හෙයින් එම කොටස ලබා නොගන්නා ලදී.) එක් ස්ථානයක රහසිගතව නිදන් කළ බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. මෙසේ සුමන සමන් දෙවියන්ගේ ඉල්ලීම පරිදි හිස පිරිමැද කේශධාතු මිටක් දීමෙන් අනතුරුව එම ධාතු නිදන් කර මහියංගණ සෑය ඉදිකර ඇත. මෙරට ධාතු වන්දනයේ මුල් යුගය පිළිබඳව තවදුරටත් සොයා බලන විට අනුරාධපුර ථූපාරාමයේ බුදුන්ගේ දකුණු අකු ධාතුවද, ඌර්ණරෝම ධාතුව මිහින්තලේ සේල චෛතියේද ලලාට ධාතූන් හා කේශ ධාතූන් සේරුවිල මංගල චෛතියේද, රුවන්වැලි මහා සෑයේ ද්‍රෝණයක් ධාතූන් වහන්සේලාද, සුමන සාමණේරයන් වැඩම කරවන ලද බුදුන් පරිභෝග පාත්‍රය හා එය පිරවූ ධාතූන් මෙරට නොයෙක් දිශාවල ස්තූපයන්ගේද, බුදුන්ගේ පටි ධාතුවෙන් කොටසක් අනුරපුර ජේතවන දාගැබේද, බුද්ධ පරිභෝග මාණික්‍ය ආසනයක් නාගදීප ස්තූපයේද, බුද්ධ පරිභෝග මිණි පළඟක් හා බුද්ධ පරිභෝග ජල සාටිකාවක් කැලණි ස්තූපයේද වැඩ සිටින බව මෙරට බෞද්ධ සාහිත්‍යයේ මෙන්ම වංශකතා කරුණු ඇසුරින් ගෙනහැර දක්විය හැකියි.

**කේ. උදේනි අනුරසිරි**

...ූ ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ." - (ධම්ම පදයේ 3 වන ගාථාව)



# ලක්දිව වෙසක් උත්සව පුරාණය

ශ්‍රී ලංකාව වූ කලී ලොව ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන බෞද්ධ සංස්කෘතියෙන් පෝෂණය ලත් පෙරදිග ලෝකයේ සුවිශේෂී රාජ්‍යයකි. ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ බෞද්ධ සංස්කෘතික හර පද්ධතීන් ප්‍රමාණවත් පසුබිමක් යටතේ ස්ථාපිත වූයේ ක්‍රි.පූ. 3 වන සියවසේදී නොහොත් බුද්ධ වර්ෂ 236 දී සිදුවූ මහින්දාගමනයෙන් පසුවය. එබැවින් බුදු සමයේ බලපෑම් මත එතෙක් මෙරට පැවැති සංස්කෘතිය බෞද්ධ සංස්කෘතිය බවට පරිවර්තනය විය. තත්කාලීනව පැවැති සමාජගත අභිචාරවිධි ආදී සියල්ලක්ද අනුක්‍රමයෙන් වෙනස් මගකට අවතීර්ණ විය.

බෞද්ධ ජීවන ප්‍රතිපදා මාර්ගයට අනුගත වූ ජනතාව ආගමික උත්සව පැවැත්වීම කෙරෙහිද වැඩි රුචකත්වයක් දක්වූහ. එබැවින් අවිහිංසාව, සද්ධාව, භක්තිය හා බුද්ධිය පදනම් කරගත් ආගමික උත්සව රැසක්ද ඒ හා සමගම ආරම්භ විය. මෙම පූජෝත්සවයන් තුළින් අපේක්ෂිත පරමාර්ථය වූයේ විනෝදය සැපයීමත්, ආගමික හැඟීම් තෘප්තිමත් කිරීමත්ය. අනුක්‍රමයෙන් සංඛ්‍යාත්මකව වැඩි දියුණු වී ගිය මෙබඳු උත්සව වසර පුරාම මහත් හරසරින් පවත්වන තත්ත්වයක් පෙන්නුම් කෙරිණි. අනුරාධපුර යුගයේ පටන්ම ක්‍රමවත් පදනමක් යටතේ ඇරඹී මෙම උත්සව ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ තදින්ම මුල් බැස ගත්තේ ඒවායෙහි පවත්නා උසස් ආගමික, දාර්ශනික හා සංස්කෘතික වටිනාකම් නිසාය.

මේවා අතර පාරම්පරික රාජ්‍ය චාරිත්‍රයක් වන වෙසක් උත්සවය ශ්‍රී ලාංකේය බෞද්ධයනට අන් හැම උත්සවයකටම වඩා වැදගත්ය. සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය, බුදුවීම හා පිරිනිවීම යන අවස්ථාත්‍රය සිහිකිරීම වස් මැයි මාසයේදී මෙම වෙසක් උත්සවය පැවැත්වෙයි. වෙසක් මඟුල අති පුරාණ බෞද්ධ උත්සවයක් බවත්, ආදි කාලයේ පටන් ඉන්දියාවෙහි පවා පැවැත්වුණු බවත්, චීන ජාතික පාහියන් හිමියන්ගේ දේශාටන චාරිකාවලින් හෙළි වෙයි.

පුරාතන ශ්‍රී ලංකාවේ පැවැති වෙසක් උත්සවයක් පිළිබඳ ප්‍රථම වාර්තාව මහාවංශයෙහි හමුවන්නේ දුටුගැමුණු (ක්‍රි.පූ. 107-71) රාජ්‍ය සමයේදීය. දුටුගැමුණු රජු වෙසක් උත්සව විසි හතක් පැවැත්වූ වග එහි කියවෙයි. ඓතිහාසික ලිඛිත වාර්තා නොමැති වුවද වෙසක් උත්සවය එයට කලින්ද පැවැත්වුණු බව විශ්වාස කළ හැකිය. දේවානම්පියතිස්ස රජු වෙසක් උත්සවය සිදු කරන්නට ඇතැයි පිළිගත හැකිය. එබැවින් බෞද්ධ ලංකාවේ වීරයා වූ දුටුගැමුණු රජු වෙසක් උත්සවය යළි පිහිටුවා පෙරටත් වඩා විචිත්‍ර අන්දමින් පැවැත්වූ බව සිතීම යුක්ති සහගතය. දුටුගැමුණු රජුගෙන් පසු තවත් බොහෝ රජවරු වෙසක් උත්සවය අඛණ්ඩව පැවැත්වූහ. භාතිය රජු (ක්‍රි.ව. 38-67 වෙසක් උත්සව විසි අටක් සිදු කළේය. බුද්ධ රූපය තනා රථයක තැන්පත් කොට වීථි සංචාරය කරමින් පැවැත්වූ මෙම උත්සවයේදී දුගී මගී යාචකාදීන්ට කෑම් බීම් දීමේ සිරිතද පැවතිණි. වසභ රජුද (ක්‍රි.ව. 127-171) ඔටුනු පලන් වර්ෂයේ පටන්ම පිළිවෙළින් වෙසක් උත්සව විසි හතරක්

"නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය"

කරවීය. වෝහාරතිස්ස රජුද (ක්‍රි.ව. 269-291) වෙසක් උත්සවය සිදුකොට ලක්දිව සියලු භික්ෂූන්ට තුන් සිවුරු පිදීය. එමතු නොව ගෝඨාභය රජුද (ක්‍රි.ව. 323-333) ජෙට්ඨතිස්ස රජුද (ක්‍රි.ව. 611-617), දල්ල මොග්ගල්ලාන රජුද (ක්‍රි.ව. 851-885) දෙවන සේන රජුද රටවාසීන් හා එක්ව මහත් හරසරින් වෙසක් උත්සවය පැවැත්වූ බව සඳහන්ව තිබේ.

වෙසක් උත්සවය රාජ්‍යානුග්‍රහය මත වර්ෂයක් පාසාම අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීම කෙරෙහි පූර්වෝක්ත රජවරුන් උත්සාහ ගෙන ඇත. මේ අනුව රාජ්‍ය භාණ්ඩාගාරයෙන් මුදල් විශාල ප්‍රමාණයක්ද වෙසක් උත්සවය සඳහා වෙන් කෙරිණි. රාජ්‍ය චාරිත්‍රයක් ලෙස සෑම රජ කෙනකුගේම අනිවාර්ය ධර්මතාවක් වූ මෙය පොළොන්නරු යුගය වන විට තව තවත් දියුණුවට පත්විය. දඹදෙණි යුගයේ පැවැති ඉතා චමත්කාරජනක වෙසක් උත්සවයක් පිළිබඳ වාර්තාවක් ''පූජාවලිය'' තුළින් හමුවෙයි. ඒ මෙසේය.

''ඒ දවස් මේසරාජයාණන් හස්තිරූප ව්‍යාජයෙන් බුදු මඟුලට බැස මිහි මඬලෙහි ඇවිදිනා සේ ඒ ඒ දිග්හි යන්ත්‍ර බලයෙන් ඇවිදිනා හස්තිරූප පංක්තීන් හා පූජා ලෝලීන් දිවු සමුද්‍ර රාජ්‍යගේ මහ රළ පෙළ සේ ඒ ඒ දිග්හි යන්ත්‍ර බලයෙන් දිවන අශ්ව රූප පංක්තීන් හා බුදුන්ගේ මහා මංගල්‍යයෙහි අලංකෘති වූ පූජාවෙන් වෙහෙර සරසා සහස් සුවහස් ගණන් සංඝයා හා මුළු ලක්දිව සියලු මනුස්‍ය සේනා රැස්කොට වෙහෙර සිසාරා ගවු ගවු මානයෙහි පූජා පෙළහරින් සිටගත් මනුෂ්‍ය සේනාවම අතුරු නොදී සිටිනා සේ නියෝග කොට...''

මෙම වෙසක් උත්සවය සිදු කරනුයේ දෙවැනි පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ (ක්‍රි.ව. 1250-1285) මූලිකත්වයෙනි. ඒ තුළින් වෙසක් උත්සවයක තිබිය යුතු සියලුම අංගෝපාංග ප්‍රකාශ වෙයි. එබැවින් මෙය පුරාතනයේ පැවැති වෙසක් උත්සවයක නියම ස්වරූපය යැයි නියත වශයෙන්ම පැවසිය හැකිය. මෙහි ''බුදු මඟුලට බැස'' යනුවෙන් සඳහන්ව ඇති බැවින් වෙසක් උත්සවය සඳහා ''බුදු මඟුල'' යන්න යොදා ඇති බැව් පැහැදිලිය.

නුවර යුගයේ මෙරට පැවැති උත්සව හතරක් ගැන සඳහන් වන අතර එහි පළමුවැන්න වෙසක් උළෙල ලෙස දක්වා ඇත. තවද වෙසක් උත්සවය පැවැත්විය යුතු ආකාරය දක්වමින් සම්මත නීති මාලාවක්ද එකල පැවැති බව මහාවංශයෙන් තහවුරු වෙයි. වෙසක් උත්සවය ආරම්භ කළ යුත්තේ කෙසේද? ආරම්භ කරන්නේ කුමකින්ද? යනු එම නීති මාලාවට අන්තර්ගත වී තිබෙන්නට ඇතැයි විශ්වාස කළ හැකිය.

කෝට්ටේ යුගයෙහි කළ වෙසක් උත්සව ගැන කරුණු විරලය. බුද්ධ පූජා පැවැත්වූ රජවරුන් රාශියක් ගැන සඳහන් වෙතත් ඒවා වෙසක් උත්සව දැයි නිර්ණය කිරීම අපහසුය. කොළඹ යුගයේදී ඉතා විචිත්‍ර අන්දමින් වෙසක් උත්සවය සිදු කෙරිණි. මේ තාක් ලංකාවෙහි වාර්ෂික වෙසක් උත්සවය සිදු



කෙරෙයි. වෙසක් පොහොය ද සිද්ධස්ථාන වැඳීම සඳහා වන්දනාවේ යන සැහැදෑවතුන් උදෙසා සංග්‍රහ කිරීම පිණිස යම් යම් පුද්ගලයෝ සමිති වශයෙන් සංවිධානය වී රටපුරා දන්සැල් පවත්වති. තවද මෙකල සිදු කෙරෙන වෙසක් උත්සවයන්හිදී ''වෙසක් තොරණ'' හා ''වෙසක් පහන් කූඩු'' කෙරෙහිද ඉතා උසස් ස්ථානයක් හිමි වෙයි.

**පූජ්‍ය ඌරුගමුවේ අස්සජී හිමි**

"තමාගේ තරමට වඩා උඩඟුව කටයුතු කිරීමෙන් පිරිහේ - විනීල ජාතකය"



# උපසම්පදාව යනු කුමක්ද ?

මහනුවර රාජධානි සමය වන විට ආර්ථික, දේශපාලනික ආදී විවිධ හේතු නිසා ශාසනය පරිහානියට පත්ව තිබුණි. කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස වැලිවිට සරණංකර මාහිමියන්ගේ මහඟු උත්සහයෙන් ස්‍යාමෝපසම්පදාව පිහිටුවීමත් සමඟ එම රජතුමාගේ ඉල්ලීම පරිදි සෑම වර්ෂයක ම වෙසක් පුර පසළොස්වක පොහොය දිනයේ සිට පොසොන් පුර පසළොස්වක පොහොය දිනය අතර මසක කාලය තුළ වාර්ෂිකව අස්ගිරි මල්වතු උභය මහා විහාරයෙහි මෙම උපසම්පදා විනය කර්මය සිදුකරනු ලැබේ. මේ වර්ෂයේ ද මෙම වෙසක් පුර පසළොස්වක පොහොය දිනයෙන් උභය මහා විහාරයෙහි උපසම්පදා විනය කර්ම ආරම්භ කෙරෙන බැවින් එහි ඇති ශාසනික වැදගත්කම විමසා බැලීම මෙම ලිපියේ අරමුණයි.

බෞද්ධ සම්ප්‍රදාය තුළ ගිහිගෙයින් නික්ම නිර්වාණ ගාමී ප්‍රතිපදාවට පත්වන තැනැත්තා පැවිද්ද හා උපසම්පදාව ලැබිය යුතුය. පැවිද්ද හෙවත් ''පබ්බජ්ජාව'' යනු අගාරික ප්‍රතිපදාවෙන් මිදී අනගාරික ප්‍රතිපදාවට පත්වීමේ දී භික්ෂුත්වය ලැබීමට පෙර ඒ සඳහා කායික මානසික හැඩගැස්මක් ඇතිකරගන්නා කාලයයි. සාමණේර පැවිද්ද මැනවින් ආරක්ෂා කළ පසු උපසම්පදා ශීලයෙහි පිහිටිය හැකිය.

උප + සං + √පද් ධාතු මූලයෙන් උපසම්පදාව යන වචනය නිෂ්පන්න වේ. එහි අදහස නිසි තැනට හෙවත් උසස් තැනට මනාව පත්වීම යන්නයි. එනම් සාමණේර භූමියෙන් උසස් තැනට පත්වීම යනුයි. සාමණේර සීලයෙන් උසස් සීලයට පත්වීම හෙවත් අධි සීලයට ඔසවා තැබීම මෙයින් අදහස් කෙරේ.

අධිශීලය යනු නිර්වාණගාමී ප්‍රතිපදාවට අතිශයින් හිතකර වූ ශීලයයි. මේ නිසාම පාලි අටුවාවෙහි ''උපසම්පදති නිප්ඵාදනා'' කුසලයන්ගේ නිපදවීම ''අත්තනෝ සන්තානේ සම්පාදනාය'' සිතෙහි කුසල් උපදවා ගැනීම යනාදී ලෙස අර්ථ දක්වා ඇත. පරම නිෂ්ඨාව කරා යොමුවන භික්ෂුව කුසල් උපදවා ගැනීම සඳහා වීර්යය වැඩිය යුතුය.

එනිසා ගිහිගෙයින් මිදුණු තැනැත්තා පරම නිෂ්ඨාව කරා යොමුවන තුරු යම් කිසි ප්‍රතිපදාවක් පුගුණ කළ යුතුය. මේ නිසා සාමණේර පැවිද්ද තුළ මූලික පුහුණුව ලැබිය යුතු වේ. මේ කාල සීමාව තුළ තමා තුළ ඇති ශික්ෂාපද බණ්ඩණය වුවහොත් නැවත පාරිශුද්ධියක් ඇතිකර ගනිමින් නියම භික්ෂුත්වයට පුහුණුවක් ලැබිය යුතුය. පූර්ණ භික්ෂුත්වයට පමුණුවන ක්‍රම 08 කි.

01. ඒහි භික්ඛු උපසම්පදාව
02. සරණාගමන උපසම්පදාව
03. ඕවාද පටිග්ගහණ උපසම්පදාව
04. පඤ්හ ව්‍යාකරණ උපසම්පදාව
05. ගරු ධම්මපටිග්ගහන උපසම්පදාව
06. දූතේන උපසම්පදාව
07. අට්ඨවාචික උපසම්පදාව
08. ඤත්තිචතුත්ථ කම්ම උපසම්පදාව


මෙයින් ගරු ධම්මපටිග්ගහන, දූතේන, අට්ඨවාචික යන උපසම්පදා ක්‍රම තුන භික්ෂුනීන් අරභයා පනවන ලදි. මුලින් දැක්වූ අනෙක් උපසම්පදා ක්‍රම හතර ම බුදුරදුන් වෙතින්ම ම ලැබිය යුතුය. සංඝයා වෙතින් ලැබිය යුතු උපසම්පදාව ඤත්තිචතුත්ථ කම්ම උපසම්පදාවයි. වර්තමානයේ ශේෂව ඇත්තේ ද මෙම උපසම්පදා ක්‍රමය පමණි.

සාමණේර පැවිද්ද තුළින් මනා පරිචයක් ලබා මෙම උපදම්පදාවට අවැසි මූලික කරුණු සපුරාගත් පසු අධිශීලයෙහි පිහිටවිය හැකිය. ඒ සඳහා උපාධ්‍යයන් වහන්සේ නමක් සිටිය යුතුය.

''උපජ්ඣායො මෙ භන්තෙ හො හි''

ස්වාමීනි මට උපාධ්‍යායවනු මැනවි යනුවෙන් ඉල්ලා සිටිනුයේ ඒ නිසයි. උපාධ්‍යාය ග්‍රහණය වූ පසු සුදුසු නුසුදුසුකම් විමසා බැලීමක් සිදු කළ යුතුය. විසිවයස් සපුරා තිබීම, පා සිවුරු සපුරා තිබීම ඉතා වැදගත් වෙයි. තම භික්ෂුත්වය මැනවින් පවත්වාගෙන යාමට බාධා වන කුෂ්ට, ගඩු ආදී රෝගාබාධ තිබේදැයි විමසා බැලීම තුළින් අපේක්ෂා කරනුයේ කායික නිරෝගීතාව මානසික ඒකාග්‍රතාව ඇති කර ගැනීමට අතිශයින් වැදගත් නිසයි. විසිවයස් සපිරීම, මනුෂ්‍යයෙක් වීම, පුරුෂයෙක් වීම, විවාහ බන්ධනාදියෙන් මිදුනු කෙනෙක් වීම, ණයගැතියෙක් නොවීම, රාජභටයෙක් නොවීම, මව්පියන්ගෙන් අවසර ලබා තිබීම ආදිය මේ සඳහා මූලික සුදුසුකම් අතර වේ. මෙකී සුදුසුකම් සපුරාගත් පසු සංඝ මධ්‍යයේ උපසම්පදාව ඇයද සිටිය යුතුයි.

28 පිටුවට ▶



# මෙත් වැඩුමයි
## වෙර නැසුමට එකම මග
## සිත් සිහි කරනු
## වෙන දහමක් නොමැති වග

### ධම්ම පදයෙන් දහම් ඔවාදන් - අංක 5

"නහී වෙරෙන වෙරානී - සම්මන් තීධ කුදචනං
අවෙරෙනච සම්මන්ති - එස ධම්මො සනාත්තනො"

- ධම්මපදය - යමක වග්ගය

මේ ලෝකයේ වෛරයෙන් වෛරයෝ කිසිදු නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සන්සිඳෙත්. මෙය සදාතනික ධර්මතාවකි.

පුද්ගලයකුගේ සිතේ වෛරය වැඩීමට සහ නොවැඩීමට හේතුවන කරුණු මොනවාදැයි පසුගිය කලාප දෙකේ ධම්මපද දහම් ඔවදනින් අවධානයට ලක් කෙරුණි. එසේ වැඩෙන වෛරය සන්සිඳුවා ගන්නේ කෙසේදැයි ඉහත ධම්මපද ගාථාවෙන් පෙන්වා දෙයි. අවෛරයෙන් හෙවත් වෛර නොකිරීමෙන් පමණක්ම වෛරය සන්සිඳෙන බව මෙයින් කියවෙයි.

බැලූ බැල්මට මෙය අතිශය සරල ක්‍රමයක් බව ඔබට වැටහෙනු ඇත. එහෙත් එය එතරම් සරල නැත. ඔබට යමෙක් අවැඩක් කළ විට ඒ ගැන නැවත නැවත නොසිතන කල්හි ඔහු කෙරෙහි වූ ඔබේ වෛරය නොවැඩෙන බව සැබෑය. එය ප්‍රමාණවත් නැත. ඔබ ඒ සඳහා අවෛරය උපදවා ගත යුතුය. මෙහි අවෛරය යනු මෛත්‍රියයි. ඒ අනුව ඉහත ගාථාවෙන් පහදා දෙන්නේ වෛරය සන්සිඳුවාලීම සඳහා ඔබ මෛත්‍රී සහගත විය යුතු බවයි. මෛත්‍රිය හැරෙන්නට වෛරය සන්සිඳුවාලීමට අන්කිසිවක් ලොව නොමැත.

මෛත්‍රිය යනු මිතුරු බවයි

"මිත්තස්ස භාවං මෙත්තා"

ඔබේ මිතුරා කෙරෙහි දක්වන ආකල්පය ඔබට අවැඩ සිදුකළ කෙනා කෙරෙහි පතුරුවාලීම ඔබ කළ යුතුව ඇත. ඔබ, ඔබේ මිතුරාට ප්‍රාර්ථනා කරන්නේ යහපතක්මය. විටෙක එය ඔහුගේ දුක් නැතිකර ගැනීම සඳහාය. තවත් විටෙක එය ඔහුගේ නිරෝගී භාවය උදෙසාය. තවත් විටක ඔහුගේ සුවපත් භාවය උදෙසාය. ඔබට අවැඩ සිදුකළ කෙනා කෙරෙහි මෙම මෛත්‍රී ආකල්ප පතුරුවන විට ඔබ සිත තුළ වෛරය සන්සිඳේ. වෛරයෙන් කෙලෙසීමට ගිය ඔබේ සිත මෛත්‍රියෙන් පිරිසිදු වී ප්‍රසන්න සිතක්, ලස්සන සිතක් ඔබට හිමිවේ.

එපමණක් නොව වෛරය නිසා අත්වන්නට ගිය කිසිදු හානියක්, විපතක් ඔබට නැත. මෛත්‍රියේ ආශිර්වාදය ඔබට ලැබී මෙලොව ඔබ යහපත්, පින්වත් පුද්ගලයකු ලෙස සමාජය විසින් පිළිගනු ඇත. මෙලොව සිටින ජයග්‍රාහීම පුද්ගලයා ඔබ වනු ඇත.

ඔබ දන්නවාද? ඔබ මෛත්‍රී සහගත කෙනකු වූ විට ආනිශංස 11 ක් ඔබට ලැබෙන බව? මෙත්තානිසංස සූත්‍රයේදී ඒවා දක්වා ඇත්තේ මෙසේය.

සුඛං සුපති - සුවසේ නිදයි

සුඛං පටි බුජ්ඣති - සුවසේ අවදි වෙයි

න පාපකං සුපිනං පස්සති - නපුරු පාප සිහින නොපෙනේ

මනුස්සානං පියෝ හෝති - මිනිස්සු ප්‍රිය වේ

අමනුස්සානං පියෝ හෝති - අමනුස්සයෝ ප්‍රිය වේ

දේවතා රක්ඛන්ති - දෙවියෝ රකිති

නාස අග්ගිවා විසංවා ඛමති - ගින්නෙන්, විෂෙන්, ආයුධවලින් විනාශ නොවේ

තුවටං චිත්තං සමාධියති - සිත සමාධිගත වේ

මුඛවණ්ණෝ විප්පසීදති - මුහුණ පැහැපත් වේ


අසම්මුළ්හෝ කාලං කරෝති - සිහියෙන් කළුරිය කිරීමට හැකිවේ

උත්තරිං අප්පටි විජ්ඣන්තෝ බ්‍රහ්ම ලෝකෝපගෝ හෝති - මරණින් මතු බ්‍රහ්ම ලෝකයේ උපදී

එසේනම් ඔබ කළ යුත්තේ ඔබට කුමන හෝ අවැඩක් සිදුකරන කෙනකු වී නම් ඔහු කෙරෙහි වෛරය නූපදවා මෛත්‍රිය (මිතුරු බව) උපදවා ගැනීමයි.

ගුරු උපදේශක **ලිත් අබේසේකර**

"අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ළඟාවෙති - අපණ්ණක ජාතකය"



## අස්ගිරිය මහාවිහාර පාර්ශවයේ 33 වන අනුනායක පදවියෙන් ශාස්ත්‍රපති පූජ්‍ය ආණමඩුවේ සද්ධර්ම කීර්ති ශ්‍රී රතනපාල බුද්ධරක්ඛිත ධම්මදස්සාභිධාන මාහිමි අනුනායක පදවියෙන් පිදුම් ලබති


**මහනුවර** අස්ගිරිය මහාවිහාර පාර්ශවයේ 33 වන අනුනායක පදවියට අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය අස්ගිරිය මහාවිහාරයීය විංශද්වර්ගික කාරක මහා සංඝසභාවේ ප්‍රධාන ලේඛකාධිකාරී අධ්‍යාපනපති ආණමඩුවේ සද්ධර්ම කීර්ති ශ්‍රී රතනපාල බුද්ධරක්ඛිත ධම්මදස්සාභිධාන වයඹ - කුරුණෑගල ඇත්කඳ රජමහා විහාරාධිපතීන් වහන්සේ අස්ගිරිය මහාවිහාරයීය මංගල උපෝෂථාගාරයේදී පවත්වන ලද කාරක මහා සංඝ සභා රැස්වීමේදී ඒකඡන්දයෙන් පත්කර ගෙන ඇත.

අපවත් වී වදාළ උඩුගම රතනපාල බුද්ධරක්ඛිත මාහිමිගේ සහ ජ්‍යෙෂ්ඨ කාරක සභික වඳුරාගල රතනජෝති නාහිමිගේ ආචාර්යත්වයෙන් පැවිදි බිමට ඇතුලත්ව වර්ෂ 1979-05-20 වෙන දින අස්ගිරිය මංගල උපෝෂථාගාරයේ දී උපසම්පදාව ලබා පේරාදෙණිය විශ්ව විද්‍යාලය, කැළණිය විශ්ව විද්‍යාලය කේන්ද්‍රස්ථාන කරගෙන උසස් අධ්‍යාපනයේ ශාස්ත්‍රපති, අධ්‍යාපන ඩිප්ලෝමා යන උපාධි ලබා මහනුවර විද්‍යාර්ථ විද්‍යාලයේ ආචාර්ය ධූරයට පත්වීමෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවයට සම්බන්ධ වූ ධම්මදස්සි අනුනායක හිමියෝ, හාරිස්පත්තුව, මහනුවර ශාසන ආරක්ෂක බල මණ්ඩල වල විවිධ ශාසනික තනතුරු දරමින් දහම් පාසල් අධ්‍යාපනය දියුණු කිරීමට මුල්තැනක් ගෙන ක්‍රියා කළ ධර්මධර, විනයධර, බහුශ්‍රැත පඬිරුවනකි. වසර දොළහකට අධික කාලයක් අනුරාධපුර බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වශයෙන්ද දැනට සේවය කරන ධම්මදස්සී අනුනායක හිමියෝ නිට්ටඹුව සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ කථිකාචාර්යවරයෙකු වශයෙන් ද සේවය කර ඇත.

වර්ෂ 2002-07-23 වෙනි දින අස්ගිරිය මහාවිහාර කාරක මහා සංඝ සභාවේ කාරක පදවියට උඩුගම ශ්‍රී රතනපාල බුද්ධරක්ඛිත මාහිමි විසින් පත් කළ අතර වර්ෂ 2008-03-01 දින අස්ගිරිය මහාවිහාර කාරක මහා සංඝ සභාවේ ප්‍රධාන ලේඛකාධිකාරී ධූරයට පත්වූ අනුනායක ධම්මදස්සි නාහිමි වර්ෂ 2010 දෙසැම්බර් 11 වෙනි දින කුරුණෑගල ඇත්කඳ රජමහා විහාරාධිපති ධූරයටත්, වර්ෂ 2010 ශ්‍රී දළදා සමිඳු තේවාව සඳහාත් පත්විය. ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා ආසියා, යුරෝපා රටවල් පහළොවකට අධික සංඛ්‍යාවක නිරන්තරව සිදුකර ඇති ලෝක ධර්ම ප්‍රචාරක සේවය ද ශ්‍රේෂ්ඨය. ලෝක ශාසනික සේවයේ, ධර්මප්‍රචාරයට මුල්තැනක් දෙන ධර්මශාස්ත්‍රීය ග්‍රන්ථ රැසක් සංස්කරණය කර ඒ තුළින් ශාසනික හා පුරාවිද්‍යාත්මක වටිනාකම, බෞද්ධ සමාජයට ඉදිරිපත් කර ඇත. ධම්මදස්සී අනුනායක හිමිපාණන්ට කටුගස්තොට ලියන්ගස්තැන්න පුරාණ විහාරය. ශාසනික හා සමාජ සත්කාර සේවා අංශයෙන් අමතක කළ නොහැකි ස්ථානයකි. වසර තිහකට ඉහත දී ලියන්ගස්තැන්න පුරාණ විහාරස්ථානයේ අප දුටු දර්ශනය අද එහි දක්නට නැත. ලියන්ගස්තැන්න පුරාණ විහාරය අද අංග සම්පූර්ණ සිද්ධස්ථානයකි. සමාජ සේවා මධ්‍යස්ථානයකි. මෙහි ගෞරවය අභිනව අනුනායක හිමිපාණන්ට හිමි වන අතර ආණමඩුවේ ධම්මදස්සි අනුනායක හිමිපාණන්ට මෙම පදවියේ සියලු කටයුතු සමගින් රට දැය සමය වෙනුවෙන් උත්කෘෂ්ඨ සේවාවක් සිදු කිරීමට ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

### අස්ගිරි මහාවිහාරයීය කාරක සංඝ සභාවේ ලේඛකාධිකාරි ධූරයට

## ශාස්ත්‍රපති පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමි පත්වේ



**මහනුවර** අස්ගිරිය මහාවිහාරයීය විංශද්වර්ගික කාරක මහා සංඝසභාවේ කාරක සභික ශාස්ත්‍රපති මැදගම ධම්මානන්ද හිමි අස්ගිරිය මහාවිහාරයීය කාරක මහා සංඝ සභාවේ ලේඛකාධිකාරී තනතුරට පත්වී ඇත.

හැට දශකයේ අස්ගිරිය මහාවිහාරයීය කාරක මහා සංඝ සභාවේ ලේඛකාධිකාරී ධූරය හෙබවූ පණ්ඩිත යටවත්තේ ධම්මකන්ද නාහිමිගේ ආචාර්යත්වයෙන් 1968-03-15 වෙනි දින යටවත්තෝ සංඝ පරපුරෙන් පැවැදි ජීවිතයට ඇතුලත්ව වර්ෂ 1975 ජූනි 19 වෙනි දින අස්ගිරිය ඓතිහාසික මංගල උපෝෂථාගාරයේදී උපසම්පදාව ලබාගත් පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමි මාදන්වල ශ්‍රී ධර්මෝදය, මාතලේ ධර්මරාජ, හුණුපිටියේ ඥානේස්වර යන පිරිවෙන් වලින් මූලික ධර්ම අධ්‍යාපනය ලබා 1977 කැළණිය විශ්ව විද්‍යාලයෙන් බෞද්ධ දර්ශනය, ජර්මන් භාෂාව විෂයන්ගෙන් ගෞරව පංතියෙන් සමත්ව, 1991 දී තායිවානයේ ලින්සෝන් බුඩිස්ට් ආයතනයෙන් මහායාන බෞද්ධ සම්ප්‍රදාය සම්බන්ධව ආචාර්ය උපාධියත්, 1996 ඇමෙරිකා ටෙක්සාස් බෞද්ධ පදනමෙන් ආචාර්ය උපාධියත්, ප්‍රංශයේ සෝබෝන් විශ්ව විද්‍යාලයෙන් වසරක අධ්‍යාපනයක් හිමිකරගෙන ඇත. ඇමෙරිකා ටෙක්සාස් විද්‍යාලයේ පරිගණක තාක්ෂණ ඩිප්ලෝමාධාරියෙකි.

කොළඹ රාජකීය, මහනුවර ධර්මරාජ සහ පැරිස් නුවර සිංහල යන විද්‍යාලවල ආචාර්යවරයෙකු වශයෙන් සේවය කර ඇති ධම්මානන්ද හිමි අනුරාධපුර භික්ෂු විශ්ව විද්‍යාලයේ උත්තරීතර සභාවේ සාමාජිකයෙකි. සමස්ථ ලංකා ශාසන ආරක්ෂක බල මණ්ඩලයේ අනුශාසක මෙන්ම මහනුවර දිස්ත්‍රික් ශාසන ආරක්ෂක බල මණ්ඩලයේ ද සභාපති වරයෙකි. ලෝක බෞද්ධ සම්මේලනයේ සහ මහනුවර ජයග්‍රහනය ශ්‍රී ලංකා සංවිධානයේ සභාපති වශයෙන් සේවය කරන ධම්මානන්ද හිමි බෞද්ධ ග්‍රන්ථ රැසක් ද සංස්කරණය කර ඇත.

**කේ. බණ්ඩාරනායක**



# ගුත්තිල ජාතක කථාවෙන් හෙළිවන නපුරු දුදනන්ගේ ගුරු ද්‍රෝහීකම

මහාකාරුණික වූ තිලොවට තිලක වූ තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ, වේළුවනාරාමයේ වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මෙම ගුත්තිල ජාතක කථාව දේශනා කොට වදාළ සේක.

එක් දිනෙක භික්ෂූන් වහන්සේලා දේවදත්ත තෙරුන් වහන්සේ අමතා, ඔබ සර්වඥයන් වහන්සේගෙන් ත්‍රිපිටක ධර්මය උගන්නා ලද්දෙහිය. චතුතථ්ධ්‍යානය ලබන ලද්දෙහිය. එසේ උපකාරී වූ ඔබට ගුරු වූ බුදුරජාණන් වහන්සේ ඔබ හා සමාන කොට සලකා විපරීතව ක්‍රියාකරන්නේ කුමක් නිසාදැයි විමසූහ. එවිට දෙව්වත් තෙරුන් මට සර්වඥයන් වහන්සේගෙන් කවර ලාභ සත්කාරයක් ලැබුණේ ද? මමම ත්‍රිපිටකය දැරීමි. ධ්‍යාන උපදවා ගතිමි. සර්වඥයන් වහන්සේ මට කුමක් කර ඇත්දැයි ඇසීය. දෙව්දත් තෙරගේ මෙම අකෘතඥකම පිළිබඳව භික්ෂූන් වහන්සේ ධම්සභා මණ්ඩපයේ කතිකා කරමින් සිටින විට, සර්වඥයන් වහන්සේ එහි වැඩම කළ සේක. මහණෙනි, මා මෙහි එන්නට පෙරාතුව කුමන කථාවක යෙදී සිටියාහුදැයි විචාල සේක. එකල්හි දෙව්දත් තෙරුන්ගේ කථාව සැල කළ

"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්ද්‍රගුත්ත ජාතකය"


අවස්ථාවෙහි දැන් පමණක් නොව ඉහත ආත්ම භවයන්හි ද ඔහු ගුරුවරුන්ට අවැඩ පිණිස කටයුතු කළැයි දක්වා වදාළ සේක.

ඒ අතීත කථාව කෙසේද යත්, යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍ය කරන කාලයෙහි බෝධිසත්වයන් වහන්සේ ගාන්ධර්ව නම් කුලයක ඉපිද වැඩිවියට පැමිණ ගාන්ධර්ව ශිල්පය නිම කොට ගුත්තිල ගාන්ධර්වයා යන නමින් දඹදිව ප්‍රසිද්ධව සිටියහ. එතුමා අන්ධ වූ දෙමාපියන් රක්නාහ. එකල බරණැස් නුවර සිට උදේනි නුවරට වෙළඳාම පිණිස පැමිණි වෙළෙන්දෝ හිස් සෝදා නා කා බී අපිට ගී කියන්ට වීණා ගායනා කරන්ට දන්නා කෙනෙකු කැඳවාගෙන එන්නැයි දැන්වූහ. එකී ඉල්ලීමට අනුව එගම ගාන්ධර්වයන්ට නායක වූ මූසිල නම් ගාන්ධර්වයා කැඳවාගෙන ආහ. ඔහු එතනට අවුත් වෙළඳුන්ට නටා ගී ගායනා කොට දැක්වුහ. ඒ අසා වෙළෙන්දෝ සතුටු නොවූහ. එවිට මූසිලයා මධ්‍යම කොට වීණා වාදනය කළහ. එවිටත් මදක් හෝ සතුටු නොවූයෙන් උත්තම කොට වීණා වාදනය කරන්නට පටන් ගත්තේය. එවිටත් කිසි කෙනෙකු සතුටු නොවූහ. එය දුටු මූසිලයා මොවුන් කිසි විශේෂයක් නොදන්නා අය වෙතැයි සිතා නපුරුව ගායනා කළහ. එවේලෙහි කිසිකෙනෙකු සතුටු නොවූහ. මා මෙසේ ගායනා කරද්දිත් බැණ නොනැගී සිටින්නේ කිසියම් විශේෂත්වයක් නොදන්නා බැවින් ද, එසේත් නැත්නම් මට වඩා ගාන්ධර්වයෙක් දුටුවෙහි ද, එබස් ඇසූ මනුෂ්‍යයෝ එම්බල මූසිලය, ගුත්තිල නම් ගාන්ධර්වයාගේ වීණා වාදනය අසා පුරුදු අපට තොපගේ වීණා නාදය උණපත්තක් ගාන්නා වැනියි කී කල්හි මූසිලයා එසේ නම් ඔබ හැම බරණැස් නුවර යන කල මාත් කැඳවාගෙන යන්නැයි ඉල්ලා සිටියේය. වෙළෙන්දෝ ද මූසිලයා කැඳවාගෙන ගොස් ගුත්තිල ගාන්ධර්වයාගේ නිවස පෙන්වූහ.

එතැන් සිට මූසිල ගාන්ධර්වයා ගුත්තිල ගාන්ධර්වයාගේ ගෙට යන විට එතුමන් එහි සිටියේ නැත. වටපිට බැලූ මූසිලයා ගුත්තිල පඬිතුමාගේ වීණාව තිබෙණු දැක එය රැගෙන වීණා වාදනය කරන්නට පටන් ගත්තේය. ඒ හඬ ඇසූ අන්ධ දෙමාපිය දෙදෙනා අපගේ දරුවාගේ වීණාව මීයන් විසින් කපන සැටියැයි පැවසූහ. මෙය ඇසූ මූසිල ගාන්ධර්වයා අන්ධ දෙමාපිය දෙදෙනාට වැඳ ගුත්තිල පඬිතුමා කොහේදැයි විචාලහ. අපේ පුතණුවන් දැන් එනු ඇතැයි දෙමාපියෝ පැවසූහ. එතෙක් අසුන් ගන්නැයි කීහ. ඒ අතර බෝධිසත්වයෝ නිවසට පැමිණියහ. එවිට මූසිල බෝධිසත්වයන්ට වැඳ ශිල්පය ලබා දෙන්නැයි ආයාචනා කළහ. එවිට ශාරීරික ලක්ෂණ දන්නා ගුත්තිල පඬිතුමා මේ අසත්පුරුෂයෙක් යැයි දැනගෙන තොපට මා දෙන ශිල්පයක් නොමැත කියා යන්නට අණ කළේය. එවිට මූසිලයාත් බෝධිසත්වයන් නොකැමති වුවත් දෙමාපියන් සිත් හරවාගෙන ඔවුන් ලවා මට ශිල්ප ලබා දෙන්නැයි යළිත් යාඥා කළේය. දෙමාපියෝත් ගුත්තිලට මොහුට ශිල්ප උගන්වනන්නැයි ඉල්ලා සිටියහ. දෙමාපියන්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ නොහැකි හෙයින් ගුත්තිල පඬිතුමා ආචාර්ය භාගයක් නොතබාගෙන ම ගාන්ධර්ව ශිල්පය ඉගැන්වීය.

බෝධිසත්වයෝ රජතුමන් දකින්නට යන අවස්ථාවන් හි අතවැසි මූසිලත් කැඳවාගෙන ගියාහ. මූසිලයා දුටු රජ්ජුරුවෝ මොහු කවුරුදැයි ගුත්තිල පඬිතුමන්ගෙන් විමසූ අවස්ථාවේ මේ මගේ අන්තේවාසිකයා යැයි කීහ. කල් යැමෙන් අනතුරුව රජතුමා මූසිල කෙරෙහි විශ්වාසය තැබීය. එවිට මූසිල ගුත්තිල පඬිතුමන් දැන් වයෝවෘද්ධ බැවින් රාජ්‍ය සේවය ඔහුට ලබාගනු අටියෙන් රජ්ජුරුවන්ට සේවය කරන්නට කැමති බව දැන්වීය. එසේම රාජකාරියට බඳවා ගෙන වැටුපක් නියම කර දෙන්නැයි ඉල්ලා සිටියේය. බෝධිසත්වයෝත් රජ්ජුරුවන්ට මේ බව දන්වා රජතුමනි, මාගේ අන්තේවාසිකයා රජුට සේවය කරන්නට කැමති බව දන්වා වැටුපක් නියම කර දෙන්නැයි ඉල්ලා සිටියේය. රජ්ජුරුවෝ මූසිලයාට අඩවැටුපක් ගෙවීමට එකඟ බව දැන්වූහ. එවිට මූසිල මා ද ගුත්තිල පඬිතුමා තරමටම වීණා වාදනය දන්නා හෙයින් පඩි අඩු කරන්ට කාරණා කිමදැයි විමසීය. එවිට රජතුමා දෙදෙනාටම වීණා වාදනය කොට දස්කම් පෙන්වන්නැයි දන්වා සිටියේය. මූසිල වාද කිරීමට එකඟ වූ අතර අදින් සත්දිනයකට පසු වාද කෙරෙන බවට දන්වා සිටියේය. එවිට රජතුමා ගුත්තිල ගාන්ධර්වයා හා මූසිල ශිෂ්‍යයා අදින් සත්දිනකට පසු වාද කරන බව නුවර වැසියන්ට සැලකර සිටියහ. බෝධිසත්වයෝ මා වෘද්ධ බැවින් වාදන ශක්තියෙන් අප දෙදෙනාම සරි වුවත් මොහු සමග වාද කොට පැරදීමට වඩා ජීවිතය තොර කර ගැනීම සුදුසු යැයි සිතා වාදයකට නොඑළඹ නික්ම යන බවට සිතා ගත්තේය.

බෝධිසත්වයන් වහන්සේ සත්වෙනි දවසෙහි ප්‍රාණය නසා ගැනීමට සිතා වනයට ගිය විට ශක්‍ර දේවේන්ද්‍රයන්ගේ පාණ්ඩුකම්භල ශෛලාසනය උණු වී ආචාර්යවරයන් හමුවී ඔබ කුමක් නිසා මෙහි පැමිණියේ දැයි විචාළහ. එවිට බෝධිසත්වයෝ තොප කවුරුදැයි විචාරා දෙදෙව් ලොවට අධිපති ශක්‍රයා යැයි පැවසූ විට මා හා මාගේ ශිෂ්‍යයා හෙට දින වාද පිණිස රජු සමීපයට කැඳවා ඇත. ශක්‍රයාණෙනි, මට සහය වන්නැයි ඉල්ලීය. එවිට ශක්‍ර දේවේන්ද්‍රයා ආචාර්යවරයාණෙනි, ඔබට මම උපකාරී වන්නෙමි. ඔහු හා සමග වාද කරන්නැයි දන්වා මා සංඥා කරන විට ඒ ඒ සප්ත තත කඩා දමන්නැයි දැන්වීය. ඔබ විසින් වීණා දණ්ඩ අතගාන්ට වන් කල්හි පලමුව නාද වැඩිවේ. උගේ තත් සතෙහිම නාදය අඩුවේ. ඒ අවස්ථාවට ඔබ විසින් මේ පස ඇට තුන අහසට දමනවිට නව සියයක් දිව්‍ය ස්ත්‍රීන් නටන්නාහ. මමත් එතනට එන්නෙමි. රට වැසියෝ ද දෙදෙනාගේ වාදය නැරඹීම සඳහා රැස්වූහ. ගුත්තිල පඬිතුමා තමාගේ ජාත වීණාව රැගෙන විත් නියමිත අසුනෙහි සිටියහ. මූසිල අතවැසියා ද තමන්ට පැනවූ අස්නෙහි සිටියහ. අවට බොහෝ මනුෂ්‍යයෝ බලා සිටියහ. රජ්ජුරුවෝත් රාජසභාවේ සිට වාදය නැරඹූහ. ශක්‍ර දේවේන්ද්‍රයා අහසෙහි අදෘශ්‍යමානව සිටියේය. ශක්‍රයා ආ බව බෝධිසත්වයෝ පමණක් දැන උන්නාහ. පළමුව ගුත්තිල හා මූසිල සමව වීණා වාදනය කළහ. බොහෝ දෙනා වීණා වාදනය පැ නියාව යහපතැයි කියා බොහෝ සතුටු වූහ. එවිට ශක්‍රයාගේ සංඥාවෙන් බෝධිසත්වයෝ පළමු තත සිඳූහ. එවිට පළමු නාදයටත් වඩා නාදය නැගෙන්නට විය. පළමු තත කඩනු දැක මූසිල ද තත් කැඩීය. එවිට ඔහුගේ හඬ පෙරට වඩා අඩු විය. මේ ආකාරයට බෝධිසත්වයෝ දෙවන, තුන්වන, සතරවන ආදී තත් සතම සිඳූ විට ඔහුගේ නාදය තවත් මිහිරිව නැගෙන්නට විය. මූසිලයාත් මේ ආකාරයටම තත් සතම කඩා වීණාව අතගාන්නාක් මෙන් නිශ්ශබ්ද විය. ඒ වේලාවෙහි බෝධිසත්වයෝ ශක්‍රයා දුන් පස ඇට තුනෙන් එකක් අහසට දැමූ කල්හි දිව්‍ය ස්ත්‍රීන් තුන්සියයක් පැමිණ නටන්නට වන්හ. මෙසේ පස ඇට තුනම තුන් විටක දමද්දී එක් විටක තුන්සියය බැගින් දිව්‍ය ස්ත්‍රීන් නවසියයක් පැමිණ නැටූහ. බෝසතාණන් වහන්සේ මියුරු ගීතිකා කියකියා වීනා වාදනය කළේය. එය දුටු රජ්ජුරුවන් හා නුවර වාසීන් මූසිලයා කෙරේ කිපී අමාත්‍යයන්ගේ මූණ බැලූහ. රජුගේ අදහස දැනගත් අමාත්‍යවරු තම ගුරුවරයා සමග වාද කිරීමට පැමිණි මූසිලයා අල්ලා කැට මුගුරු වලින් තලා ඉවතලූහ. රජ්ජුරුවෝ බෝසතාණන් වහන්සේ කෙරෙහි බොහෝ සතුටු



වූහ. සත්රුවන් ආදී බොහෝ ප්‍රසාද දුන්හ. නුවර වාසීහුද බෝහෝ සම්පත් දුන්හ.

ශක්‍රයා තොපගේ ගෙට වෛජයන්ත රථය එවන බවත් එහි නැගී ශක්‍ර භවනයට එන්නැයි පවසා දිව්‍ය ලෝකයට ගියේය. ශක්‍රයා දුටු දිව්‍ය ස්ත්‍රීන් දේවයන් වහන්ස, මෙපමණ වේලා කුමක් නිසා ප්‍රමාද වූයේ දැයි විචාල කල්හි ගුත්තිල ගාන්ධර්වයාගේ වීණා නාදය අසන්නට ගිය නිසාවෙනැයි පැවසීය. එවිට දිව්‍ය ස්ත්‍රීන් අපිත් වීණා නාදය අසන්නට කැමැත්තෙමුයි කීහ. එය ඇසූ ශක්‍රයා මාතලී දිව්‍ය පුත්‍රයා අත වෛජයන්ත රථය යැවූහ. බෝධිසත්වයෝ වෛජයන්ත රථයේ නැගී සක්දෙව් රජු ලඟට ගිය විට ආචාරීනි වීණා වාදනය කරන්නැයි දන්වා සිටියහ. බෝධිසත්වයෝ එවිට විජ්ජතුන් නම් මිලක් නොමැතිව විද්‍යාව නොපාන්නාහ. ඔබ විද්‍යාව දැක්වූ විට බොහෝ සම්පත් දෙමැයි කී විට සම්පත් වලින් මට කාරියක් නොමැත, දිව්‍ය ස්ත්‍රීන්ගේ පින් අසන්නට පමණක් කැමැත්තෙමැයි කීය. එවිට දිව්‍ය ස්ත්‍රීහු අප කළ පින් කියන්නෙමැයි පොරොන්දු වූහ. මනුෂ්‍යාත්ම භාවයේ දී කවර පිනක් කොට දිව්‍ය භවනේ උපන්නේ දැයි මට පවසන්නැයි දැන්වීය. එක් දිව්‍ය ස්ත්‍රියක් මා කාශ්‍යප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි රහත් නමකට පිළිසගලක් පූජා කොට දිව්‍ය සම්පත් ලදිමියි කීවාය. අනෙක් අයගෙන් ද එසේ විචාල කල්හි තවත් කෙනෙක් තමන්ගේ මනුෂ්‍ය ආත්ම භාවයේ දී මල් කළඹක් පූජා කොට දිව්‍ය ලෝකයේ උපන් බව පැවසුවාය. තවත් කෙනෙක් දාගැබකට සුවඳ පසඟුල් දී ඒ පින් බෙලෙන් දිව්‍ය ලෝකයේ උපන් බව පැවසුවාය. තවත් කෙනෙක් සුවඳ බඩුවක් දන් දී උපන් බව පැවසුවාය. තවත් කෙනෙක් මිහිරි ඵලා පල දන් දී ද, තවත් කෙනෙක් මිහිරි රස භික්ෂූන් වහන්සේට දන් දීමෙන් ද, තවත් කෙනෙක් කාශ්‍යප බුදුන්ගේ දාගැබකට සිය අතින් පසඟුල් දීමෙන් ද තවත් කෙනෙක් මංමුලාවී පැමිණි භික්ෂූන් වහන්සේ නමකට දන් දී බණ ඇසීමෙන් ද, තවත් කෙනෙක් නැවකින් යන වහන්දෑ කෙනෙකුට පැන් පිළිග ැන්වීමෙන් ද, තවත් කෙනෙක් නැදිමයිලන් ආක්‍රෝශ බිනීමේදී බැණ නොනැගී මෛත්‍රී කිරීමෙන් ද, තවත් කෙනෙත් තමා ලත් බත් කොටස බෙදා දන් දීමෙන් ද තවත් කෙනෙක් අනුන්ට වහල්වී හිඳ තමා ලත් දෙය දන් දීමෙන් ද ආදී වශයෙන් දිව්‍ය ස්ත්‍රීන් තිස්දෙදෙනෙක් තමන් දිව්‍ය ලෝකයේ ඉපදුනු ආකාරය දැක්වූහ.

බෝධිසත්වයන් වහන්සේත් තමන්ගේ ජීවිතය ලද්දා වූ ඵල දීම් කියා සතුටට පත්ව මනුෂ්‍ය ලෝකයට පැමිණ දිව්‍ය ස්ත්‍රීන්ගේ පින්කම් ගැන මිනිසුන්ට කියා මිනිසුන්ගේ සිත් පැහැදවූහ. එය ඇසූ බෝහෝ දෙනා පින්කම් කෙරෙහි ඇලුනාහ.

එසමයෙහි මූසිල ගාන්ධර්වයා නම් දේවදත්ත තෙරුන්ය. බරණැස් නුවර රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. ශක්‍රයානම් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේය. ගුත්තිල ගාන්ධර්වයා වශයෙන් උපන්නේ අප මහා බුදුරජාණන් වහන්සේය. ගුත්තිල ජාතක කථාවෙන්, ගුත්තිල මූසිල වීණා වාදනය ගැනත් මූසිල තම ආචාර්ය වරයාට ද්‍රෝහිව දැක්වූ දුදන ගතියත් මැනවින් විස්තර කෙරෙයි. අපිදු ගුත්තිල ජාතක කථාවෙන් හෙළිවන අකෘතඥ, දුදන ගති ඉවතලා කෘතවේදීව ගුරු පුද දැක්වීමට අදිටන් කර ගනිමු.

**කේ. මීගහකුඹුර**

◀22 වැනි පිටුවෙන්

# උපසම්පදාව යනු...

"සංඝං භන්තෙ උපසම්පදං යාචාමි. උල්ලුම්පතුමං භන්තෙ සංඝා"

උපාධ්‍යායන් වහන්සේ ප්‍රමුඛ සංඝයාගෙන් උපසම්පදාව අයදින අතර තමා සිටින තැනින් ඉහළ හෙවත් සාමණේර භූමියෙන් ඉහළට ඔසවා තබන්නයැයි ඉල්ලීමක් කරයි. අනතුරුව ඥත්තිය තබා තුන් විටක් භික්ෂූන්ගේ අනුමැතියට යටත්ව උපසම්පදාව ලබා දෙයි. මෙහි දී සාමණේර පැවිද්දේ දී මෙන් සිල් සමාදන් කරවීමක් නොමැති වුවත් උපසම්පන්න තත්වයට පත්වීමත් සමග චතු පාරිශුද්ධි ශීලය ආරක්ෂා කිරීමට බැඳී සිටියි. මෙය අධි ශීලය කියා ද හඳුන්වනු ලැබේ. එහි ප්‍රභේද 04කි.

01. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය
02. ඉන්ද්‍රිය සංවර ශීලය
03. ආජීව පාරිශුද්ධි ශීලය
04. ප්‍රත්‍ය සන්නිශ්‍රිත ශීලය

මෙම ශීල ප්‍රතිපදාව තුළ සාමාන්‍ය පුද්ගලයකුට වඩා සිත, කය, වචන යන තිදෙරින් ම සංවරයක් ඇති වෙයි. ඉන් වන කුඩා වුවද වරදෙන් මිදෙන භික්ෂුව මානසික සංවරය උදෙසා එය ම හේතුවක් කර ගනී. මේ නිසා මෙය කෝටියක් සංවර ශීලය කියා ද හඳුන්වනු ලැබේ. කුඩා වුවද අකුශලයකින් වැළකී එම භික්ෂුව එය ආපත්තියක් සේ සලකයි. ආපත්ති යනු පහත වැටීම යන්නයි. කායික මානසික වශයෙන් පහත වැටීම යි. ප්‍රාතිමෝක්ෂයේ දක්වන ආකාරයට එවැනි ආපත්ති හතකි. ඉන් පළමු වැන්න සතර පාරාජිකා වන්ය. ඒවා පිළියම් කළ නොහැකි ඇවැත්ය. ඒවා ඡේද්‍ය ගාමිණී ඇවැත් නිසා පාරාජිකා යනුවෙන් හඳුන්වා ඇත.

සංඝාදිසේස 13කි. ඒවාද සංඝයා ඉදිරියේ පිරිවෙස් සමාදානය, මානත් පිරීම සහ අබ්භාන යන පිළියම් තුළින් වරද අවබෝධ කරගෙන නැවත පාරිශුද්ධි ලබන ක්‍රමයකි. මේවා උට්ඨාන ගාමිණී ඇවැත් ලෙස හඳුන්වනු ලැබේ. ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදේසනීය, දුක්කට, දුබ්භාසිත යන ආපත්ති දේශනා ගාමිණී ඇවැත් ලෙස හැඳින්වේ. එයින් භික්ෂූන් ඉදරියේ ඇවැත් දෙසීමෙන් පිරිසිදු විය හැකිය. මෙබඳු විනය ශික්ෂා සමුදයකින් ආරක්ෂා වී චතු පාරිශුද්ධි ශීලයෙන් යුක්තව විසීමේ වගකීම උපසපන් භික්ෂුවක් සතුය. මේ නිසා මෙය අධි ශීලය හෙවත් කෝටියක් සංවර ශීලය කියා හඳන්වනු ලබන්නේ, මෙලෙස උපසම්පදාවට පත් භික්ෂුව සම්බුද්ධ ශාසනය තුළ පූර්ණ භික්ෂුත්වයට පත් අයකු සේ සැලකේ. එබඳු භික්ෂුවට භික්ෂු ශාසනය තුළ පූර්ණ වරප්‍රසාද හිමිය. එනම්, සංඝ කර්ම හෙවත් ඕනෑම විනය කර්මයකට සහභාගී විය හැකි සමාන සංවාසික තත්වයට පත් වේ. ඉහත කී පාරාජිකාවන්ට යම් හෙයකින් මෙකී උපසපන් භික්ෂුවක් පත් වුවහොත් "පාරාජිකො හොති අසංවාසො" භික්ෂුත්වයෙන් පැරදුනේ අසංවාසික තත්වයකට පත් වේ. ශාසනික විනය කර්මාදියට සහභාගි විය නොහැක. එවැන්නත් හිස නැති කඳක් මෙනැයි ද ගොබය සිඳි තල් ගසක්, පොල් ගසක් මෙන් යැයි ද කියනුයේ ඒ නිසයි.

සංඝ සංස්ථාව තුළ පූර්ණ භික්ෂුත්වය රැකගෙන තම නිර්වාණගාමී ප්‍රතිපදාව සඳහා යොමු වීමට මෙබඳු භික්ෂුවට පහසු වෙයි. මුනි සූත්‍රයේ සඳහන් අන්දමට,

"සිඛී යතා නීලගිවෝ විහංගමෝ
හංසස්ස නෝපේති ජවං කුදාචනං
ඒවං ගිහිනාත්‍ර කරෝති භික්ඛුනෝ
මුනිනෝ විචිත්තස්ස වනම්හි ඣායිනෝ"

අහසෙහි සැරිසරන නිල් මොණරාට කිසි කලෙකත් හංසයාගේ ජවයට ලංවිය නොහැක. එමෙන්ම විවේක සුවයෙන් ධ්‍යාන වඩන මුනිවරයාගේ ජවයට ගිහියාට යා නොහැක. භික්ෂුව සියලු බන්ධන වලින් මිදී නිවන් මගේ වේගයෙන් ගමන් කරයි. එවිට සියලු වැරදි වලින් මිදී ආදර්ශමත් භික්ෂුවක් හෙවත් මුනිවරයෙක් විය හැක.

**අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී,
අස්ගිරි මහාවිහාර පරිවේණාධිපති, ශාස්ත්‍රපති,
නාරම්පනාවේ ආනන්ද හිමි**


"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක."

# සදහම් ප්‍රහේලිකා අංක - 95

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773

### උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ලිපිනය - සදහම් ප්‍රහේළිකාව (94), 112, දයාවංශ ජයකොඩි පොත් සමාගම, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදන.
3. පිළිතුරු භාරගන්නා අවසාන දිනය ජූනි මස 10 දා බව සලකන්න.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේළිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.




### ▶ හරහට

1. සිව් පසයට අයත්ය.
4. ත්‍රිවිධ දානවලින් එකකි.
6. ඇතාට අයත් වටිනාම දෙය.
7. පුරාණ කාලයේදී දඬුවම් දීම සඳහා මෙයද භාවිතා කළේය.
8. මෙය අපට කාටත් උරුම දෙයකි.
9. මුහුණට සමාන කරන වචනයකි.
10. සෑම සත්වයෙක්ම මෙයට ආශා කරති.
13. පැරැන්නෝ සඳෙහි මේවා ඇත කියා විශ්වාස කළහ.
14. ත්‍රිවිධ තෘෂ්ණාවලින් එකකි.

### ▼ පහළට

2. ඉතා සුගන්ධවත් මලකි.
3. මෙහෙණින් වහන්සේලාට අවවාද දෙන්නවුන් අතරින් අගතැන්පත් තෙරණුවෝ.
5. මිහින්තලා පව්ව මේ නමින්ද හැඳින්වේ.
6. දෙමව්පියන්ගේ වටිනාම සම්පත.
7. ඔබ ඇසුරු කළ යුත්තේ මෙවැනි මිතුරන්ය.
10. මල් මේ නමින්ද හැඳින්වේ.
11. සතර වැදෑරුම් පුරුෂාර්ථවලින් එකකි.
12. දානයෙන් ලැබෙන එක් ආනිශංසයකි.

### ප්‍රහේළිකා අංක 91 ජයග්‍රාහී වාසනාවන්තයින් නම්

- එච්. ඒ. එස්. රාජපක්ෂ, දංගොල්ලවත්ත, දොරටියාව.
- පුෂ්පා සේනපති, 235, රජ පිහිල්ල මාවත, මහනුවර.
- පියතිස්ස කලීකොටුව - 107 සිරිමල්වත්ත, ගුන්නෑපාන.

## "තෙරුවන් වන්දනාවේ ආනිශංස" වෙසක් පෝදා එළිදකී

**මහනුවර** අස්ගිරිය මහා විහාරයීය කාරක සභා සංඝ සභාවේ මහෝපාධ්‍යා ශාස්ත්‍රවේදී පණ්ඩිත අමුණුපුර පියරතන නාහිමි විසින් සංස්කරණය කළ ''තෙරුවන් වන්දනාවේ ආනිශංස'' නමැති ධර්ම පොත වෙසක් පුර පසළොස්වක පෝය දින මහනුවර අස්ගිරිය මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සභික පලිපාන ශ්‍රී චන්දානන්ද බෞද්ධ විද්‍යාලයාධිපති ආචාර්ය ගොඩගම මංගල නාහිමි වෙත පිළිගන්වනු ඇත.

පණ්ඩිත අමුණුපුර පියරතන හිමි බුදු දහම හා බෞද්ධ සිතුවිලි සම්පිණ්ඩනය කරමින් මෙයට ඉහත දී බෞද්ධ පොත් රැසක් සංස්කරණය කර ඇත.

මේ අතර වෙසක් පෝය දින මාතලේ කුඹියන්ගොඩ විද්‍යාශේකර මූලමහා පිරිවෙනේ ආචාර්ය, ත්‍රිපිටකාචාර්ය පණ්ඩිත බෝපිටියේ සිරිසුදර්ශී හිමි විසින් ලියන ලද ''කළ පින් මතු කරන උතුම් දහම් සිසිල'' නමැති පින් පොත විද්‍යාශේඛර පිරිවෙන්පති ශාස්ත්‍රපති තලාතුඔයේ සමිද්ධිසිරි හිමි වෙත පිරිනමනු ඇත. පිරිවෙන් ආචාර්ය බෝපිටියේ සිරිසුදර්ශි හිමි බුදු දහම මුල්කරගෙන පොත් කිහිපයක් සහ සංයුක්ත තැටි කිහිපයක්ද සංස්කරණය කර ඇත.

## යටිනුවර සුමන නාහිමිගේ ශාසනික සේවය ඇගයේ

**සිරිමහ** බෝ පදනමේ 11 වැනි සාංවත්සර දම්සභා සමුළුව පසුගියදා උත්සවශ්‍රීයෙන් පැවැත්වුණි. එදින විශේෂත්වයක් වූයේ අනුරාධපුර ජයසිරි මහ බෝ සමිඳුන්ට මෙයට වසර 46 කට ඉහත දී පළමු රන්වැට ඉදිකර පූජා කළ යටිරාවන නාරද සංඝනායක හිමිගේ ප්‍රධාන ශිෂ්‍ය මහනුවර ශ්‍රීමත් ධර්මපාල මාවතේ කීර්ති ශ්‍රී රාජසිංහ පොත්ගුල් විහාරාධිපති සහ සිරිමහ බෝ පදනමේ ශාසනික සේවයේ පුරෝගාමීව අනුශාසකත්වය ලබා කටයුතු කරන උඩරට අමරපුර නිකායේ ශාසන ජෝතිකාකාරක සංඝ සභාවේ ද්විතීය සංඝනායක ශාස්ත්‍රපති යටිනුවර සුමන නාහිමිගේ ශාසනික සේවය අගය කරමින් උපහාර පිදීමය.


## දළදා මාලිගයෙන් පණිවුඩයක්

● මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න


1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඟ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට චාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

''නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය.''



# චතුමධුර යනු කුමක්ද?



බුදු සස්නහි පැවිදිව විමුක්ති සාධනය සඳහා පිළිවෙත් පුරන ප්‍රධාන පිරිස් හතරකි. එනම් භික්ෂු, භික්ෂුණී, සාමණේර, සාමණේරී වශයෙනි. උන්වහන්සේලා දවසට එක් වේලකි දන් වළඳනුයේ. (උදේ සහ දහවල එක් වේලක් වශයෙන් ගැනෙනුයේ) ඉර අවරට යෑමෙන් පසු හෙවත් පසුද අරුණු නගින තෙක් කාලය විකාලය වශයෙන් ගැනේ. එම කාලය තුළ ආහාර කෘත්‍යය කෙරෙන කිසිවක් ගැනීම විකාල භෝජන ශික්ෂා පදයෙන් වළක්වා ඇත. එහෙත් ගිලන් අවස්ථාවන්හිදී පෙරවරු, පස්වරු කාල නියමයක් නැතිව පරිභෝගයට ගත හැකි පානයකි අෂ්ටපාන, චතුමධුරද එසේම ගිලන් අවස්ථාවලදී ගැනීමට අනුදන වදරා ඇත. ''සක්කරා නව නීතෙහි - මධු සප්පි සමංගිනා'' වක අටුවා පාඨයට අනුව සකුරු, (උක් සකුරු හෝ කිතුල් සකුරු) ගිතෙල්, වෙඬරු (බටර්ද ගත හැකියි.) මී පැණි යන සතර චතුමධුර වශයෙන් ගැනේ. **එය සකස් කරගන්නා පිළිවෙළ:-** සකුරු සිහින් වන්නට ලියා වෙඬරු හෝ බටර් ප්‍රමාණයක්ද, සුද්ධ ගිතෙල් ප්‍රමාණයක්ද ගෙන ඒ සියල්ල ලිප මත තබා ගිත්තේ හොඳින් කකාරවා බිමට බා නැවත නිවෙන තෙක් හොඳින් මිශ්‍ර කොට නිවුණු පසු මී පැණි යම් ප්‍රමාණයක්ද එක්කොට නැවත හොඳින් හැඳි ගා පදමට සකස් වූ පසු පිරිසිදු භාජනයකට දමා මැනවින් වසා තබා ගත් විට සුදුසු අවස්ථාවන්හිදී ස්වල්පයක් ගැනීමෙන් අධික කුසගින්න උග්‍රවීමෙන් ඇතිවන ආබාධ සඳහා බෙහෙවින් සුදුසුය.

◀ 02 වැනි පිටුවෙන්...

## මාර්ග ඵලලාභීන්...



1. ඛීණා ජාති (ඉපදීම නැති කළ)
2. වුසිතං බ්‍රහ්මචරියං (ආර්‍ය අෂ්ටාංගික මාර්ගයෙහි ගමන් කර අවසානයි)
3. කතං කරණීයං (නිවන පිණිස කළ යුතු සියල්ල කළා)
4. නාපරං ඉත්ථත්ථාය (මින්පසු නිවන පිණිස කළයුතු දෙයක් නෑ)

මේ ප්‍රකාශයන් තුළ තමාට අහසින් යාමේ හැකියාවක් ගැන හෝ පොළොවේ කිමිදීමේ හැකියාවක් ගැන හෝ අනුන්ගේ සිත් කියවීමේ හැකියාවක් ගැන හෝ ඉඟියකුදු සඳහන් වන්නේ නැත. මෙහිදී ඔබ විසින් ධාරණය කරගත යුතු අනෙක් කරුණ වන්නේ රහතන් වහන්සේලා තම රහත් භාවය ගැන මෙසේ ප්‍රකාශ කර තිබෙන්නේ බුදුරජාණන් වහන්සේ සමග පමණක් වීමය. මාර්ග ඵලයක් ලද උතුමකු ඒ පිළිබඳව පැවැසිය යුත්තේ එම තත්ත්වයට වඩා ඉහළ දියුණු මානසිකත්වයක් ඇති උතුමකු සමග හෝ සම තත්ත්වයේ හිඳින උතුමකු සමග පමණි. එසේ නොවූ පුහුදුන් මිනිසුන් සමග තමන් මාර්ගඵල ලබා ඇතැයි පැවැසීම ඵලක් නොවන්නේ එය පුහුදුන් සාමාන්‍ය පුද්ගලයකුට වටහා ගත නොහැක්කක් නිසාය. මාර්ගඵල පිළිබඳව ප්‍රත්‍යක්ෂ අවබෝධයක් නොමැති අය සමගින් තමන් එවැනි ඵලයක් ලබා ගත් බව පැවැසීමම එවැනි ඵලයක් ඔවුන් ලබා නොගත් බවට හොඳම සාක්ෂියයි.

මෙකල බිහිවී ඇති බොහෝ මාර්ගඵලලාභීන් තමන් ඒ තත්ත්වයට පත්වී ඇති බව පවසනුයේ හරියාකාරව පින පව ගැනවත් නොදන්නා අහිංසක මිනිසුන් සමග වීම එක්තරා අතකින් විස්මයට කරුණකි. එබඳු අය සමග තමන් මාර්ගඵල ලබා ඇති බව ප්‍රකාශ කරන්නත් එසේ කරන්නේ අහිංසක මිනිසුන්ගෙන් පුද සත්කාර, ගෞරව, සැලකිලි ලබනු පිණිස මිස වෙනයම් කිසිවකට නොවේ. තත්ත්වය මෙසේ බැවින් බෞද්ධ පින්වතුන් සැබැවින්ම උනන්දු විය යුත්තේ සැබෑ ධර්මයට සමීප වීම තුළින් තමන් විසින් මාර්ගඵල ලබාගැනීමටය. ඒ මිස අනුන්ගේ මාර්ගඵල ලබාගැනීම පිළිබඳව විශ්වාසයක් ගොඩ නගා ගෙන ඔවුන් පසුපස ගොස් වැඳ වැටෙමින් අනුනට ද්වේෂ කරන්නෝ සැබැවින්ම අනුවණයෝය.

**පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති හිමි**

## වෙසක් උදානය

දහසක් මරුන් පරදා බුදු සමිඳු          එදා
සිරිමා බෝ රදුන් ළඟ තම දිවිය          පුදා
දුක් විඳි සතුන් මේ ඝන දුරු භවෙන්          මුදා
කළ මහ විරිය සිහි වන්නේ අපට          මෙදා

කාටත් මෙත් සිතින් පිහිටක් නිතර          සොයා
පාවඩ පවා නොමැතිව දුර ඇත          තියා
ගෙයින් ගෙට ගොසින් සදහම් බෙරය          වයා
එය සිහි කරමු රන් අකුරින් ලියා          තියා


ඉපදුම බුදු බවත් පිරිනිවනත්          යන්න
තෙමඟුල කියා සමරමු වෙසඟේ          ඔන්න
දන් සිල් භාවනා කරමින් සැන          සෙන්න
හැකිනම් පුළුවන්ය භවයෙන් ගැල          වෙන්න

හතළිස් පස් වසක් දිවියම කැප          කරමින්
සේවය කළේ කිසිදා මුත් නො          ගැටීමෙන්
සිල් ගුණ සුවඳ විශ්වයටම විහි          දුවමින්
ගත කළ දිවිය සිහිවෙනු ඇත එක          විලසින්

දෙව් බඹු යකුන් විලසින් ජීවත්          නොවුණ
මිනිසකු විලස එහි පරතෙරටම          පැමිණ
ඉපදුම මැරුම යන දුක් ගිනි නැති          කරන
බුදු හිමි සොයා ගත්තේ ඒ අම          නිවන

**මාස්පොත ශ්‍රී ගංගාරාම විහාරවාසී**
**කොබෙයිගනේ පුබ්බිලිය ශ්‍රී සාරානන්ද පිරිවෙනේ ආචාර්ය**
**ගලගෙදර රතනවංශ හිමි**

''යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදා පුබුදිත්.''



# සිරිපා මළුව දිස්වෙන බටතොට දිවා ගුහාව

බුදුරජාණන් වහන්සේ තෙවරක් ලක්දිවට වැඩම කළ බව අපගේ වංශකතාවල දැක්වෙන තොරතුරු මගින් සනාථ කෙරේ. බුද්ධත්වයෙන් අටවන වසරේදී මණිඅක්ඛිත නා රජුගේ ආරාධනයෙන් බුදුන් වහන්සේ සිරිලක කැලණියට වැඩම කළ බව එම වංශකතාවල ඇතුළත්ය. මෙම තෙවැනි බුද්ධාගමනයේදී සුමන සමන් සුරිඳුගේ ආරාධනයෙන් බුදුන් වහන්සේ සමන්තකූඨය හෙවත් සමනල කන්ද වෙත වැඩම කර එහි උන්වහන්සේගේ ශ්‍රී පාද ලාංඡනය පිහිටු වූ බවත් පැවසේ. මෙම ගමනේදී බුදුන් වහන්සේ සිරිපා අඩවියේ පිහිටි දිවා ගුහාව නම් ස්ථානයේ දිවා විහරණය කළ බව සඳහන් වේ. එදා මෙදා තුර දිවා ගුහාව පිහිටියේ කොහේදැයි නිශ්චිතව හඳුනාගෙන නොමැත.

බුදුන් වහන්සේ ලක්දිවට සැපත් වූ අවස්ථාවලදී සම්බුද්ධ ශ්‍රීපාද ස්පර්ශයෙන් පාරිශුද්ධත්වයට පත්වූ සිරිලක ස්ථාන සොළොසක් ගැන සඳහන් වන අතර ඉන් වඩාත් ප්‍රකටව ඇත්තේ ස්ථාන පසළොසක් පමණකි. ඉන් සැඟව ගිය ස්ථානය ලෙස සැලකෙන දිවා ගුහාව පිළිබඳව තවමත් මතභේද පවතී. බෞද්ධ ජනතාවට ඉතා පූජනීය වූ සොළොස්මස්ථානවලින් එකක් වූ එම භගවත් ලෙස නැතහොත් දිවා ගුහාව පිළිබඳ කොතෙක් මතභේද පැතිර තිබුණද මෙම පුදබිම සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ සමනල අඩවිය තුළ පිහිටා ඇති බව පිළිගැනී තිබුණු බව රහසක් නොවේ.

කෙසේ වුවද දිවාගුහාව පිහිටා ඇති ස්ථානය ලෙසට මත පළවී ඇති ස්ථාන අතරට, බලන්ගොඩ කැරගල කන්ද, මහගිරිදඹ අසල භගවා ලෙන හා කුරුවිට බටතොට ලෙනද ඇතුළත් වී තිබේ.

කුරුවිට-එරත්න සිරිමා මාර්ගයේ බටතොට ගමෙහි පිහිටි ගල් ලෙන හඳුනාගෙන ඇත. එකී එක් සැතපෙන බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක්ද නෙලා අහස් ගැබ රහතුන් වහන්සේලා දැක්වෙන බිතු සිතුවම්ද නිර්මාණය කර ඇති බවද පැවසේ. කෙසේ වුවද එම කාලයෙන් පසු දිගු කාලයක් මිනිස් වාසයෙන් දුරස්ථ වූ මෙම ලෙන දෙවැනි වතාවට සොයාගෙන ප්‍රතිසංස්කරණයට ලක් වී ඇත්තේ 1908 දී ශ්‍රී සුභූති නම් බහුශ්‍රැත මහා ස්ථවිරයන් වහන්සේගේ පුරෝගාමීත්වයෙන් බව සඳහන් වන අතර උන්වහන්සේගෙන් පසු එය නැවත වල්බිහිවී නිධන් හොරුන්ගේ විනාශ කිරීම්වලට ලක්වී තිබේ.

කෙසේ වුවද, 1995 වර්ෂයේදී, විසිපස් නමක් භික්ෂූන් වහන්සේලා සමග බටතොට ලෙනට පැමිණි අතිපූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය මහා නාහිමියන් වහන්සේ එම ලෙන් විහාරය කාලාන්තරයක් තිස්සේ සැඟවී තිබූ භගවාලෙන හෙවත් දිවාගුහාව වශයෙන් හඳුනාගෙන තිබේ.

රත්නපුර දිස්ත්‍රික්කයට අයත් කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුවිට-එරත්න මාර්ගයේ කි.මී. 7 ක් පමණ ගිය තැන හමුවන බටතොට හන්දියේ සිට නැවත එල්ලාවල මාර්ගය ඔස්සේ ර/බටතොට කණිෂ්ඨ විද්‍යාලය පසු කළ විට ඉඩකඩ සහිත රථගාලක් හමුවන අතර එතැන් සිට තවත් මීටර් 200 ක් පමණ ගිය විට දක්නට ලැබෙන මැනවින් සකස් කර ඇති පිය ගැට පෙළ දෙපස රැඳී සිටින වෙළෙඳුන් පසුකර පියගැට පෙළ ඔස්සේ වර්තමානයේ දිවාගුහාව යැයි නම් කර ඇති මෙම බටතොට ලෙන විහාරය වෙත ළඟා විය හැකිය. පුදබිම තුළ පිහිටි පෞරාණික විහාරය නිසා පමණක් නොව ලෙන තුළ ඉදිකර ඇති ස්තූපය හා බිතු සිතුවම් නිසාද ප්‍රකට වී ඇත. ලෙන් විහාරය තුළ ආකර්ෂණීය ගෘහ නිර්මාණ ශිල්පීය විශේෂාංගයක් ලෙස සැලකෙනුයේ පොළොන්නරුව යුගයට අයත් යැයි සැලකෙන මකර තොරණයි.

බටතොට පෞරාණික ලෙන් විහාරයේ ආගමික වැදගත්කම සැලකිල්ලට ගෙන බටතොට පුරාණ ගල්ලෙන් රජමහා විහාර ප්‍රතිසංස්කරණ කමිටුවක්ද පිහිටුවා ඇති අතර එමගින් මෙහි ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු බොහෝමයක් දියත් කර ඇති බව පෙනී යයි.

සිරිපා මළුවේ හේවිසි නාදය පවා නිසංසල අවස්ථාවලදී ශ්‍රවණය කළ හැකිය. විශේෂයෙන් පෙරවරු 6.00 ත් 7.30 ත් අතර හා පස්වරු 5.00 ත් 7.00 ත් අතර කාලය තුළ සමනල කන්දත් සිරිපා මළුවත් ඉතා චමත්කාර ලෙස මෙහි සිට දර්ශනය කළ හැකිය.

මෙම ලෙන තුළින් බීමට සුදුසු ජලය නිරතුරුව ගලන අතර සිසිලසත්, සූර්යා ලෝකයත් හොඳින් ලැබේ. මෙම ලෙන් විහාරය ඇතුළත ඇති පිළිසකර කරන ලද සැතපෙන බුදු පිළිම වහන්සේත්, හිටි හා සමාධි පිළිම වහන්සේලාත්, සැදැහැවතුන් තුළ නිතැතින් බුද්ධාලම්භන ප්‍රීතිය ඇති කරනු නිසැකය.

සමනල කන්ද පාමුල ආසන්නයේ පිහිටි මෙම බටතොට ලෙන් විහාරය, බෞද්ධ සිද්ධස්ථානයක් වශයෙන් පමණක් නොව ප්‍රාග් ඓතිහාසික භූමියක් වශයෙන් ද වැදගත් තැනක් උසුලයි.

ශ්‍රී පාදය වෙත දිවෙන එක් ප්‍රකට මගක් වැටී ඇත්තේ කුරුවිට-එරත්න හරහාය. මේ අවට බහුල වශයෙන් කිතුල් වන ගහනයක්ද ඇත.

විශේෂයෙන් සිරිපා වන්දනා සමය තුළ කිතුල් පැණි හා හකුරු මෙන්ම අතින් සැකසූ සිහිවටන භාණ්ඩ විකිණීමෙන් මේ අවට වෙසෙන ජනතාවට ආදායමක් උපයා ගැනීමටද හැකිවී තිබේ.

පමිතා කුමාරි ගුණතිලක

# මල්වතු-අස්ගිරි උපසම්පදා පුණ්‍යෝත්සවයට සියල්ල සූදානම්

**මහා** විහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු අස්ගිරි උභය මහා විහාර පාර්ශ්වයන්හි උපසම්පදා පුණ්‍යෝත්සවය මැයි 21 වැනිදාට යෙදෙන වෙසක් පුර පසළොස්වක පෝය දිනයෙන් ආරම්භ කොට ජූනි 19 වැනිදාට යෙදෙන පොසොන් පුර පසළොස්වක පෝය දිනයෙන් අවසන් කරන බව මල්වතු මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල, අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඥානරතන මහානායක මාහිමිපාණන් වහන්සේලා ශාසන ගෞරවයෙන් නිකුත් කර ඇති නිවේදනයෙන් ප්‍රකාශ කර ඇත.

මැයි 21, මැයි 29, ජූනි 4, ජූනි 12, ජූනි 19 යන පෝය දිනයන්හි පෙරහර සහිතවද, සෙසු දිනයන්හි පෙරහර රහිතවද උපසම්පදා විනය කර්ම ඓතිහාසික මංගල උපෝසථාගාරයන්හි අතිගරු මහානායක, අනුනායක හිමිවරු ප්‍රධාන උපාධ්‍යායන් වහන්සේලාගේ උපාධ්‍යායත්වයෙන් සිදු කෙරේ. වෙසක් පෝය දින මල්වතු අස්ගිරි මහා විහාරයන්හි උපසම්පදා ශීලයෙහි පිහිටුවනු ලබන සාමණේර දෙනම උපසම්පදා පෙරහරෙන් ශ්‍රී දළදා මාලිගාවේ සිට උභය මහා විහාර වෙත වැඩමවාගෙන යනු ලබන අතර එහිදී වාහල නාගනාමයෙන් අධිශිල් ලබන සාමණේර දෙනමගේ උපාධ්‍යායත්වය දරනු ලබන්නේ අතිපූජ්‍ය මහානායක මාහිමි දෙනමයි. මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක නියංගොඩ විජිතසිරි, අනුනායක දිඹුල්කුඹුරේ විමලධම්ම නාහිමි දෙනම ඇතුළු උපාධ්‍යායන් වහන්සේලා මල්වතු විහාරයේ සංඝ සභා ලේඛකාධිකාරී, පණ්ඩිත වල්ගොව්වාගොඩ විමලබුද්ධි, නියෝජ්‍ය ලේඛකාධිකාරී පණ්ඩිත පහමුණේ ශ්‍රී සුමංගල යන හිමිවරුන්ගේ ලේඛකාධිකාරිත්වයෙන්ද අස්ගිරිය පාර්ශ්වයේ අනුනායක සොළොස්මස්ථානාධිපති ඓතිහාසික ගෙඩිගේ රජමහ විහාරවාසී ශාස්ත්‍රපති අතිපූජ්‍ය වේඩරුවේ උපාලි නාහිමිගේ සහ ශාස්ත්‍රපති ආණමඩුවේ ධම්මදස්සි අනුනාහිමි, ලේඛකාධිකාරී පූජ්‍ය මැදගම ධම්මානන්ද නාහිමි, නියෝජ්‍ය ලේඛකාධිකාරී ශාස්ත්‍රපති නාරම්පනාවේ ආනන්ද හිමිවරුන්ගේ ලේඛකාධිකාරීත්වයෙන් අස්ගිරි මහා විහාරයේ උපසම්පදා විනය කර්ම කටයුතු සිදුකෙරේ. මෙම උපසම්පදා විනය කර්මයේදී උභය මහා විහාරයේ වාහලනාග නාමයෙන් සාමණේරයන් වහන්සේලා දහනමක් උපසම්පදා ශීලයෙහි පිහිටුවනු ඇත.

මෙම වසරේ උපසම්පදා ලබන අපේක්ෂකයින්ගේ වතගොත සිය ගුරුවරුන්ගේ මාර්ගයෙන් කල්මත්තෙන් සිය මල්වතු අස්ගිරි මහා විහාරයන් වෙත ඉදිරිපත් කළ යුතු බවට එම නිවේදනවලින් මතක් කර ඇත. කටක රවි 4 භාග වූ ජූලි 19 වැනි කුජ දින ගිම්හාන ඍතුවෙහි 8 වැනි පෝය කොට පසු බුද දින පෙරවස් එළඹීමද, සිංහ රවි 2 භාග වූ අගෝස්තු මස 18 වැනි වස්සාන ඍතුවෙහි 2 වැනි පොහොය කොට එදිනම පසුවස් එළඹීමද, කන්‍යා රවි 29 වන භාග වූ ඔක්තෝබර් මස 15 වැනි ශනි දින පෙරවස් පවාරණයද, තුලා රවි 29 භාග වූ නොවැම්බර් මස 14 වැනි සඳු දින පසුවස් පවාරණයද යෙදෙන්නේය, යන විස්තරද නිවේදනයන්හි සඳහන් කර ඇත.

## සාමණේරයන් වහන්සේලා උපසම්පදා ශීලයෙහි පිහිටුවන පින්කමක්




**අස්ගිරිය** මහා විහාර පාර්ශ්වයේ අනුනායක, ඓතිහාසික ගෙඩිගේ රජමහ විහාරවාසී, පොළොන්නරුව සොළොස්මස්ථානාධිපති, ශාස්ත්‍රපති වේඩරුවේ උපාලි, අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අනුනායක, ජ්‍යෙෂ්ඨ කාරිකාචාර්ය අධ්‍යාපනපති, ශාස්ත්‍රපති, ආණමඩුවේ ධම්මදස්සි, අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ ලේඛකාධිකාරී, ශාස්ත්‍රවේදී, මැදගම ධම්මානන්ද, අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී, අස්ගිරිය මහා විහාර පරිවේනාධිපති, ශාස්ත්‍රපති නාරන්පනාවේ ආනන්ද යන හිමිවරුන් ප්‍රධාන උපාධ්‍යායන් වහන්සේලාගේ සහභාගිත්වයෙන් උපසම්පදා විනය කර්ම පින්කමක් පැවැත්වේ. උපසම්පදා විනය කර්ම කටයුතුවලදී මල්වතු අස්ගිරිය මහා විහාරයන්හි සාමණේර උපසම්පදා ශීලයෙහි පිහිටුවනු ලබන අතර සාමණේරයන් වහන්සේලා උපසම්පදා පෙරහරෙන් ශ්‍රී දළදා මාලිගාවේ සිට උභය මහා විහාර කරා වැඩමවාගෙන යනු ලබන්නේ පෝය දිනවලදීය.

කටක රවි 4 භාග වූ ජූලි මස 19 වැනි කුජ දින ගිම්හාන ඍතුවෙහි 8 වැනි පොහොය කර ඊට පසු බුද දින පෙර වස් එළඹීමද, සිංහ රවි 2 භාග වූ අගෝස්තු මස 8 වැනි ගුරු දින වස්සාන ඍතුවෙහි 2 වැනි පොහොය කොට එදිනම පසු වස් එළඹීමද, කන්‍යා රවි 29 වන භාග වූ ඔක්තෝබර් මස 15 වැනි ශනි දින පෙර වස් පවාරණයද, තුලා රවි 29 භාග වූ නොවැම්බර් මස 14 වැනි සඳු දින පසු වස් පවාරණයද යෙදෙන්නේය. මෙම විස්තරද උපසම්පදා නිවේදනයෙහි සඳහන් කර ඇත.

## හිස තෙල් ගෑමයි ජන්ම දිනයයි එකම දවසේ

**මහනුවර** මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක දිඹුල්කුඹුරේ ශ්‍රී සරණංකර විමලධම්ම නාහිමිපාණන්ගේ 75 වැනි ජන්ම දිනය සිංහල අලුත් අවුරුද්දේ හිස තෙල් ගෑමේ චාරිත්‍රය යෙදී තිබුණ අප්‍රේල් 16 වැනිදාට යෙදී තිබීම විශේෂ සිදුවීමක් විය. මෙදින විමලධම්ම අනුනායක හිමිපාණන්ට දිඝාසිරි ප්‍රාර්ථනා කරන ආගමික වැඩසටහන් මාලාවක්ද මල්වතු මහා විහාරය මුල්කරගෙන පැවැත්වුණි.

## මහා ත්‍රිපිටක ධර්ම සජ්ජායනාව තෙවැනිවරටත් පේරාදෙණිය සිරි සුබෝධ බෝධිඝර මණ්ඩපයේදී

**වර්ෂ** 2560 ශ්‍රී සම්බුද්ධ ජයන්තිය මුල්කරගෙන මහා ත්‍රිපිටක ධර්ම සජ්ජායනාවක් සහ 2560 ශ්‍රී සම්බුද්ධ ජයන්ති සිරිසුබෝධ වෙසක් මංගල්‍යය මැයි මස අටවැනිදා සිට ජූලි මස අටවෙනිදා දක්වා මාස දෙකක් තිස්සේ පේරාදෙණිය සිරිසුබෝධ බෝධිඝර මණ්ඩපයේදී පේරාදෙණිය සිරිසුබෝධාරාම මහා විහාරාධිපති සිරි සුගත පටිපත්ති ශාසන ශෝභන විශ්ව කීර්ති ශ්‍රී විනය විශාරද පණ්ඩිත වත්තේගම ධම්මාවාසාභිධාන උඩරට අමරපුර නිකායේ මධ්‍යම හා තදානුබද්ධ ප්‍රදේශයන්හි අධිකරණ සංඝනායක සහ ඕස්ට්‍රේලියානු මහද්වීපයේ ප්‍රධාන සංඝනායක හිමිගේ අනුශාසකත්වයෙන් පැවැත්වේ.

ශ්‍රී සම්බුද්ධ ජයන්ති සිරිසුබෝධා වෙසක් මංගල්‍ය කමිටුව, ශ්‍රී ඤාණාලංකාර ජාත්‍යන්තර භික්ෂු අභ්‍යාස ආයතනය, ශ්‍රී ඥානාලංකාර සිංහල හා ඉංග්‍රීසි දහම් පාසල් ඒකකය, ශ්‍රී සුබෝධා ශාසන සේවා සමිතිය සහ විහාරමහා දේවි කුළඟන සමිතිය මෙම මහා ත්‍රිපිටක ධර්ම සජ්ජායනාව හා දහම් සමුළුව සංවිධානය කිරීමෙහි මූලික දායකත්වය දරනු ලබන්නේය. ශ්‍රී සුබෝධාරාම මහා විහාරය තෙවන වරටත් සංවිධානය කරනු ලබන මෙම මහා ත්‍රිපිටක ධර්ම සජ්ජායනාව මැයි අටවෙනිදා අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේලාගේ සහ සම්භාවනීය ගිහි පැවිදි දෙපිරිසගේ සහභාගිත්වයෙන් ආරම්භ කෙරුණි.

කේ. බණ්ඩාරනායක

"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."



# කුසල අකුසල මත සුබ අසුබ පල දේ

අප තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ වදාළ පරිදි මනුෂ්‍යයාගේ කුසල අකුසල චෛතසිකයන් අනුව සුබ අසුබ විපාක දේ. ඒ බව ධම්මපදයේ එන මුල් ගාථා දෙකෙන් මනාව පැහැදිලි වේ. තවත් තැනෙක "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" (චේතනාව කර්මය වන බව) සඳහන් වේ.

දූෂිත වූ යමක් කියන්නේ හෝ කරන්නේ වේද එහි අසුබ විපාකය ගොනා පසුපස එන කරත්ත රෝදය මෙන් දුක් සහිත වන බවත්, ප්‍රසන්න වූ සිතින් යමක් කියන්නේ හෝ කරන්නේ හෝ වේද එහි සැප විපාකය තමා පසුපස එන හෙවණැල්ල මෙන් තමා කරා එන බවත් ඉහත සඳහන් කළ ගාථා දෙකෙන් කියැවේ.

ඒ අනුව දූෂිත වූ ක්‍රෝධ සිතින් යමෙක් නැසේවායි, විනාශ වේවායි, උන්හිටි තැන් නැතිවේවායි යම් කෙනෙක් කියන්නේ වේද ඒ ශාප කිරීමකි, අවලාද කිරීමකි. එහි විපාකය මේරූ පසු ගොනා පසුපස එන කරත්ත රෝදය මෙන් අනන්ත දුකක් දී කල්ප ගණන් පාපියා පසුපස එයි. එම විපාකයෙන් වැළකීමට ග්‍රහ ශාන්ති කර හෝ බෝධි පූජා තබා හෝ යන්ත්‍ර පැළඳ හෝ කිසිවෙකුට නොහැකිය.

ශාප කිරීමේ විරුද්ධ ක්‍රියාව මෛත්‍රී කිරීමයි. බුදුරජාණන් වහන්සේටත්, මහා බ්‍රහ්මයාටත්, දෙමාපියන්ටත් පමණක් නිත්‍ය වාසස්ථානය වූ සතර බ්‍රහ්ම විහරණයන්ගෙන් පළමුවැන්න මෛත්‍රියයි. බුදුරජාණන් වහන්සේ මෛත්‍රී කරන ආකාරය කරණීය මෙත්ත සූත්‍රයෙන්ද එහි ආනිශංස මෙත්තානිශංස සූත්‍රයෙන් හා වේලාම සූත්‍රයෙන්ද පැහැදිලි කර ඇත. සර්පයන්ගෙන් ආරක්ෂා වීම පිණිස බුදුරජාණන් වහන්සේ වදාළ කඳ පිරිතද සර්ප කුලවලට මෙත් කිරීමකි. රතන සූත්‍රයේ දෙවන ගාථාවෙන්ද දක්වා ඇත්තේ සත්ව ප්‍රජාව කෙරෙහි මෛත්‍රී කරව් (මෙත්තං කරොථ මානුසියා පජාය) යනුවෙනි.

මෙත්තානිශංස සූත්‍රයේ මෛත්‍රී කිරීමේ ආනිශංස එකොළහක් දක්වා ඇත.

**මනුස්සානං පියොහොති (මනුෂ්‍යයන්ට ප්‍රිය වේ.)**

**අමනුස්සානං පියොහොති (අමනුෂ්‍යයන්ට ප්‍රිය වේ.)**

**දේවතා රක්ඛන්ති (දෙවියෝ රකී.)**

**නාස්ස අග්ගිවා, විසංවා සත්තංවා කමති (ගින්නෙන්, විෂ වර්ගවලින්, ආයුධවලින් පීඩා නොපැමිණේ.)**

**තුවටං චිත්තං සමාධියති (වහා සිත සන්සුන් වේ.)**

**මුඛ පිණෙණා විප්පසීදති (මුහුණ ප්‍රසාද දනවන සුළු වේ.)**

**අසම්මූ ලෙහා කාලං කරොති (සිහියෙන් මිය පරලොව යයි.)**


**උත්තරිං අප්පට විජ්ඣ නෙතා බ්‍රහ්මලොකුපගො හෝති (මෛත්‍රී චිත්තය වඩා රහත් වීමට නොහැකි වූවොත් නිදා පිබිදුණාක් මෙන් බ්‍රහ්ම ලෝකයේ උපදී.)**

වේලාම සූත්‍රයේ මෛත්‍රී කිරීමේ ආනිශංස සියලුම ආමිෂ දානානිශංස පරදවන බව සඳහන් වේ.

ඉතා කුඩාම තිරිසන් සතෙකුට පවා ආහාරයක් වේවායි ඉඳුල් වතුර ටිකක් දැම්මත් ආනිශංස සිදුවන කුසලයකි. වේලාම සූත්‍රයේ දැක්වෙන අයුරු තිරිසන් සතුන් 100 කට දෙන දානයට වඩා ගුණ ධර්මයක් නොදන්නා එක් මනුෂ්‍යයකුට දෙන දානය උතුම් බවත්, එවැනි සිය දෙනකුට දෙන දානයට වඩා තිසරණය සමාදන් වූ එක් අයකුට දෙන දානය උතුම් බවත්, එවැනි සිය දෙනකුට දෙන දානයට වඩා පංචශීලය සමාදන් වූ එක් අයකුට දෙන දානය උතුම් බවත්, එවැනි සිය දෙනකුට දෙන දානයට වඩා අටසිල් සමාදන් වූ එක් අයකුට දෙන දානය උතුම් බවත්, එවැනි සිය දෙනකුට දෙන දානයට වඩා දස සිල් සමාදන් වූ එක් අයකුට දෙන දානය උතුම් බවත්, දස සිල් සමාදන් වූ සිය දෙනකුට දෙන දානයට වඩා එක් සාමණේර භික්ෂූන් වහන්සේ නමකට දෙන දානය උතුම් බවත්, එවැනි සිය දෙනකුට දෙන දානයට වඩා කෝටියක් සංවර ශීලය රකින එක් භික්ෂූන් වහන්සේ නමකට දෙන දානය උතුම් බවත්, එවැනි සිය දෙනකුට දෙන දානයට වඩා සෝවාන් වූ එක් අයකුට දෙන දානය උතුම් බවත්, එවැනි සිය දෙනකුට දෙන දානයට වඩා සකෘදාගාමී එක් අයකුට දෙන දානය උතුම් බවත් එවැනි සිය දෙනකුට දෙන දානයට වඩා රහතන් වහන්සේ නමකට දෙන දානය උතුම් බවත්, එවැනි සිය දෙනකුට දෙන දානයට වඩා පසේ බුදු කෙනකුන්ට දෙන දානය උතුම් බවත්, එවැනි සිය දෙනකුට දෙන දානයට වඩා ලොව්තුරා බුදු කෙනකුට දෙන දානය උතුම් බවත් එම ආනිශංස අසංඛ්‍යය අප්‍රමෙය්‍යය වශයෙන් ලැබෙන බවත් පැහැදිලි වේ.

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැඟී යන්නෙකු වැනිය"

මුළු මිහිතලය සමතලා කරවා පසේ බුදුවරුන් හා රහතුන් වහන්සේලා පෙළින් පෙළ යාමට වඩා හිඳුවා චතුමධුර ආදී මිහිරි ආහාර පාන පූජා කළත් එහි කුසලය ලොව්තුරු බුදු කෙනෙකුන්ට දෙන දානානිශංසයෙන් දහසයෙන් කොටසක්වත් නොවටනා බව සම්බුදු රජාණෝ වදාළහ. එහෙත් එයට වඩා ලොව්තුරා බුදුරජුන් ප්‍රමුඛ මහා සංඝයා වහන්සේලාට දෙන දානය උතුම් වන්නේය. එම මහා සාංඝික දානයට වඩා මහා සංඝයා වහන්සේලාට දෙන දානය උතුම් වන්නේය. එම මහා සාංඝික දානයට වඩා මහා සංඝයා වහන්සේලාට සුවසේ සැතපෙන සේ ආවාසයක් සාදා දෙන්නේ නම් අසංඛ්‍යය අප්‍රමෙය්‍යය කුසල් වන්නේය. එම කුසලයට වඩා තෙරුවන් සරණ යාම උතුම් වන්නේය. මේ තිසරණ සරණ යාමට වඩා පන්සිල් රක්ෂා කිරීම උතුම් වන්නේය. මේ සියල්ලටම වඩා සුවඳ මලක් සිඹින තරම් සුළු කාලයක් තුළ සියලු සත්වයෝ සුවපත් වේවායි මෛත්‍රී කරන්නේ නම් මහත් ආනිශංස ඇතිවන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. ඒ අනුව බලන විට මෛත්‍රී කිරීම කිසිම මුදලක් වැය නොකොට ඕනෑම නිදහස් වේලාවක, ඕනෑම තැනක සිට, ඕනෑම ඉරියව්වකින් කළ හැකි උතුම් පින්කමක් වන්නේය.



මෛත්‍රී කිරීම ලොව්තුරා බුදු බව ලබාගැනීම සඳහා පුරන පාරමිතාවන්ගෙන් එකකි. සම්බුදු පියාණන් වහන්සේ මාර යුද්ධයේදී හෝ ආලවක ආදී යක්ෂ දමනයේදී හෝ සච්චක ආදී වාදකරුවන් දමනයේදී හෝ අක්‍රෝෂ භාරද්වාජ බමුණා බණින අවස්ථාවේදී හෝ අංගුලිමාල දමනය ආදී අවස්ථාවලදී කිසිම දිනෙක ක්‍රෝධයෙන්, ද්වේශයෙන් කටයුතු කළේ නැත. විශාලාමහනුවරට වැඩම කළ අවස්ථාවේ එහි අරක්ගෙන සිටි යක්ෂ භූත ආදීන්ට කීවේ ''මෙත්තං කරොථ මානුසියා පජාය'' (මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි මෙත් කරව්) යනුවෙනි.

භාවනා කර්මස්ථාන වැඩීමට මහ වනයට පිවිසි සංඝයා වහන්සේලාට භූමාටු දේව හා යක්ෂාදීන්ගෙන් වන කරදර, බාධක වළක්වා ගැනීමට උගන්වා වදාළේ මෛත්‍රී කිරීමටය. සර්පයෙක් දෂ්ඨ කිරීමෙන් භික්ෂූන් වහන්සේ නමක් අපවත් වූ විට සර්පයන්ගෙන් ආරක්ෂා වීමට දේශනා කළේ සර්ප කුලවලට මෛත්‍රී සිත පතුරවන කද පිරිතයි. බුදුරජාණන් වහන්සේ එක් දිනෙක භික්ෂූන් වහන්සේලාට මෙසේ වදාළහ.

''මහණෙනි, මම පෙරුම් පුරන අවධියේ සත් අවුරුද්දක් මෛත්‍රී චිත්තය වඩා මහා කල්ප සතක් බඹලොව ඉපිද මහා බ්‍රහ්මයා වීමි. තිස්හය වාරයක් ශක්‍ර දිව්‍ය රාජයා වීමි. සිය ගණන් වාර සක්විති රජ සම්පත් ලදිමි'' යනුවෙනි. මෛත්‍රී කිරීම ඒ අනුව අති විශාල සැප සම්පත් ලබාදෙන සුව සෙත සලසන උතුම් පුණ්‍ය කර්මයකි.

ක්‍රෝධය, අවලාද කිරීම හෙවත් අනුන් නැසේවායි, විනාශ වේවායි ශාප කිරීම මෛත්‍රියේ විරුද්ධ ක්‍රියාවයි. ඒ අනුව මෛත්‍රී කිරීමෙන් ලැබෙන ආනිශංසයට විරුද්ධ වූ නිරාදුක් විඳීම, ප්‍රේත ලෝකවල ඉපිද සා පිපාසාවෙන් කටුක දුක් විඳීම, බලාපොරොත්තු නැති කරදර, ලෙඩ දුක්, නින්දා අපහාස, පිළිකා, හදවත් රෝගවලින් පෙළීම, බැගෑපත්වීම ආදියට ක්‍රෝධ කරන්නෝ හා අවලාද කරන්නෝ ලක්වෙති.

බුදුරජාණන් වහන්සේ,

**''යාදිසං වසතෙ බීජං තාදිසං හරතෙ ඵලං**
**කල්‍යානකාරී කල්‍යානං - පාපකාරීච පාපයො''** යනුවෙන් වදාළහ. යමෙක් යම් දෙයක් වපුරන්නේද එහි ඵලයද ඒ සමාන වේ. යහපත් දෙයක් වැපිරුවොත් යහපත් ඵලද, අයහපත් දෙයක් වැපිරුවහොත් අයහපත් ඵලද ලැබෙන බව ඉන් කියවේ.

ඒ අනුව අනුන් නැසේවා! ගෙදර යහපතින් ඉන්ට නොලැබේවා! ගසකින් වැටේවා! දේපළ විනාශ වේවා! භේද භින්න වේවා! ආදී වශයෙන් යමෙක් අවලාදයක් කළහොත් එහි විපාකය නොවැරදීම කිසියම් කාලයකට පසු ආපසු තමන් කරා පැමිණේ. කිසියම් ශාපයක් කරන විට ගතවන්නේ සුළු කාලයක් වුවත් එහි විපාක විඳින විට කල්ප ගණන් අනන්ත දුක් විඳීමට සිදුවේ.

**''නහි පාපං කතං කම්මං - සජ්ජු ඛීරංව මුච්චති**
**ඩහන්තං බාල මන්‍වෙති - භසමච්ඡන්නෝව පාවකො''**

යනුවෙන් කරන ලද පාපය කිරි එකෙනෙහි නොමිදෙන්නාක් මෙන්, පාපය කළ විගස විපාක නොදෙන බවත්, අළු යට සැඟවුණ ගිනි පුපුරු මෙන් තිබී වැඩී පසුව පාපියා දවමින් විපාක දෙන බවත් සම්බුදු පියාණෝ වදාළහ.

ලෝසක තිස්ස රහතන් වහන්සේට රහත් වන ආත්ම භාවයේ වත් කුස පුරා අහරක් වැළඳීමට නොලැබුණේ පෙර කලෙක රහතන් වහන්සේ නමකට දිය යුතු දානය නොදී ඊර්ෂ්‍යාව හා ද්වේෂය නිසා ගිනි ගොඩකට වීසි කළ අකුසල කර්මයෙනි. එම අකුසලයෙන් එයට පෙරද බොහෝ කල් දරුණු නිරාදුක් විඳ, ප්‍රේත ලෝකවල සාපිපාසා දුක් විඳ, මිනිස් ලොව ඉපිද ආත්ම සිය ගණන් සිඟ න්නන්ව දුක් විඳ තිබේ. ජම්බුකා ජීවක තෙමේ පන්සාළිස් වසක් අසූචි අනුභව කළේ පෙර කලෙක රහතන් වහන්සේ නමකට අසූචි කාපියව් යනුවෙන් පරිභව කළ අකුසල කර්මයෙනි.

වර්තමානයේද ඇතැමුන් අනුනට විපත් සිදුවේවායි දෙස් තබා, උගුල් අටවා, කලකට පසු විපත්වලට, රෝගවලට හා පරිහානියට ලක්වී බොහෝ කල් දුක් විඳ මරණයට පත්වූ බව පෙනේ. අනාගතයේ තමන් සැප විඳීමට බලාපොරොත්තු වන්නේ නම් අනුන්ට දුක් නොදිය යුතු බව ගැරඬියකුට හිංසා කරමින් සිටි ළමයින් පිරිසකට බුදුරජාණන් වහන්සේ දෙසූ සේක.

එබැවින් අපි කවදා හෝ මේ සසර දුකෙන් මිදී නිවන් ලබනතුරු දැඩි දුක් නොවිඳීමට අපේ සිත, කය, වචනය රැකගනිමු. කිසි දිනක කිසිවකුට විපත් නොකරමු! ශාප නොකරමු!

දුක්කප්පත්තාථ නිද්දුක්ඛා - භයප්පත්තාච නිබ්භයා
සෝකප්පත්තාච නිස්සොකා - හොන්තු සබ්බෙපිපාණිනො
දුකෙන් පෙළෙන සත් දුකෙන් මිදෙත්වා
බියෙන් පෙළෙන සත් බියෙන් මිදෙත්වා
සොවින් පෙළෙන සත් සොම්නස් වෙත්වා
නිතින් මෙහැම සත් සුවපත් වෙත්වා

**එච්. ඒ. ජිනදාස**